# වාර්ෂික වාර්තාව

2013

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

**වාර්ෂික වාර්තාව 2013**

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

නිර්මාණය හා පිටු සැකසුම්

කලාව Kalawa Group

අංක. 1A-3/2, ධර්මරාජ මාවත,
ඕග් ඇල්ෆ්‍රඩ් ඇවැන්යු,
කොළඹ 03.
දු.අංක: 071 224 11 00 | 011 208 11 88

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

## වාර්ෂික වාර්තාව 2013

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
1වන මහළ, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.
දුරකථන: 011-2581704 ෆැක්ස්: 011-503917
ඊ මේල්: dgmadminetfb@sltnet.lk වෙබ්: www.etfb.lk

# පටුන


06 ආයතනික තොරතුර

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 07

12 අපගේ දැක්ම මෙහෙවර සහ සාරධර්ම

ප්‍රධාන මූල්‍ය තොරතුරු 14

16 1981 සිට 2013 දක්වා විශේෂ අවස්ථා

ආයතනනික සමාලෝචනය 18

19 ආයතනික යහපාලනය

නව සභාපතිවරයාගේ පණිවිඩය 21

22 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ථාව

ප්‍රධාන කාර්යයන් 23

28 මූල්‍ය ප්‍රකාශන 2013

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 46

54 විගණකාධිපති වාර්තාව

මණ්ඩලීය නිරීක්ෂණ 66

240 සංඛ්‍යාණමය ඇමුණුම


brother

# ආයතනික තොරතුරු

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලදි. මෙම අරමුදල සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය වන අතර, වර්තමානයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ගරු අමාත්‍යවරයා විසින් නියෝග කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර දක්වා ඇති පරිදි ඕනෑම ශ්‍රේණියකට හෝ වර්ගයකට අයත් රජයේ හෝ පෞද්ගලික අංශයේ ආයතනයක් සඳහා මෙම පනතේ විධිවිධාන අදාල වේ. ස්වයං රැකියාලාභී පුද්ගලයන් හා සංක්‍රමික සේවකයන්ට ඔවුන්ගේ අභිමතය පරිදි මෙම අරමුදලට දායක විය හැක. වර්තමානයේ දී ආසන්න වශයෙන් මිලියන 2.2 ක් මෙම අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකත්වය දරණ අතර, සේවායෝජකයින් 72,145 දෙනෙකු ආවරණය කර ඇත. 2013 දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදලේ වටිනාකම රුපියල් බිලියන 174 ක් විය. සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ කාර්යයන් විමධ්‍යගත කිරීම සඳහා සහ එහි සාමාජිකයන්හට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් එහි ශාඛා ජාලය 1995 වසරේදි ආරම්භ කරන ලදි.

## මණ්ඩලයේ අරමුණු

**(අ)** මුල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගී වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික, ප්‍රජාතාන්ත්‍රික ප්‍රවර්ධනය කිරීම

**(ආ)** ව්‍යවසායන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

**(ඇ)** සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ

**(ඈ)** මේ වගන්තියේ (අ) (ආ) සහ (ඈ) ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි අන් සියළු ක්‍රියා හෝ දේවල් කිරීම

## අධ්‍යක්ෂ මණ්ඩලය

**2013 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සදහන් පරිදි විය**

**කේ එම් ඒ ගොඩවත්ත මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**ජී තිස්සකුට්ටිආරච්චි මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**පී ඒ එස් පණ්ඩිතරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**යු එස් අබේරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**ඩී එල් යු පීරිස් මහත්මිය**
2013 ජනවාරි සිට අප්‍රේල් දක්වා
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

**ඒ කුමාරසිරි මහතා**
2013 මැයි සිට නොවැම්බර් දක්වා
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

**පී එල් ඩී දහනායක මහත්මිය**
අධ්‍යක්ෂ
වෙළඳ අමාත්‍යාංශ නියෝජිත

**සී එල් කේ පී ජයසූරිය මහතා**
අධ්‍යක්ෂ
ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත

**දීපා වීරසූරිය මහත්මිය**
මණ්ඩලීය ලේකම්

**රංජිත් හෙට්ටිආරච්චි මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

මෙයට අමතරව 2013 වර්ෂය තුළ වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම් කිසිවක් සිදු නොවිනි

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

**2013 වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය පහත සඳහන් පරිදි විය**

**කේ එම් ඒ ගොඩවත්ත මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**ජී තිස්සකුට්ටිආරච්චි මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**ජේ එම් එස් බී උඩුගම මහතා**
වැඩබලන අතිරේක සාමාන්‍යාධිකාරී
එම් සී එච් ගුණරත්න මහතා
2013 නොවැම්බර් මස සේවයෙන් ඉවත් විය

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

**ආර් එන් ඥාණසේකර මිය** (ආයෝජන)
**ජේ එම් එස් බී උඩුගම මහතා** (දායක මුදල් රැස්කිරීම් හා සේව්‍ය සබඳතා)
**ඩබ්ලිව් එස් දිසානායක මහතා** (සාමාජික සේවා)
**එල් එච් නිහාල් මහතා** (පරිපාලන හා මානව සම්පත්)
**කේ එස් වැලිවිට මහතා** (අභ්‍යන්තර විගණන)
**එන් ඩබ්ලිව් විමලවීර මහතා** (මුදල්)

## සහකාර සාමාන්‍යාධිකාරීවරුන්

**සී මල්ලිකාරච්චි මහතා** (සාමාජික ගිණුම්)
**එච් එම් සෙනෙවිරත්න මහතා** (සාමාජික සේවා)
**ඩබ්ලිව් සූරියආරච්චි මහතා** (ක්‍රියාත්මක කිරීම්) - කලාප 1
**ඒ ජේ එම් එස් ජයසුන්දර මහතා** (ක්‍රියාත්මක කිරීම්) - කලාප 11
**එම් එස් දිසානායක මහතා** (ක්‍රියාත්මක කිරීම්/ස්වයං රැකියා)
**එම් එ කේ අළුත්ගමගේ මහතා** (මුදල්) වැඩ බලන

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය



### ආර් එන් ඥාණසේකර මිය
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ආයෝජන)**

මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ආයෝජන) ලෙස කටයුතු කරන අතර, මණ්ඩලයේ ප්‍රධාන තනතුරු ගණනාවක් දරමින් වසර 34 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරිවරියක් වන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරන ශිල්පීය ආයතනයේ සාමාජිකාවක් ද වේ.



### ඩබ්ලිව් එස් දිසානායක මයා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සාමාජික සේවා)**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සාමාජික සේවා) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික මට්ටමේ සුදුසුකම් ලබා ඇති අතර, එම ආයතනයේ ව්‍යාපාර සහ මූල්‍ය කළමනාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ විධායක ඩිප්ලෝමාව හිමිකර ගෙන ඇත. එසේම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරිවරයෙකු ලෙස සාමාජිකත්වය ලබා ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ශිල්පීය ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකි. ඔහු මීට පෙර ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරිවරයෙකු ලෙස සේවය කර ඇති අතර, සීමාසහිත අධිවේගී ප්‍රවාහන පුද්ගලික සමාග මේ අධ්‍යක්ෂ වරයෙකු ලෙස කටයුතු කර ඇත.



### එල් එච් නිහාල් මයා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්)**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිධාරියෙකු වන අතර, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද, ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ ශාඛා බැංකුකරණය පිළිබඳ සහතිකය ද, ශ්‍රී ලංකා සේවක මණ්ඩල කළමනාකරන ආයතනයේ (IPM) සාමාජිකත්වයද, AHRP - SL යන IPMA – CP Alexandria හි වෘත්තීය සාමාජිකත්වය ද, හිමිකර ගෙන ඇත. ඔහු විසින් කර්මාන්ත පරිසරය, බැංකු සහ සේවා අභිමුඛ ආයතනයන් වල පරිපාලනය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වසර 29 කට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇත.







### කේ එස් වැලිවිට මයා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)**

මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ලෙස කටයුතු කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ඇත. ඔහු 2010 වසරේදී මණ්ඩලයේ සේවයට එක්වී ඇති අතර පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ගිණුම්කරනය සහ විගණනය පිළිබඳ වසර 26 කට අධික පළපුරුද්දක් ලබා ඇත.

### වසන්ත විමලවීර මයා
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)**

මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වානිජවේදී (ගණකාධිකරන විශේෂ) දෙවන පෙළ ඉහළ පංති සාමාර්ථය සහිත උපාධිධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය(ACA) හිමිකරගෙන ඇත. මණ්ඩලයේ මුදල් කොට්ඨාශය, කොටස් සහ ණය ආයෝජන, තොරතුරු තාක්ෂණය සහ සැපයුම් අංශ ඔහුගේ අධීක්ෂණය යටතේ පවතී.

### සී මල්ලිකාරච්චි මයා
**සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා)**

මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (භෞතික විද්‍යා) උපාධිධාරියෙකු වන අතර, ඉන්දියාවේ හයිද්‍රබාද්හි ග්‍රාමීය සංවර්ධනය සඳහා විමධ්‍යගත සැලසුම්කරනය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි.

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය







**එච් එම් සෙනවිරත්න මයා**
**සහකාර සාමාන්‍යාධිකාරී**
**(සාමාජික ගිණුම්)**

මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික ගිණුම්) ලෙස කටයුතු කරන අතර, ජාතික ව්‍යාපාර කලමනාකාරිත්ව ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාධාරීයෙකි. 1981 වසරේදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට බැදී ඇති ඒ මහතා දැනට මණ්ඩලයේ සිටින ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකි.

**ඩබ්ලිව් සූරියාරච්චි මයා**
**සහකාර සාමාන්‍යාධිකාරී**
**(ක්‍රියාත්මක කිරීම් - කළාප 1)**

මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (ක්‍රියාත්මක කිරීම් - කළාප 1) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කලා උපාධිධාරියෙකි.

**ඒ ජේ එම් එස් ජයසුන්දර මයා**
**සහකාර සාමාන්‍යාධිකාරී**
**(ක්‍රියාත්මක කිරිම් - කළාප 2)**

මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (ක්‍රියාත්මක කිරිම් - කළාප 2) ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වානිජවේදි (විශේෂ) උපාධිධාරියෙකු වන අතර, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ වයඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියද හිමිකර ගෙන ඇත. ඔහු 1999 වසරේදි කලාප කළමනාකරුවෙකු ලෙස මණ්ඩලයේ සේවයට එක්වී ඇත.





**එම් එස් දිසානායක මයා**
**සහකාර සාමාන්‍යාධිකාරී (ස්වයං රැකියා සහ සංක්‍රමිකසේවා)**

මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (ස්වයං රැ කියා සහ සංක්‍රමනිකසේවා) ලෙස කටයුතු කරයි. ඔහු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ ව්‍යාපාර කළමනාකරනය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යාල කළමනාකරණය පිළිබඳ සහතික ලාභියෙකි. ඔහු 1995 වසරේදී ක්‍රියාත්මක කිරීමේ නිලධාරියෙකු ලෙස මණ්ඩලයේ සේවයට එක්වී ඇත.

**එම් ඒ කේ අළුත්ගමගේ මහතා**
**වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)**

මණ්ඩලයේ වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ලෙස කටයුතු කරන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදි (විශේෂ) උපාධිධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය කළමනාකරන ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. 1999 වසරේදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවයට එක්වී ඇති ඔහු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වල මූල්‍ය, විගණන සහ ආයෝජන යින ක්ෂේත්‍ර වල වසර 25 කට අධික පළපුරුද්දක් ලබා තිබේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



## අපගේ දැක්ම

සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය
සහ ප්‍රමිතිය ඉහළ නැංවීම
සඳහාවන කාර්යක්ෂම සහ සැබෑම
විශ්වාසය සපිරි භාරකාර අරමුදලක්
බවට පත්වීම




## අපගේ මෙහෙවර

සමාජයේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා පාරිභෝගික සුරැකුම් කටයුතුවල සහ සේවාවේ විශිෂ්ඨත්වය අවධාරණය කරමින් ව්‍යාපාර සහකරුවන් වෙනුවෙන් වගකීමකින් බැඳී සිටිමින් ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ ක්‍රියාවලින් ඔස්සේ දිවි සරු කරගැනීමට සාමාජිකයින්ට හැකියාව ලබාදීම

## අපගේ සාරධර්ම

- නිර්මාණශීලී,නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශීලී සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලින්
- විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ
- තෘප්තිමත් පාරිභෝගිකයින්



# ප්‍රධාන මූල්‍ය තොරතුරු 2013

සාමාජික අරමුදල
රු බිලියන
174

රු බිලියන
15.4
ලාභය

මුළු වත්කම
රු බිලියන
178

ආයෝජන මත
ප්‍රතිලාභය
10.5%

පොළී හා ලාභාංශ
10%
රු බිලියන
15.8

කොටස් ආයෝජන
මත ප්‍රතිලාභය
5.03%

ආයෝජන
ආදායම
රු බිලියන
16.2



# මූල්‍ය සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි ශුද්ධ දායක මුදල් වල වැඩි වීමත් සමඟ මූල්‍ය අංශයේ වත්කම් වල 1.8 ක ප්‍රමාණයක් නියෝජනය කරයි.

2012 වසරේදි රු බිලියන 13.2 ක් වූ ආයෝජන ආදායම 2013 වසරේදී වාර්තා කල රු බිලියන 16.2 හා සැසදිමේදි රු බිලියන 3 කින් වර්ධනය වී තිබිණි. 2012 වසරේදි රු බිලියන 12.3 ක් වූ ආදායම් බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය රු බිලියන 15.2 ක් දක්වා වර්ධනය විය.

2013 වසර අවසන් වන විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මුළු වත්කම් වල වටිනාකම රු බිලියන 178 ක් වූ අතර, මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 10 ක් පමණ විය. එයින් මිලියන 2.2 ක් පමණ සක්‍රීය සාමාජික ගිණුම් විය. 2013 දෙසැම්බර් 31 දින වන විට දායක මුදල් ගෙවන සේවා යෝජකයින් සංඛ්‍යාව 72,145 ක් විය. 2012 වසරේදි රු බිලියන 12.7 ක්වූ මුළු දායක මුදල් රැස්කිරීම් 2013 වසරේදි රු බිලියන 14.4 ක් දක්වා වර්ධනය වූ අතර 2012 වසරේදී රු බිලියන 8.6 ක් වූ සාමාජික මුදල් ආපසු ගෙවීම් 2013 වසරේදි රු බිලියන 9.6 ක් දක්වා වර්ධනය විය.

2013 වසරේදී ශුද්ධ දායක මුදල රු බිලියන 4.8 ක් වූ අතර එය සියයට 16 ක වර්ධනයකි. 2013 වසර අවසානයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු මුළු වත්කම් වල වටිනාකම රු බිලියන 178.5 ක් වූ අතර එය සියයට 12.8 ක වර්ධනයක් විය.

2012 වසරේදී රු බිලියන 154 ක් වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජික අරමුදල 2013 වසරේදි රු බිලියන 174 ක් දක්වා වර්ධනය විය.


# මණ්ඩලය තුළ සිදුවූ

# වැදගත් සිද්ධීන්


1981 සිට 2013

**1986**

**මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**උපරිමය රු. 50,000/=**




**1989**




**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**
**උපරිමය රු. 200,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**1991**

**හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර**
**උපරිමය රු. 200,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය



**1992**



**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය**
**ඇස් දෙකම සඳහා රු. 18,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර




## 1994

**සේ/නි හා අ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලාධාර රු 15,000/= බැගින් ශිෂ්‍යත්ව 7,000 ක් වාර්ෂිකව**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය

## 1997



**ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය රු. 25,000/= බැගින් රු. 50,000/= ක උපරිමය මුළු සේවා කාලය තුලදී**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිහාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලාධාර




## 2002

**'වියන' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිහාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

## 2006



**වකුගඩු බද්ධ කිරීම් සඳහා මුලාධාර : උපරිමය රු. 150,000/=**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිහාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
'වියන' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය



## 2010

**සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය**
**අපොස (උසස්පෙළ) අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රු. 12,000 බැගින් වාර්ෂික මුලාධාර**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිහාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මුලාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
'වියන' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීම් සඳහා මුලාධාර

# ආයතනික සමාලෝචනය

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනතින් ස්ථාපිත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදි.**

වර්තමානය වනවිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් සහ අරමුදලේ කළමනාකරුවෙක් ලෙස එහි ආවේනික සංවිධාන ව්‍යුහය තුල ක්‍රියාත්මක වන අතර, අනාගතයේදී ඉතාමත් ක්‍රියාශිලි මුල්‍ය ආයතනයක් බවට පත්වීමට අදිටන් කර සිටී. ආයතනික සංවිධාන ව්‍යුහය පිළිබඳව පනතෙහි කිසිවක් විශේෂයෙන් සඳහන් කර නොමැත. කෙසේ වුවද, පනතේ 5 වන වගන්තියේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා නීතිරීති සම්පාදනය කල හැකිය.

අරමුදලේ සියළුම කටයුතු කලමනාකරනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගෙන් 4 දෙනෙකු අදල විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන අතර, මුදල් හා වාණිජ අමාත්‍යංශය, හාම්පුතුන්ගේ සංගමය සහ 100,000 කට වැඩි සාමාජිකත්වයක් ඇති වෘත්තිය සමිති දෙකකින් එක සාමාජිකයෙක් බැගින් නම් කල හැකිය.

මණ්ඩලයේ සභාපතිවරයා අදල අමාත්‍යවරයාගේ අභිමතය පරිදි පත්කල හැකි අතර, පනතේ සඳහන් පරිදි ඔහු අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි ලෙසද කටයුතු කල යුතුය.

සේවායෝජකයින් විශාල පිරිසක් බස්නාහිර පළාත තුල කේන්ද්‍රගතව සිටීම නිසා ආරම්භයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මධ්‍යගත ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය. ප්‍රාදේශිය කාර්යාල ජාලය තුල සිදු කරන ලද ප්‍රතිසංවිධාන කටයුතු නිමවීමෙන් පසුව නව විභවයක් සහිත ප්‍රදේශ වල ආරම්භ කරන ලද ප්‍රාදේශිය හා දිස්ත්‍රික් කාර්යාල සමග ක්‍රියාත්මක කිරීම් හා නීති කටයුතු වල ත්‍රිවුර සංවර්ධනයක් සිදුවිය.

ඉන් පසුකාලීනව ප්‍රධානතම සාමාජික සේවා කටයුතු එනම් ඉල්ලුම්පත් භාර ගැනීම, ප්‍රතිලාභ ගෙවීම්, සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යයන් පුළුල් වශයෙන් මෙහෙයුම් සහ සහයක සේවා වශයෙන් දෙආකාරයකට බෙදිය හැක. මෙහෙයුම් කාර්යයන් ලෙස රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන අංශ හඳුනා ගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මුදල්, තොරතුරු තාක්ෂණ සහ අභ්‍යන්තර විගණන අංශ සහායක සේවා අංශ ලෙස හඳුනාගෙන ඇත.

පනතේ දක්වා ඇති පරිදි සභාපතිවරයාහට ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කිරීමටද බලය දී ඇත. සාමාන්‍යාධිකාරි සහ අතිරේක සාමාන්‍යාධිකාරි සභාපතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි. සෑම ප්‍රධාන කොට්ඨාශයක්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුර, සභාපතිගේ/ ප්‍රධාන විධායක නිලධාරිගේ කටයුතු වලට සහය වීම සඳහා ආරම්භ කර ඇත.

ඒ අනුව ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රමාණවත් සංවිධාන ව්‍යුහයක් සකස්කර තිබේ.



# ආයතනික යහපාලනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සෑම ස්ථරයක් තුලම ශක්තිමත් සාරධර්ම පද්ධතියක් ඇතිකිරීම, ලිඛිත ක්‍රියාවලින් යන ප්‍රතිපත්ති තුලින් සහ ආදර්ශමත් ලෙස නායකත්වය සපයන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් යහපාලන සංකල්පය ආයතනය තුළ ස්ථාපිත කිරීම සඳහා පියවර ගෙන තිබේ.

ආයතනික යහපාලනය ඉතා ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යෑම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා වගකීමෙන් කැපවී සිටී. මණ්ඩලයේ ආයතනික යහපාලන ක්‍රියාවලිය එහි පාර්ශවකරුවන් සඳහා සහතිකවූ වටිනාකම් ලබාදීමට අදිටන් කරගෙන ඇත. මණ්ඩලයේ යහපාලන සංකල්පය පහත සඳහන් දේ වලට අනුගත වෙමින් ක්‍රියාත්මක වේ.

1. 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත
2. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති රාජ්‍ය ආයතන සඳහා වූ යහපාලන උපදෙස් මාලාව
3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ආයතනික යහපාලනය සඳහාවූ Code of Best Practice
4. ශ්‍රී ලංකා ගිණුම්කරන හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත
5. මණ්ඩලයේ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි සංග්‍රහය

## අධ්‍යක්ෂ මණ්ඩලය

රජය සහ පාර්ශවකරුවන් වෙත ආයතනික නියෝජනයක් ලෙස වගකීමෙන් කටයුතු කරන කාර්යක්ෂම අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් මණ්ඩලයේ කටයුතු මෙහෙයවනු ලබයි. එම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පිටු අංක 8-11 හි සඳහන් කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

**අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනාගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය**

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් හතරදෙනෙකු
- මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු
- වෙළෙඳ විෂයය භාර ආමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු
- ලංකා සේවායෝජකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු සහ
- එක් එක් වෘත්තීය සමිතියෙහි සාමාජිකත්වය 100,000 කට වැඩි වෘත්තීය සමිතිවල සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සේවක සාමාජිකයන් දෙදෙනෙකු

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය

රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව කාර්යක්ෂම හා ඵලදායි ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කටයුතු ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ආයතනයේ සම්පත් ආරක්ෂා කරන අතරම මනා ලෙස ගිණුම් පවත්වා ගැනීම නිවැරදි වාර්තා තබා ගැනීම සහ කළමනාකරනයට සම්බන්ධ ව්‍යාවස්ථාපිත සහ අනිකුත් විධිවිධාන වලට අනුකූල වෙමින් මෙම තත්වය ළඟා කර ගත හැකි විය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ උපායමාර්ගික ඉලක්ක නිසියාකාර ලෙස අවබෝධ කරගෙන එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ආයතනය මෙහෙයවනු ලබයි.

එසේම කාර්යක්ෂම අභ්‍යන්තර පාලන හා අවධානම් කළමනාකරණයක් ස්ථාපිත කිරීම, ආයතනයේ කළමනාකරන මූලාශ්‍රයන් නිසියාකාරව ක්‍රියාත්මක වීම සහ සම්පත් සහ වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර අවධානයෙන් අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්ය සාධනය වාර්ෂිකව තක්සේරුවකට ලක්කරන අතර, මූල්‍ය හා අනිකුත් හෙළිදරව් කිරීම් පිළිබඳව එහි පාර්ශවකරුවන්ට නිරන්තරයෙන් ප්‍රමාණවත් ලෙස දැනුවත් කිරීමක් සිදුකරනු ලබයි.

එසේම විගණන හා කළමනාකරන කමිටුව සහ ආයෝජන කමිටුව පත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අන්‍යොන්‍ය වශයෙන් ගැටුම්කාරී තත්වයක් ඇති නොවන ලෙස රජයේ ව්‍යාවස්ථාපිත අවශ්‍යතාවයන්ට සහ අනිකුත් නීතීරීති සහ චක්‍රලේඛ වලට අනුකූල වෙමින් මණ්ඩලයේ කටයුතු පවත්වා ගෙන යාම අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාවයි. එසේම යහපාලන රාමුවක් තුළ විනිවිදභාවය සහ වගවීම ආයතනය තුළ ස්ථාපිත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂාව වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම පනතේ සඳහන් ආකාරයට සිදුකරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුකූල විය යුතු කාර්ය භාරය අයිතිවාසිකම් සහ වගකීම් අදාල පත්කිරීමේ බලධාරී විසින් අත්සන් කරනු ලබන පත්කිරීමේ ලිපියේ සඳහන් වේ.

## සභාපති

ආයතනයේ සභාපති විසින් පැහැදිලි හා විශිෂ්ඨ නායකත්වයක් ලබාදීම අපේක්ෂා කරනු ලබයි. එසේම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් එහි සම්පූර්ණ යහපාලන ව්‍යුහය තුළ එය නිවැරදි ඉලක්කය කරා මෙහෙයවීමේ කාර්යභාරය ඔහු සතුව පවතී. එසේම සභාපති විසින් ආයතනික යහපාලන පැවැත්ම, සියළුම අධ්‍යක්ෂ වරුන්ව සමකර සැලකීම, පැහැදිලි ලෙස වගකීම් බෙදදීම සහ බලය සහ අධිකාරිය සමබරව පවත්වාගෙන යාම තහවුරු කල යුතුය. ඔහු විසින් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මෙහෙයවනු ලැබිය යුතු අතර, ප්‍රමාණවත් මට්ටමකින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වාගෙන යා යුතුය. ඔහු විසින් ක්ෂේත්‍රයේ ලබා ඇති විශේෂ දැනුම භාවිතා කරමින් ආයතනය තුල අධීක්ෂන මට්ටමේ උපරිම කාර්යභාරයක් සිදුකරන අතර, මෙහෙයුම් කටයුතු වලට සම්බන්ධවීමක් සිදු නොකරයි. එසේම ඔහු විසින් අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින්ද ආයතනය සඳහා ක්‍රියාශීලි වැඩකොටසක් සිදුකිරීමට උනන්දු කරවීම සිදුකරනු ලබයි.

## මණ්ඩලයේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමට බැඳී සිටින ආයතනයේ ක්‍රියාපටිපාටි පිළිබඳ අනුකූලතාවය, නීතිය හා අනිකුත් නීතීරීති පිළිබඳව දැනුවත්භාවය සහිත සහ නියමිත කාලය තුළ ප්‍රමාණවත් සහ විශ්වාසනීය මට්ටමේ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදීමට හැකි වෘත්තීය මට්ටමේ සුදුසුකම් සහිත ලේකම් වරයෙකුගේ සහය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවකාශ ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමේ මනා ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම, රැස්වීම් ඵලදායි ලෙස පවත්වාගෙන යෑමට සහයවීම සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පත්‍රිකා කලට වේලාවට ලබාදීම ආදිය මනා ලෙස ඉටුකළ කල යුතුවේ. ඔහු විසින් ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය නියමිත ක්‍රියා පිළිවෙත්, වගකීම්, නීතිරීති පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලට අවශ්‍ය උපදෙස් හා සහයෝගය ලබාදෙනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය

ආයතනයේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සාමාන්‍යාධිකාරීවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔවුන් සතුව පවතී. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාදීම සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සිදුකරනු ලබයි. ආයතනයේ ඉලක්ක සහ අරමුණු සඵල කර ගැනීම සඳහා සහ ආයතනය ඵලදායි ලෙස කළමනාකරනය කිරීමට අවශ්‍ය මෙහෙයුම් සැලසුම් සහ අයවැය ලේඛණ සකස් කිරීම, නියමිත ක්‍රියාපටිපාටින් සහ පාලන ක්‍රමවේද සකස් කිරීම සහ පවත්වාගෙන යෑම ඔවුන් විසින් සිදුකරනු ලබයි.

## මූල්‍ය වාර්තාකරණය

මණ්ඩලයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරන භාවය පිළිබිඹු වන පරිදි සහ වාර්ෂික කාර්ය සාධනය දැක්වෙන පරිදි පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයත්, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීම් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කලට වේලාවට වඩා විශ්වාසනීයත්වයෙන් යුතුව තොරතුරු සැපයීම ඉතා පුළුල් හෙළිදරව් කිරීම් සහ විනිවිදභාවයකින් යුතුව සිදුකිරීමට පියවර ගෙන ඇත.

## වාර්ෂික විගණනය

මණ්ඩලයේ වාර්ෂික විගණනය විගණකාධිපති විසින් සිදුකරනු ලබයි.

## මණ්ඩලයේ කමිටු

මණ්ඩලයේ විශේෂිත කාර්යයන් කමිටු වලට පවරා ඇත.



මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 900 ක් පමණ වන අතර, ඔවුන් ගෙන් විශාල පිරිසක් තරුණ අවධියේ පසුවන අතර, එය මණ්ඩලයේ ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා මහඟු පිටුවහලක් වී ඇත

# වත්මන් සභාපතිවරයාගේ පණිවිඩය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ප්‍රධාන සමාජ ආරක්ෂණ අරමුදල් දෙකෙන් එකක් වන අතර පුද්ගලික සහ රාජ්‍ය ව්‍යාපාර අංශයේ සේවකයින්ට විශ්‍රාමික වයසේදි හිමිකම් ලබන දයක නොවන නිශ්චිත ආදයම් ආරක්ෂණ ක්‍රමයකි. 1981 වසරේ එහි ආරම්භයේ සිට සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමට අමතරව අනෙකුත් අවිනිශ්චිතතාවයන් රාශියක් වෙනුවෙන් යැපෙන්නන් සඳහා ප්‍රතිලාභ අනතුරු සහ ලෙඩරෝග අබලදුබලතා ආදීය සඳහාද සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවන අරමුදලක් දක්වා එය වර්ධනය විය. සාමාජිකයන්ගේ සේවා ස්ථානය වසර පහෙන් පහට වෙනස් වීමේදි ඔවුන්ගේ ගිණුමේ ඇති ශේෂය සේවා ව්‍යුක්ත ප්‍රතිලාභයක් ලෙස නැවත ලබා ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල මගින් අවස්ථාව ලබාදී ඇත. පුළුල් ආයෝජන පාරාසයක් තුල ක්‍රියාත්මක වන අතර එහි ස්ථාපිත අරමුණක් ලෙස සමාගම් වල කොටස් අයිතිය ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම සිදුකරයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් සාමාජිකයන් සඳහා පුළුල් පරාසයක් තුල සුභසාධන ප්‍රතිලාභ ක්‍රම හඳුන්වාදී ඇති අතර ඒ යටතේ මරණ සහ අබලදුබලතා සඳහා රක්ෂණාවරණ අසාධ්‍ය ලෙඩරෝග සඳහා මුල්‍යාධාර ලබාදීම 5 වසර ශිෂ්‍යත්වය සහ උසස්පෙළ විභාගය සමත් සාමාජිකයන්ගේ දරුවන් සඳහා මුල්‍යාධාර ලබාදීම සහ සාමාජිකයන් සඳහා ඔවුගේම නිවාසයක් තනා ගැනීම සඳහා ජාතික සංවර්ධන බැංකුව සමඟ එක්ව නිවාස ණය ලබාදීම ආදී යෝජනාක්‍රම ක්‍රියාත්මක වේ.

අරමුදල සඳහා දයකවීමේදි ඇති එක් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ එය ස්වයං රැකියාලාභින් සහ සංක්‍රමික සේවකයන් සඳහාද ස්වේච්ඡාවෙන් සාමාජිකත්වය ලබා ගැනීම සඳහා විවෘතව පැවතීමයි.

මේ අංශයේ ශ්‍රම බලකාය යටතේ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරිමේ විශාල අවස්ථාවක් පැවතියද තවමත් එම ප්‍රතිලාභ ලබා ගැනීමට දයක වී ඇත්තේ ඉතාමත් අතලොස්සක් වූ පිරිසකි.

2013 දෙසැම්බර් 31 වන දින වනවිට සේවායෝජකයින් 72,145 ක් යටතේ සක්‍රීය සාමාජිකයින් මිලියන 2.2 ක් සාමාජිකත්වය ලබා සිටින අතර 2013 වන විට අරමුදල රුපියල් බිලියන 174 ක් දක්වා වර්ධනය වී තිබේ. අරමුදල සඳහා දයක මුදල් රැස්කිරිම අධිභාර සහ ප්‍රමාද දයක මුදල් රැස්කර ගැනීම ආයෝජන ආදයම වැඩිකර ගැනීම ආදී ක්ෂේත්‍රවල විශාල ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවූ අතර 2013 වසෙර්දී රුපියල් මිලියන 14,913 ක් බදු වලට පසු ශුද්ධ ලාභයන් උපයා ගැනීමට හැකිවිය. මෙම කාල පරිච්ඡේදය සඳහා පොලී හා ලාභාංශ වශයෙන් 10% ක් ප්‍රකාශ කිරිමට හැකිවූ අතර එය පැවති පොළි ප්‍රතිශත හා සැසදිමේදි ඉහළ ප්‍රතිලාභයක් බව සඳහන් කල යුතුවේ.

මේ වනවිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක පිරිස 900 ක් පමණ වන අතර එම සියළු දෙනාගේම කැපවීම සහ අධිෂ්ඨානය වී ඇත්තේ ආයතනයේ ඉහළ ප්‍රගතියයි. අවසාන වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා විසිරි ඇති ශාඛා කාර්යාල 17 ක සේවක මණ්ඩලයට මෙම ප්‍රගතිය ලඟාකර ගැනීමට ලබාදුන් සහයෝගය සහ කැපවීම වෙනුවෙන් මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්තාව 2013

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2013 වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයින් වෙත මෙසේ සැකෙවින් ඉදිරිපත් කර සිටී.**

**මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මස 01 වන දින ආරම්භ කරන ලදී. මෙම ආයතනය එහි 32 වන සේවා වසරද සම්පූර්ණ කර ඇති බව සාමාජිකයන්ට මෙන්ම සේවායෝජකයන් වෙතද දන්වා සිටින්නේ ඉතා සාඩම්බරයෙනි.**

## වසර තුළ ලබාගත් විශිෂ්ඨ ප්‍රගතිය

2013 වසර තුළ මණ්ඩලය විසින් ක්ෂේත්‍ර ගණනාවකින් අත්පත්කර ගන්නා ලද විශිෂ්ඨ ප්‍රගතිය පහත දැක්වේ.

1. සේවා යෝජකයින්ගෙන් රැස්කර ගත් දායක මුදල රුපියල් බිලියන 14.4 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 1.7 ක වැඩිවීමකි.

2. මණ්ඩලය විසින් 2012 වසරේදී උපයන ලද ආයෝජන ආදායම වන රුපියල් බිලියන 13.2 සාපේක්‍ෂව මෙම වසරේදී රුපියල් බිලියන 16.2 ක ආදායමක් ඉපයූ අතර,එය රුපියල් බිලියන 3 ක වැඩිවීමක් වූ අතර, වසර අවසානයේදී මුළු ආයෝජන කළඹ රුපියල් බිලියන 150 සිට රුපියල් බිලියන 168 ක් දක්වා වර්ධනය විය.

3. පසුගිය වසරේ උපයන ලද ශුද්ධ ලාභය වන රුපියල් බිලියන 11.9 ට සාපේක්‍ෂව මෙම වසරේදී රුපියල් බිලියන 15.4 ක ශුද්ධ ලාභයක් උපයා ගැනීමට හැකිවූ අතර, වසර අවසානයේදී ලාභාංශ හා පොළී වශයෙන් රුපියල් බිලියන 15.8 ක් සාමාජිකයන් අතරේ බෙදා හැරීමට හැකිවිය.

4. වසර අවසානය වනවිට අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 178 ඉක්මවිය.

5. 2012 වසරේ උපයන ලද රුපියල් මිලියන 333 ක ස්කන්ධ ආදායමට සාපේක්ෂව 2013 වසරේ ඉපැයුම රුපියල් මිලියන 482 කි. 2013 වසරේ කොටස් වෙළඳපොළ ගණුදෙනු වල ආන්තික වර්ධනය මෙයට ඉවහල් විය.

6. 2013 වසරේදී උපයන ලද ආයෝජන ආදායමේ වැඩිවීමත් සමග වසර අවසානයේදී සාමාජිකයන් වෙත පොළී සහ ලාභාංශ වශයෙන් 10% ක් ප්‍රකාශ කිරීමට හැකිවිය (ප්‍රස්ථාර අංක 01 සහ 02 බලන්න). මෙය බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් තම පාරිභෝගිකයින් වෙත ලබාදුන් පොළී අනුපාත වලට සාපේක්‍ෂව ආකර්ෂනිය අනුපාතයකි. එසේම තවදුරටත් ලාභාංශ සමාකාර සංචිතයෙහි රුපියල් මිලියන 657 ක මුදලක්ද ඉතිරි කර තිබුණි.

7. 2012 දී 5.7% ක්වූ අරමුදලේ මෙහෙයුම් වියදම 2013 වසරේදී 5.28% දක්වා අඩුවූ අතර එම වියදම් අපේක්ෂිත මට්ටමෙහි රඳවා ගැනීමට මණ්ඩලයට හැකිවිය. (ප්‍රස්ථාර අංක 03 බලන්න).

8. මෙම වසරේදී ශාඛා කාර්යාල ජාලය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, හිඟ දායක මුදල්, අධිභාර සහ නීතිමය අයවීම් අයකර ගැනීම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරන ලදී. ගම්පහ, නුවර සහ මාතර ශාඛා කාර්යාලයන්හි ද විමධ්‍යගත ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙළ අඛණ්ඩව ඉතා සාර්ථකව ක්‍රියාත්මක විය.

9. ඊට අමතරව, ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය 2012 දී කුරුණෑගල කාර්යාලයෙහි අරඹන ලද අතර, 2014 දී බදුල්ල කාර්යාලයෙහි ඇරඹීමට කටයුතු සළසා ඇත.

10. සේවා යෝජකයින් වඩාත් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2010 නොවැම්බරයේදී යාපනයෙහි ස්ථාපිත නව ප්‍රාදේශීය කාර්යාලය මිලියන 8 ක දායක මුදල් සාමාන්‍යයක් වාර්තා කරමින් ධෛර්යවත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

11. ඒකරාශි වී ඇති සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය මෙම වසරේදී ඉතා සාර්ථකව ක්‍රියාත්මක වූ අතර 98% ක් පමණ නිම කිරීමට හැකිවිය. ව්‍යාකූල මට්ටමක පැවති සාමාජික ගිණුම් ප්‍රමාණයද මේ වන විට නිරවුල් කරමින් පවතී. 2012 අවසානය දක්වා සිටි සමස්ත සක්‍රීය සාමාජිකයිනට අදාල වාර්ෂික ගිණුම් ශේෂ ප්‍රකාශයන් යැවීමට කටයුතු කර ඇත.

12. මෙම වසරේදී ස්වයංරැකියාලාභින් සාමාජිකයන් වශයෙන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙලට ප්‍රමුඛතාවයක් දී කටයුතු කරන ලදී. ඒ අනුව සමෘද්ධි බැංකු මඟින් ණය පහසුකම් ලබාගෙන සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ ස්වයං රැකියා ලාභින් 10,000 ක් පමණ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට හැකිවිය. මීට අමතරව, කිරි ගොවීන්, පෙර පාසැල් ගුරුවරියන්, ඉදිකිරීම් කර්මාන්ත තාක්ෂණ ශිල්පීන්, කලාකරුවන්, ත්‍රීරෝද රථ රියැදුරන් ආදී ස්වයං රැකියා ලාභීන්, සාමාජිකයන් ලෙස බඳවා ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් සමස්ථ සාමාජිකත්වය 33,000 ක් දක්වා සහ 2013 වසර තුළදී ලද සාමාජික දායක මුදල රු. මිලියන 26 දක්වාද වැඩි කර ගතහැකි විය.

13. මානව සම්පත් සංවර්ධනය සඳහා වඩාත් ප්‍රමුඛතාවයක් දී කටයුතු කල අතර, සමස්ථ කාර්ය මණ්ඩල මට්ටම් සඳහා පුහුණු වැඩ සටහන් සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පවත්වා, සේවක මණ්ඩලයේ හැකියාව, ආකල්ප සහ දැනුම වර්ධනය කිරීමට කටයුතු කරන ලදී. මේ අතර වෘත්තිය සමිති සාමාජිකයන්ද අදාල ක්ෂේත්‍රයන්හි විවිධ පුහුණු වැඩ සටහන් සඳහා යොමු කරවන ලදී.

14. කළමනාකාරිත්වය හා වෘත්තිය සමිති අතර කාර්මික සම්බන්ධතාවය සුහද මට්ටමකින් පවත්වා ගැනීමට හැකිවූ අතර, සමස්ත කාර්ය ක්ෂේත්‍රයන්ගෙන් මණ්ඩලය ලබාගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා එයද මනා පිටුවහලක් විය.

## සේවායෝජක දායක මුදල් සහ සාමාජික ගිණුම්

සේවායෝජකයන්ගෙන් දායක මුදල් රැස්කිරීම සහ එම මුදල් කලට වේලාවට බැංකුගත කිරීම දායක මුදල්
රැස්කිරීම් අංශයේ කාර්ය භාරය වන අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සහ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ කාර්ය භාරය වේ.

සාමාජිකයන් සඳහා වඩාත් ඵලදායි සහ කඩිනම් සේවාවක් සැලසීමේ අභිලාෂයෙන් මණ්ඩලයට දායක මුදල් ගෙවනු ලබන සේවා යෝජකයින් විශාල හා කුඩා කාණ්ඩය ලෙස වර්ග කර ඇත. සේවකයින් 15 කට අඩු සේවායෝජකයන් කුඩා කාණ්ඩය වශයෙන්ද, සේවකයින් 15 වැඩි සේවායෝජකයින් විශාල කාණ්ඩය වශයෙන්ද, වර්ගීකරණය කර ඇත.

2013 වසර තුළ නව සේවායෝජකයින් 2,040 දෙනෙක් අරමුදලට දායක මුදල් ගෙවීම ආරම්භ කළ අතර, වසර අවසානය වන විට මුළු සේවායෝජකයින්ගේ සංඛ්‍යාව 72,234 දක්වා වර්ධනය විය. ඒ අනුව 2012 වසරේදී ලැබුණු මුළු දායක මුදල වන රුපියල් බිලියන 12.7 ට සාපේක්ෂව 2013 වසරේදී ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන් ලැබු දායක මුදල රුපියල් බිලියන 14.4 කි. (ප්‍රස්ථාර අංක 04 බලන්න). මේ අතර වසර ආරම්භයේදි රුපියල් බිලියන 153.6 ක් වු සාමාජික අරමුදල සමාලෝචිත වසර අවසානයේදී රුපියල් බිලියන 174.3 ක් දක්වා වර්ධනය විය. (ප්‍රස්ථාර අංක 05 බලන්න).

## සාමාජික ප්‍රතිලාභ සහ සුභසාධන ප්‍රතිලාභ

සාමාජිකයින්ගේ දායක මුදල් ආපසු ලබාගැනීමේ අයදුම්පත් සහ ප්‍රතිලාභ අයදුම්පත් භාර ගැනීම, ඒවා කඩිනමින් නිම කිරීම සහ ගෙවීම් කිරීම මෙම අංශයන්හි කාර්ය භාරය වේ.

එයට අමතරව සාමාජිකයන් වෙනුවෙන් දායක මුදල් නියමිත දිනයන්හි ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සේවායෝජකයින් දැනුවත් කිරීම, අනිකුත් ප්‍රතිලාභ යෝජනා ක්‍රම සහ සාමාජික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාමාජිකයින් සහ සේවායෝජකයින් දැනුවත් කිරීම සාමාජික සේවා අංශයේ කාර්ය භාරය යටතට ගැනේ. විවිධ ආයතන, වෘත්තීය සමිති, වෘත්තිකයන්ගේ සංවිධාන සහ මහජනතාවගේ ඉල්ලීම් මත එම කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩ සටහන් නිරතුරුව ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

වසර 2013 දී ප්‍රතිලාභ අයදුම්කරුවන් 152,866 ක් වෙනුවෙන් රුපියල් බිලියන 9.7 ක් ගෙවන ලදී. මේ සඳහා 2012 වසරේදී අයදුම්කරුවන් 146,876 වෙනුවෙන් රුපියල් බිලියන 8.7 ක්



# ප්‍රධාන කාර්යයන්

**2013 වසර තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් පහත අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණි.**

ගෙවන ලදී. ප්‍රතිලාභ අයදුම්පතක් සඳහා ගෙවන ලද සාමාන්‍යය පසුගිය වසරට සාපේක්ෂව රු. 59,126 සිට රු. 63,480 දක්වා වර්ධනය විය. (ප්‍රස්ථාර අංක 06 බලන්න). මෙම වසරේදී දායක මුදල් ආපසු ලබා ගැනීමේ ආන්තික වර්ධනයක් දක්නට ලැබුණි. 2012 වසරේදී ගෙවන ලද රුපියල් මිලියන 232 ක අගයෙන් යුත් විශේෂ ප්‍රතිලාභ අයදුම්පත් 10,880 ට සාපේක්ෂව විශේෂ ප්‍රතිලාභ අයදුම්පත් 11,122 ක් සඳහා රු. මිලියන 248 ක් 2013 වසරේ ගෙවන ලදී. 2013 වසරේදී 05 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්, සාමාජිකයන්ගේ දරුවන් 5,520 ක් වෙනුවෙන් රු. මිලියන 83 ක් මහජන බැංකුවේ තැන්පත් කරන ලදී.
(ප්‍රස්ථාර අංක 07 බලන්න).

සාමාජිකයන්ගේ, අපොස (උසස් පෙළ) සමත් දරුවන් 1,467 ක් සඳහා ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් 2013 වසරේදී රු.මිලියන 18 ක් ගෙවන ලදී.

සාමාජිකයන් 82 වියන නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ නිවාස ණය ප්‍රදානය සඳහා රු.මිලියන 105 ක් NDB බැංකුව වෙත මුදා හරින ලදී.

සිය සාමාජිකයන් වෙනුවෙන් පහත සඳහන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කෙරේ.

**මරණ ප්‍රතිලාභ**

1. මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු. 50,000/=

**හදවත් සැත්කම්**

2. හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 150,000/=

**වකුගඩු බද්ධ කිරීම්**

3. වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 150,000/=

**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ**

4. නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු. 200,000/=

**අක්ෂිකාච බද්ධ කිරීම්**

5. අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය : ඇස් දෙකම සඳහා රු. 18,000/=

**05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර**

6. සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර - රු 15,000/= බැගින් ශිෂ්‍යත්ව 7,000 ක් වාර්ෂිකව

**ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ**

7. ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය - රු. 25,000/= බැගින් රු. 50,000/= ක උපරිමය මුළු සේවා කාලය තුළදී

**'වියන' අඩු පොලී නිවාස ණය**

8. 'වියන' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය

**නිත්‍ය දුබලතාවයට පත් සාමාජිකයින්ගේ 05 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය**

9. සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය

**අපොස (උසස්පෙළ) සමත් අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන්ට වාර්ෂික මූල්‍යාධාර**

10. අපොස (උසස්පෙළ) අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රු. 12,000/= බැගින් වාර්ෂික මූල්‍යාධාර

- ඉක්මණින් මුදල් ලබාගැනීමේ අවශ්‍යතාව සහිත සාමාජිකයන්ගේ පහසුව සඳහාවූ කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## සාමාජික ගිණුම් නඩත්තුව

පෞද්ගලික සාමාජික ගිණුම් යාවත්කාලීන පවත්වා ගැනීම සහ සක්‍රීය සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ශේෂ ප්‍රකාශයන් නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ වගකීම වේ.

වර්ෂය අවසානයේදී අරමුදලේ සක්‍රීය සහ අක්‍රීය සාමාජික සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 11 ක් පමණ වූ අතර, මණ්ඩලය විසින් සියළුම සක්‍රීය සහ අක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් ගිණුම් පවත්වා ගෙන යනු ලැබේ.

2013 දෙසම්බර් 31 දිනට 10,502,242 ක සාමාජික ගිණුම් යාවත්කාලීන කර තිබූ අතර, එය ආසන්න වශයෙන් සමස්ත ඇස්තමේන්තුගත සාමාජික ගිණුම් සංඛ්‍යාවෙන් 95% ක් පමණ විය. මේ අතුරින් අක්‍රීය සාමාජික ගිණුම් 8,378,930 ක් වූ අතර, 2,123,312 ක් වූ සක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් වාර්ෂික සාමාජික ශේෂ ප්‍රකාශනයන් වර්ෂය තුළදී ඔවුන්ගේ අදාළ සේවා යෝජකයින් වෙත නිකුත් කරන ලදී.

## ආයෝජන

පසුගිය වසරේ රුපියල් බිලියන 150 ක්වූ ආයෝජන කළඹ 2013 වසරේදී රුපියල් බිලියන 168 ක් දක්වා වර්ධනය වූ අතර, එය ඉකුත් වසරට සාපේක්ෂව 12% ක වැඩිවීමකි.

2013 වසර තුලදී මණ්ඩලය සිය ආයෝජන මාර්ගෝපදේශයන් ඉතාමත් වගකීමකින් අනුගමනය කළ අතර, ආයෝජිත ප්‍රාග්ධනයද සුරක්ෂිත කර ගනිමින් ඉහළ ප්‍රතිලාභයක් ද අත්පත් කරගන්නා ලදී.

ආයෝජන කළඹින් රු. බිලියන 149 (88.7%) ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කරන ලද අතර, රජයෙන් සුරක්ෂිත ස්ථාවර ආදායම් උපකරණ වල රු. බිලියන 6 (3.69%) ක් සහ සකන්ධ ප්‍රාග්ධන ආයෝජනය රු. බිලියන 7.5 ක්ද විය. (ප්‍රස්ථාර අංක 08 බලන්න)

මණ්ඩලය විසින් පසුගිය වසරේ උපයන ලද රු. මිලියන 324 ට සාපේක්ෂව කොටස් ලාභාංශ සහ ප්‍රාග්ධන ලැබීම් මගින් රු. මිලියන 482 ක ලාභයක් උපයාගෙන තිබුණි. 2013 කොටස් වෙළඳපොළ ගණුදෙනු වල ඇතිවූ ආන්තික වර්ධනය මෙයට ඉවහල් විනි.

පෙර සඳහන් කළ පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2012 වසරේ ඉපයූ රු. බිලියන 13.2 ට සාපේක්ෂව 2013 වසර තුළදී රු. බිලියන 16.2 ක ආයෝජන ආදායමක් උපයාගෙන තිබුණු අතර, එය රු. බිලියන 3 ක වර්ධනයකි.

2014 වසර අවසානයේදී සාමාජිකයන්ට වඩාත් සාධාරණ ලාභාංශ ප්‍රතිශතයක් ලබා දීම ප්‍රත්‍යක්ෂ කරමින් අදායම් ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් වාණිජ පත්‍ර සහ ණයකර ආදී විකල්ප ආයෝජනයන් කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුව පවතී. එසේම ද්විතීක වෙළඳ පොළෙහි වඩාත් ආකර්ෂණීය වාසි අත්කර ගැනීම සඳහා ණයකර අලෙවි කිරීමේ හැකියාව ඇත්දැයි තවදුරටත් පරීක්ෂා කරගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව/ කොළඹ කොටස් වෙළඳ පොළ මගින් පවත්වනු ලබන අදාළ පාඨමාලා සඳහා යොමු කිරීමෙන් ආයෝජන විශ්ලේෂණ හා පර්යේෂණ සඳහා කාර්ය මණ්ඩල පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

2013 අගෝස්තු මස 08 දින මණ්ඩලය පාර්ලිමේන්තුවේ පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වෙත කැඳවමින් සියළු කාර්යයන් විමසුමට භාජනය කරන ලදී. කෝප් කමිටු සාමාජිකයන් මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති සහ ආයෝජන මෙහෙයුම් ක්‍රමයන් පිළිබඳවද අවබෝධයක් ලබාගන්නා ලදී.

තවද, මහා භාණ්ඩාගාර නියෝජිත මණ්ඩලීය අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් නිරන්තරයෙන් රැස්වන ආයෝජන කමිටුව ආයෝජන යෝජනා සහ විකල්පයන් අගයනය කර නිර්දේශයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

## රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා

දායක මුදල් සහ අධිභාර රැස්කිරීම්, නීති සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සහ ප්‍රාදේශීය ශාඛා කාර්යාල ජාලය පරිපාලනය කිරීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. සේවායෝජකයන් විසින් මාසිකව ගෙවිය යුතු දායක මුදල් හා අධිභාර ප්‍රමාණය වර්ධනය කර ගැනීම මෙන්ම විශේෂයෙන් දුරස්ථ ප්‍රදේශයන්හි සාමාජිකයන් වෙත වඩාත් ගුණාත්මක සේවාවක් සැලසීම වෙනුවෙන්, සමාලෝචිත වසර තුලදී මූලික ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී.

මුළු ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව 17 දක්වා වැඩිවූ අතර, මෙම කාර්යාල සඳහා දක්ෂ පුහුණුවන උපාධිධාරීන් අනුයුක්ත කිරීමෙන් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ශක්තිමත් කිරීමට කළමනාකරනය විසින් පියවර ගන්නා ලදී.

ලංකා බැංකුව සහ කොමර්ශල් බැංකුව හරහා විද්‍යුත් ගෙවීම් මාධ්‍ය උපයෝගි කර ගනිමින් සේවා යෝජකයින්ට මාසික දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් 2008 වසරේදී හඳුන්වා දෙන ලදී. මෙය ඉතා පහසු ක්‍රමයක් වනවා මෙන්ම ලිඛිත කාර්යයන් අවම කර ගැනීමට ද ඉමහත් රුකුලක් වූ අතර, 2013 වසරේදී සේවායෝජකයින් වැඩි සංඛ්‍යාවක් දායක මුදල් ගෙවීම සඳහා මෙම ක්‍රමය උපයෝගි කර ගෙන තිබූ බව අපගේ අවධානයට ලක්විනි. කෙසේ වුවද, මෙම ක්‍රමයේ ඇති වාසිදායක තත්ත්වය පිළිබඳව වැඩි සේවායෝජකයින් පිරිසක් ධෛර්යමත් කිරීම සඳහා දැනුවත් කිරීමේ විවිධ වැඩමුළු හරහා මණ්ඩලය විසින් අඛණ්ඩ උත්සාහයක් දරණ ලදී. අන්තර් ජාලය හරහා සේවා යෝජකයින් 1,000 ක් පමණ දැනට දායක මුදල් ගෙවමින් සිටී. සම්පත් බැංකුව, මහජන බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව ඔවුන්ගේ අදාළ විද්‍යුත් ගෙවීම් ක්‍රමය භාවිතයෙන් දායක මුදල් ගෙවීම 2013 වසරේදී ආරම්භ කරන ලදී.

2014 වසර තුළ අනුකූලතා ප්‍රතිශතය වර්ධනය කර ගැනීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක්ම ගන්නා ලෙස සෑම ප්‍රාදේශීය කාර්යාලයකටම උපදෙස් නිකුත් කර ඇත. තවද වර්ෂය තුළ සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් ද පවත්වා ඇත.

## පරිපාලන/මානව සම්පත්

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ විවිධ අංශයන් සඳහා නවකයන් 26 දෙනෙකු කාර්ය මණ්ඩලයට බඳවාගත් අතර විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය අවසන් කිරීම ආදී හේතූන් මත සේවයෙන් ඉවත්වූ සංඛ්‍යාව 22 ක් විය. එයට අමතරව ඉහළ ශ්‍රේණි සඳහා උසස්වීම් ලද සංඛ්‍යාව 104 ක් විය. මේ අනුව වසර අවසානයේදී මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 914 ක් විය.

පසුගිය වසරේදී මෙන් මෙම වසරේදී ද සියළුම මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රයන්ට අදාල පුහුණුවීම් ලබා ගැනීමට අවස්ථාවන් උදාකර දෙන ලද අතර, මෙමඟින් කාර්ය මණ්ඩලයේ ඵලදායිත්වය, කාර්ය සාධනය හා ආකල්ප වර්ධනයට ඉවහල් විය. එම තත්ත්වය වසර තුළ මණ්ඩලය විසින් ලඟාකරගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා විශාල දායකත්වයක් සපයන ලදී. තොරතුරු තාක්‍ෂණ අංශයේ අදාල කාර්ය මණ්ඩල පුහුණුව සඳහා විශේෂ අවධානයක් යොමු වූ අතර, ඒ හා සමානවම කාර්ය මණ්ඩලයේ භාෂා නිපුනත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි ද යොමු කරන ලදී. එසේම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ද ඔවුන්ගේ දක්ෂතා වර්ධනයට අදාළ පුහුණු වැඩසටහන් කෙරෙහි යොමු කරවන ලදී.

## මුදල්

මණ්ඩලයේ සමස්ථ මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම මුදල් කොට්ඨාශයට පැවරී ඇත.

මණ්ඩලයේ සියළු ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම, සියළු කාර්ය මණ්ඩල ගෙවීම්, සැපයුම් සහ සේවාවන් වෙනුවෙන් ගෙවීම්, මාසික සහ අවසාන ගිණුම්, ප්‍රගති වාර්තා, වාර්ෂික අයවැය ලේඛණය පිළියෙල කිරීම, වාර්ෂික ලාභාංශ තීරණය කිරීම සහ අනෙකුත් කළමනාකරණ තොරතුරු සැපයීම යනාදී කටයුතු මෙම කොට්ඨාශය මගින් තව දුරටත් පවත්වා ගෙන යනු ලැබුණි.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව මණ්ඩලයේ ආයතනික සැළැස්ම සහ ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම, වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම, විගණන විමසුම් සඳහා නිරීක්ෂණ සැකසීම, බාහිර ආයතනයන් සඳහා මූල්‍යමය තොරතුරු සැපයීම සහ අනෙකුත් මූල්‍ය ලේඛණ පවත්වාගෙන යාමද මෙම කොට්ඨාශය මගින් සිදු කරනු ලබයි.

## අභ්‍යන්තර විගණන

ආයතනයේ කටයුතු වලට අදාල ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමෝපායන් පවත්වා ගැනීමට සහය වීම හා මූල්‍ය හා මෙහෙයුම් විනය උසස් ලෙස පවත්වා ගැනීමට උපකාරී වීම අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය ලෙස සැලකිය හැකිය. මේ අතර, ආයතනයේ විගණන කමිටුවේ සම්බන්ධීකරණ කටයුතු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන අතර, ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරිවරයෙකු වන අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ සභාපතිත්වය යටතේ සෑම කාර්තුවකම රැස්වී ආයතනයේ මෙහෙයුම් පද්ධතීන් හි පවත්නා ගැටළු විමසීමට භාජනය කරන අතර, ඒවා නිවැරදි කිරීම සඳහා පියවර ගැනුනි. එමෙන්ම ආයතනයේ අරමුදලින් සැලකියයුතු ප්‍රතිශතයක් ප්‍රතිලාභ ගෙවීම්/අරමුදල් ආපසු ගෙවීම් වශයෙන් සාමාජිකයන් වෙත මුදා හැරීමේ කටයුතු විගණනය කිරීමේ කටයුතු ද මෙම අංශයෙන් සිදුකරනු ලබයි. තවද 2013 වසර තුළදී තෝරාගත් ප්‍රාදේශීය කාර්යාලයන්හි කටයුතු විමර්ශනය කෙරුණු අතර, සියළුම ප්‍රධාන මෙහෙයුම් පිළිබඳවද වාර්තා කරන ලදී. මීට අමතරව තොරතුරු තාක්ෂණ කොට්ඨාශය මගින් සිදුකරනු ලබන මෘදුකාංග මොඩියුල නවීකරණයන්හි දී විගණන දෘෂ්ඨිකෝණයට අදාළව විශේෂිත කාර්යයන් සඳහා උපදෙස් ලබා දීමද මෙම කොට්ඨාශය විසින් සිදුකරනු ලබයි. අභ්‍යන්තර විගණන සැලැස්මද සමාලෝචිත වසරේදී සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, විශේෂ විමර්ශන ද මෙම කොට්ඨාශය විසින් සිදු කරන ලදී.

## තාක්ෂණය

සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතියට අදාලව කල්ගතවී පැවැති මෘදුකාංග ගැටළු විශාල ප්‍රමාණයක් මෙම වසරේදී ආයතනයේ මෘදුකාංග සංවර්ධන කාර්ය මණ්ඩලය යෙදවීමෙන් විසඳා ගැනීමට හැකිවිය. මෙම ක්‍රියාමාර්ගය තුලින් මෙවැනි තාක්‍ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා බාහිර මෘදුකාංග සංවර්ධන සේවා ආයතන වලට වැය කිරීමට සිදුව තිබූ විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකිවිය.

IPVPN තාක්‍ෂණය උපයෝගි කර ගනිමින් ගම්පහ, මහනුවර හා මාතර කාර්යාල මගින් ප්‍රධාන පරිගණක පද්ධතිය සම්බන්ධ කර ගනිමින් ආරම්භ කරන ලද ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

එක්රැස්ව තිබූ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමටත්, වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමටත්, තොරතුරු තාක්‍ෂණ අංශයෙන් විශාල තාක්‍ෂණික සහයක් ලබා දෙන ලදී.

අන්තර්ජාලය උපයෝගි කරගනිමින් ලංකා බැංකුව හා කොමර්ෂල් බැංකුව හරහා හඳුන්වා දුන් විද්‍යුත් බැංකු පහසුකම ලබා දීමෙන් අනතුරුව ක්‍රම ක්‍රමයෙන් මෙම පහසුකම තුළින් වැඩි සේවා යෝජකයින් පිරිසක් සේ.නි.භා.අ දායක මුදල් ප්‍රේෂණය කරන බව නිරීක්ෂණය විය. එසේම විශාල කාණ්ඩයේ සේවා යෝජකයින් විද්‍යුත් මාධ්‍යයෙන් පෝරම 11 විස්තර එවන බවද නිරීක්ෂණය විය.

කොළඹ හා කොළඹින් බැහැරව පවත්වන ලද විවිධ ප්‍රදර්ශන වලදී සේ. නි. භාර අරමුදලේ සාමාජිකයන් සඳහා ඔවුන්ගේ සාමාජික ශේෂ පරීක්ෂා කිරීම පිණිස තොරතුරු තාක්‍ෂණ අංශය මගින් පහසුකම් සපයන ලදී.

එමෙන්ම intranet පහසුකම උපයෝගි කර ගනිමින් ආයතනයේ කොට්ඨාශ සහ ප්‍රාදේශීය කාර්යාල අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ කටයුතු පහසු කරන ලදී.

මෙම වසර තුලදී ද ආයතනයේ වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීන කිරීමට හැකිවූ අතර, මණ්ඩලය විසින් තවදුරටත් ආයතනයේ පද්ධති හා තාක්‍ෂණික ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා අන්තර් ජාතික වශයෙන් පිළිගත් ක්‍රමවේදයන් හඳුන්වා දීමට නිරතුරුවම අදහස් කරමින් සිටී.

තොරතුරු තාක්ෂණ කාර්යයන්ට අදාළ උපදෙස් සහ මාර්ගෝපදේශයන් සඳහා රජයේ තොරතුරු තාක්ෂණ ආයතනය වන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග නිරන්තර සබඳතා පවත්වා ගනු ලැබුණි.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සඳහා සංශෝධන

1993 වසරේ සිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනයකට භාජනය නොකෙරුණු අතර, ප්‍රවර්ථන අවශ්‍යතා සහ සංවර්ධනයට සාපේක්ෂව මෙම පනතට සංශෝධනයන් කළ යුතු බවට කළමනාකාරිත්වය තීරණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගෙන් සමන්විත විශේෂ උප කමිටුවක් මගින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලදුව එකී යෝජිත සංශෝධනයන් අනුමත කර මුදල් ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ හා සමගාමීව මෙම සංශෝධනයන් අධ්‍යයනය සහ අදහස් දැක්වීම සඳහා ජාතික කම්කරු උපදේශක කමිටුව (NLAC) වෙත යොමුකරන ලදී. මෙම යෝජිත සංශෝධන ජාතික කම්කරු උපදේශක කමිටුවෙහි අනුමැතියෙන් අනතුරුව කැබිනට් මණ්ඩලය අනුමැතිය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත 2013 අගෝස්තු මස ඉදිරිපත් කර ඇත.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

ආරම්භයේ සිටම සේ. නි. භාර අරමුදලේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලැබුවේ කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි වලය. මේ වන විට ප්‍රධාන කාර්යාලයේ කොට්ඨාශ කිහිපයක් නාවල පාරේ සිට කිරුළ පාර දක්වා පිහිටා ඇති කුලී ගොඩනැගිලි 05 ක පවත්වාගෙන යනු ලැබේ. එම නිසා සේ. නි. භාර අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ සියළුම කොට්ඨාශයන් මනා කළමනාකරණ පහසුකම් සපයනු වස් එක වහලක් යට පවත්වාගෙන යාම දීර්ග කාලයක පටන් පැවති අවශ්‍යතාවයකි.

2009 වසරේදී සේවක අර්ථසාධක අරමුදල, සේ. නි. භාර අරමුදල සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් සමාජ ආරක්ෂණ ආයතන සඳහා නව ගොඩනැගිල්ලක් තැනීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල් ගල තැබීම 2009 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලදී.

මෙම ඉදිකිරීම් කටයුතුවල ප්‍රධානත්වය දරණු ලබන්නේ කම්කරු අමාත්‍යාංශය විසිනි. සේ නි භාර අරමුදල සඳහා මෙම ගොඩනැගිල්ලේ මහල් 14 ක් වෙන් කිරීමට එකඟවී ඇත. මේ වනවිට මෙම ගොඩනැගිල්ලේ මූලික ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් සමාගමකට පවරා ඇත. දැනටමත් ඉදිකිරීම් ආරම්භ කර ඇති ගොඩනැගිල්ල 2017 දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ගොඩනැගිල්ලේ සේ. නි. භාර අරමුදල් මණ්ඩලයට අයත් කොටසේ අයිතිය පවරා ගැනීම සඳහා සහාධිපත්‍ය දේපල පනත යටතේ කම්කරු අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹෙනු ඇත. සේ. නි. භාර අරමුදල් මණ්ඩලයට වෙන් කරනු ලබන ඉඩකඩ වලට අයත් ගෙවීම් අදාල අනුමැතීන් ලැබුණු පසු සිදු කරනු ලැබේ.

## විශේෂ ව්‍යාපෘති

1. මණ්ඩලය සතු අනුරාධපුරයෙහි පිහිටි ඉඩමෙහි නිවාඩු නිකේතනයක් සහ නේවාසිකාගාරයක් ඉදිකිරීමට කළමනාකාරිත්වය 2011 වසරේ මුල් භාගයේදී තීරණය කරන ලදී. මෙම ගොඩනැගිලි ද්විත්වයේ ඉදිකිරීම් 2011 ඔක්තෝබර් මස ආරම්භ කර 2013 නොවැම්බරයේදී අවසන් කරන ලදී. පැරණි කාර්යාල ගොඩනැගිල්ල කඩාදමා නිවාඩු නිකේතනයට යාබද ගොඩනැගිල්ලට එනම් කළින් සැළසුම් කරන ලද නේවාසිකාගාර ගොඩනැගිල්ල වෙත රැගෙන ඒමට තීරණය කරන ලදී.

2 සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්ය මණ්ඩල සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් සුභසාධනය සඳහා භාවිතා කළ හැකි නිවාඩු නිවස්නයක් යාල, පලටුපානෙහි සේ නි භාර අරමුදල් ක්‍රීඩා සමාජය මගින් 2012 ඉදිකරන ලද අතර, එය 2013 වසරේ සිට ක්‍රියාත්මක වේ.

## සමාප්තිය

මුදල් හා ක්‍රම සම්පාදන විෂය භාර අතිගරු ජනාධිපතිතුමා, ජ්‍යෙෂ්ඨ අමාත්‍ය හා නියෝජ්‍ය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ එම කාර්ය මණ්ඩලයේ සියළු දෙනා විසින් දක්වන ලද සහයෝගය සහ මඟ පෙන්වීම පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලය සිය විශේෂ ස්තුතිය පල කර සිටී. 2013 වර්ෂය තුළ සියළු මෙහෙයුම් කාර්යයන්ගෙන් මණ්ඩලය ලද විශිෂ්ඨ ප්‍රගතිය වෙනුවෙන් කැපවී සේවය කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙතම අධ්‍යක්‍ෂ මණ්ඩලය සිය තුති පුදයි. ඕනෑම ආයතනයක සාර්ථකත්වය සඳහා එහි සේවක මණ්ඩලයේ කාර්ය සාධනය ඉවහල් වන අතර, පවරන ලද කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා කැපවූ සේවක පිරිසක් සිටීම ගැන අප ආඩම්බර වෙමු. සියළුම වෘත්තිය සමිති විසින් අප වෙත දක්වන ලද නොමඳ දායකත්වය සහ සහයෝගය ද අප අගය කරමු. වර්ෂය තුළදී සාමාජික සේවා වෙනුවෙන් ආයතනයේ ශක්තිමත් පදනමක් ගොඩනැගීමට සමස්ථ කාර්ය මණ්ඩලය දක්වන ලද කැපවීම, අවංකභාවය සහ කණ්ඩායම් හැඟීම ප්‍රශංසාත්මකය.



# මූල්‍ය ප්‍රකාශන

2013

# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සටහන් | 2013 (රු. :000) | 2012 (රු. :000) |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පොළී ආදායම | 1 | 15,803,801 | 13,324,820 |
| ලාභාංශ ආදායම | 2 | 318,660 | 208,701 |
| ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) | 3 | 68,178 | (304,378) |
| අනෙකුත් ආදායම් | 4 | 286,047 | 258,892 |
| **මුළු ආදායම් එකතුව** | | **16,476,686** | **13,488,035** |
| | | | |
| **වියදම්** | | | |
| සේවක මණ්ඩල වියදම් | 5.1 | 720,022 | 632,244 |
| මෙහෙයුම් වියදම් | 5.2 | 125,307 | 110,702 |
| මූල්‍ය වියදම් | 5.3 | 2,657 | 2,485 |
| සාමාජික වියදම් | 5.4 | 314,372 | 289,908 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | | 18,863 | 20,878 |
| ප්‍රවර්ථන වර්ෂයේ ගෙවන ලද පොළී | | 128,958 | 118,220 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **1,310,178** | **1,174,438** |
| | | | |
| ආදායම් බදු වියදම | 6 | 253,404 | 165,649 |
| **වර්ෂයේ ලාභය** | | **14,913,103** | **12,147,948** |
| ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැලපුම | | 454,624 | - |
| **ගලපන ලද වර්ෂයේ ලාභය** | | **15,367,727** | **12,147,948** |
| | | | |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| **වර්ෂයේ ලාභය** | | **15,367,727** | **12,147,948** |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය /(අලාභය) | | - | (269,065) |
| ආයුගණන ලාභය / (අලාභය) | | - | (1,276) |
| **ආදායම් බදු අඩුකළ පසු විසර්ජනයට පෙර වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම** | | **15,367,727** | **11,877,608** |
| | | | |
| **විසර්ජනය සඳහා වූ ලාභය** | | **15,367,727** | **11,877,608** |
| ඉ/ගෙ. රඳවාගත් ලාභය | | 163,943 | 252,829 |
| ලාභාංශ තුළන සංචිත අරමුදලින් මාරුකිරීම | | 343,000 | 2,000,000 |
| | | **15,874,670** | **14,130,436** |
| අඩුකළා : යෝජිත විභජනයන් - පොළී 3 | | 4,752,333 | 4,189,948 |
| - ලාභාංශ 7% | | 11,088,778 | 9,776,545 |
| | | | |
| **ප/ගෙ. රඳවාගත් ලාභය** | | **33,559** | **163,943** |

නිවැරදි බවට සහතික කළේ

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**ජේ එම් එස් බී උඩුගම**
අතිරේක සාමාන්‍යාධිකාරී (කාර්යයෙහි නියුතු)

- මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කර අත්සන් කරන ලදී.

**කේ එම් ඒ ගොඩවත්ත**
සභාපති/ප්‍රධාන විධායක නිළධාරී

| | සටහන් | 2013 (රු. :000) | 2012 (රු. :000) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 1,043,164 | 414,831 |
| විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම් | 7 | 7,550,428 | 6,871,632 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 8 | 485,835 | 485,835 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන | 9 | 153,137,676 | 135,407,687 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජන | 10 | 7,418,615 | 7,234,690 |
| අනෙකුත් වත්කම් | 11 | 5,478,971 | 4,451,654 |
| දේපළ, පිරියත සහ උපකරණ | 12.1 | 183,067 | 188,241 |
| අස්පෘශ්‍ය වත්කම් | 12.2 | 514 | 717 |
| ආයෝජන දේපළ | 13 | 3,200,000 | 3,200,000 |
| **මුළු වත්කම්** | | **178,498,270** | **158,255,287** |
| | | | |
| බැරකම් හා ස්කන්ධය | | | |
| ප්‍රවර්තන බදු බැරකම | | 122,359 | 109,797 |
| අනෙකුත් බැරකම් | 14 | 235,917 | 156,894 |
| ප්‍රතිපාදන | 15 | 41,482 | 37,497 |
| **මුළු බැරකම්** | | **399,758** | **304,188** |
| **මුළු ස්කන්ධය** | 16 | 178,098,513 | 157,951,099 |
| **මුළු බැරකම් හා ස්කන්ධය** | | **178,498,270** | **158,255,287** |

මෙහි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ,

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**ජේ එම් එස් බී උඩුගම**
අතිරේක සාමාන්‍යාධිකාරී
(කාර්යයෙහි නියුතු)

- මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කර අත්සන් කරන ලදී.

**කේ එම් ඒ ගොඩවත්ත**
සභාපති/ප්‍රධාන විධායක නිළධාරී

| | 2013 | 2012 |
|---|---|---|
| | (රු. :000) | (රු. :000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් විකුණුම් ලදමනාව | 1,476,934 | 1,029,949 |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ පරිනතවීම් | 102,544,388 | 100,176,684 |
| මූල්‍ය උපකරණ පරිනත වීම් - ණය සහ ලැබිය යුතු ගිණුම් | 102,547 | 63,716 |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මිලදී ගැනීම් | (2,175,810) | (1,854,541) |
| පරිනත වීම තෙක් රඳවාගන්නා මූල්‍ය උපකරණ මිලදී ගැනීම් | (116,989,125) | (113,182,589) |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකරණ අත්පත් කරගැනීම සඳහා ණය ප්‍රදානය | (380,732) | (60,764) |
| පොළී ලැබීම් | 12,042,295 | 10,778,336 |
| ලාභාංශ ලැබීම් | 292,858 | 208,636 |
| අනෙකුත් අදායම් ලැබීම් | 261,640 | 239,975 |
| ගෙවන ලද මෙහෙයුම් වියදම් | (1,195,262) | (725,599) |
| ගෙවන ලද මූල්‍ය වියදම් | (2,420) | (2,485) |
| ගෙවන ලද සාමාජික වියදම් | (166,054) | (281,209) |
| ගෙවන ලද ආදායම් බදු | 345,729 | (1,414) |
| 5 වසර ශිෂ්‍යත්ව ගෙවීම් /ආපසු ලැබීම් | (129,808) | (118,332) |
| ගෙවන ලද සාමාජික වියදම් | (84,303) | (75,844) |
| ගෙවන ලද මෙහෙයුම් වියදම් | (15,720) | (3,096) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(4,072,842)** | **(3,808,577)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (14,284) | (52,274) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ලදමනාව | - | 2,920 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද / (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(14,284)** | **(49,354)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| දායක මුදල් ලැබීම් | 14,253,247 | 12,582,955 |
| ප්‍රතිලාභ ගෙවීම් | (9,570,013) | (8,565,217) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **4,683,233** | **4,017,738** |
| | | |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම** | 596,108 | 159,807 |
| 2013 ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමානයන් | 414,831 | 255,023 |
| **2013 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමානයන්** | **1,010,938** | **414,831** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | ලාභාංශ තුළන සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | දායක මුදල | පොළිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | |
| **2012 ජනවාරි 01 දිනට ශේෂය** | | | | 135,486,301 | 252,829 | 3,000,000 | 3,155,730 | 141,894,860 |
| පෙර වර්ෂ ගැලපුම් | (739) | (33) | (79) | (850) | | | | (850) |
| දායක මුදල් ලැබීම් | 12,745,270 | | | 12,745,270 | | | | 12,745,270 |
| දායක මුදල් ආපසු ගෙවීම්, පොළී සහ ලාභාංශ | (8,565,788) | | | (8,565,788) | | | | (8,565,788) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය/(වත්කම හානිකරණය) වර්ෂයේ ශුද්ධ ලාභය | | | | | 11,877,608 | | | 11,877,608 |
| පොළී සහ ලාභාංශ ලෙස සාමාජිකයන් සඳහා පැවරිය හැකි ශුද්ධ ලාභය | | 4,189,948 | 9,776,545 | 13,966,493 | | | | 13,966,493 |
| රඳවාගත් ලාභයෙන්/ලාභයට මාරුකිරීම් | | | | | 2,000,000 | (2,000,000) | | - |
| ලාභාංශ සහ පොළී | | | | | (13,966,493) | | | (13,966,493) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,178,743** | **4,189,915** | **9,776,466** | **153,631,426** | **163,943** | **1,000,000** | **3,155,730** | **157,951,099** |
| **2013 ජනවාරි 01 දිනට ශේෂය** | | | | 153,631,426 | 163,943 | 1,000,000 | 3,155,730 | 157,951,099 |
| පෙර වර්ෂ ගැලපුම් | | | | (50,731) | 454,624 | | | 403,894 |
| දායක මුදල් ලැබීම් | 14,404,117 | | | 14,404,117 | | | | 14,404,117 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (9,573,700) | | | (9,573,700) | | | | (9,573,700) |
| සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | | 4,752,333 | | 4,752,333 | (4,752,333) | | | - |
| ලාභාංශ 7.0% | | | 11,088,778 | 11,088,778 | (11,088,778) | | | - |
| රඳවාගත් ඉපයීම් ගිණුමෙන් මාරුකිරීම් | | | | | 343,000 | (343,000) | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 14,913,103 | | | 14,913,103 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,830,417** | **4,752,333** | **11,088,778** | **174,252,223** | **33,559** | **657,000** | **3,155,730** | **178,098,513** |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| 1 | **පොළී ආදායම** | | |
| | | | |
| 1.1 | **විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්** | | |
| | | | |
| | | | |
| 1.2 | **පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | |
| | ස්ථාවර තැන්පත් පොළී | 815,288 | 64,295 |
| | ණයකර පොළී | 126,968 | 123,354 |
| | භාණ්ඩාගාර බැඳුම්කර පොළී | 12,847,398 | 11,150,769 |
| | භාණ්ඩාගාර බිල්පත් ආන්තිකය | 799,227 | 793,230 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් පොළී | 102,635 | 101,319 |
| | මුදල් වෙළඳපොළ තැන්පත් පොළී | 1,696 | 1,425 |
| | ආයෝජන කළමනාකරණ ගිණුම් පොළී | 10,769 | - |
| | විදුලි බල ව්‍යාපෘති බැඳුම්කර පොළී | 401,235 | 400,102 |
| | වාණිජ පත්‍ර මත පොළී | 12,636 | 6,433 |
| | **උප එකතුව** | **15,117,852** | **12,640,927** |
| | | | |
| 1.3 | **ණය සහ ලැබියයුතු ගිණුම් මත මූල්‍ය ආයෝජන** | | |
| | රුපියල් ණය පොළී | 587,000 | 587,000 |
| | වියන නිවාස ණය පොළී | 87,249 | 86,790 |
| | ආපදා ණය පොළී | 501 | 477 |
| | වාහන ණය පොළී | 2,911 | 2,421 |
| | විශේෂ ආපදා ණය පොළී | 4,550 | 4,250 |
| | විශේෂ උත්සව අත්තිකාරම් පොළී | 136 | 132 |
| | පරිගණක ණය පොළී | 10 | 10 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළී | 3,540 | 2,780 |
| | ක්‍රීඩා සමිති ණය පොළී | 51 | 33 |
| | **උප එකතුව** | **685,949** | **683,893** |
| | | | |
| | **මුළු පොළී ආදායම** | **15,803,801** | **13,324,820** |
| | | | |
| 2 | **ලාභාංශ ආදායම** | | |
| | **විකිණීම සඳහා රඳවාගත් ආයෝජන** | | |
| | මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ | 284,610 | 187,059 |
| | මිල ප්‍රකාශිත ඒකක මත ලාභාංශ | 8,948 | 8,948 |
| | **විකිණීමට ඇති ආයෝජන** | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් මත ලාභාංශ | 25,103 | 12,694 |
| | **මුළු ලාභාංශ ආදායම** | **318,660** | **208,701** |

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| **3** | **ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ)** | | |
| | | | |
| | **ලාභාලාභ ගිණුම හරහා නිමිති කළ මූල්‍ය වත්කම්** | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | 171,962 | 124,368 |
| | ඒකක භාර මත සාධාරණ වටිනාකම ගැලපීම | 25,345 | 165,900 |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම | (129,129) | (594,646) |
| | **උප එකතුව** | **68,178** | **(304,378)** |
| | | | |
| **4** | **අනෙකුත් ආදායම්** | | |
| | දේපළ ආදායම් බදු කුලිය | 21,075 | 20,482 |
| | දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | 16 | 453 |
| | අධිභාර | 226,935 | 205,128 |
| | කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් ආදායම | 17,100 | 13,381 |
| | කාර්ය මණ්ඩල ණය අදායම | 18,393 | 18,463 |
| | අඩුවෙන්/වැඩියන් ගෙවන ලද ප්‍රතිලාභ ලියාහැරීම් | - | 1 |
| | විවිධ ආදායම් | 2,528 | 984 |
| | **මුළු අනෙකුත් ආදායම්** | **286,047** | **258,892** |
| | | | |
| **5.1** | **සේවක මණ්ඩල වියදම්** | | |
| | **කාර්ය මණ්ඩල පිරිවැය (අධ්‍යක්ෂ මණ්ඩල වියදම් අතුළු)** | | |
| | | | |
| **5.1.1** | **වැටුප් සහ වේතන** | | |
| | වැටුප් | 279,752 | 245,143 |
| | අධ්‍යක්ෂ ගාස්තු | 503 | 530 |
| | ජීවන වියදම් දීමනා | 70,345 | 62,209 |
| | අතිකාල | 18,000 | 16,986 |
| | නිවාඩු දින ගෙවීම් | 11,225 | 10,171 |
| | **උප එකතුව** | **379,824** | **335,039** |
| | | | |
| **5.1.2** | **කෙටිකාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ** | | |
| | බඳවා ගැනීම්, පුහුණු කිරීම් හා සංවර්ධන | 1,729 | 997 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | 19,122 | 16,848 |
| | දිරි දීමනා | 83,529 | 81,067 |
| | ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් | 11,659 | 9,045 |
| | ප්‍රසාද දීමනා | 58,848 | 48,728 |
| | වෛද්‍යාධාර වියදම් ප්‍රතිපූර්ණය | 49,043 | 36,952 |
| | කාර්ය මණ්ඩල ණය පිරිවැය | 18,393 | 18,463 |
| | නිවාස ණය පොළිය | 15,242 | 12,721 |
| | **උප එකතුව** | **257,565** | **224,821** |

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| **5.1.3** | **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්** | | |
| | පොළී පිරිවැය | 9,595 | 8,723 |
| | ප්‍රවර්තන සේවා පිරිවැය | 4,966 | 4,514 |
| | **උප එකතුව** | **14,561** | **13,237** |
| | | | |
| **5.1.4** | **අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ** | | |
| | සේ. අ. අ. මණ්ඩලීය දායකය | 54,990 | 48,198 |
| | සේ. න. භා. අ. මණ්ඩලීය දායකය | 10,998 | 9,639 |
| | **උප එකතුව** | **65,988** | **57,837** |
| | | | |
| **5.1.5** | **අනෙකුත් සේවක සුහසාධන වියදම්** | | |
| | උ. වි. ගෙ. බදු | 2,084 | 1,311 |
| | **උප එකතුව** | **2,084** | **1,311** |
| | | | |
| | **මුළු සේවක මණ්ඩල වියදම්** | **720,022** | **632,244** |
| | | | |
| | **ප්‍රධාන කළමනාකරණ පාර්ශව දීමනා** | | |
| | අධ්‍යක්ෂ දීමනා | 503 | 530 |
| | **උප එකතුව** | **503** | **530** |
| | | | |
| **5.2** | **පරිපාලන වියදම්** | | |
| | ගොඩනැගිලි කුලී | 34,773 | 32,391 |
| | වරිපනම් බදු | 541 | 1,428 |
| | විදුලිය ගාස්තු | 17,240 | 15,787 |
| | දුරකථන ගාස්තු | 7,321 | 6,502 |
| | ජල ගාස්තු | 1,603 | 1,557 |
| | උපදේශක ගාස්තු | 1,669 | 1,717 |
| | විගණන ගාස්තු | 467 | 800 |
| | ආරක්ෂක ගාස්තු | 6,357 | 4,356 |
| | නීති ගාස්තු | 1,470 | 907 |
| | ලේකම් ගාස්තු | 300 | 300 |
| | තැපැල් හා විදුලි පණිවුඩ - පරිපාලන | 2,327 | 2,144 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - පරිපාලන | 1,065 | 1,370 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ වියදම් - පරිපාලන | 1,641 | 1,108 |
| | මාධ්‍ය හා ප්‍රචාරණ | 286 | 162 |
| | තොරතුරු තාක්ෂණ වියදම් | 1,154 | 922 |
| | පුවත්පත් දැන්වීම් සහ වෙළඳ දැන්වීම් | 1,887 | 2,028 |
| | වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | 2,694 | 2,478 |
| | පුවත්පත් හා වාර සඟරා | 639 | 527 |
| | පරිත්‍යාග | 806 | 213 |
| | අනෙකුත් රක්ෂණ | 39 | 44 |
| | කාර්යාලීය නඩත්තු සහ අවශ්‍යතා | 679 | 505 |

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| | මුද්දර බදු | 2 | 1 |
| | විවිධ වියදම් | 1,917 | 1,877 |
| | වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 14,763 | 9,978 |
| | ඉන්ධන වියදම් | 15,253 | 14,376 |
| | ගොඩනැගිලි නඩත්තුව | 6,403 | 5,449 |
| | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තුව | 2,009 | 1,772 |
| | **උප එකතුව** | **125,307** | **110,702** |
| | | | |
| **5.3** | **මූල්‍ය වියදම්** | | |
| | ආයෝජන කළමනාකරණ ගාස්තු | 235 | 235 |
| | බැංකු ගාස්තු | 2,419 | 2,246 |
| | ලියා හරින ලද ප්‍රතිලාභ මුදාහැරීම් | 4 | 3 |
| | උප එකතුව | **2,657** | **2,485** |
| | | | |
| | **මුළු පරිපාලන වියදම්** | **847,986** | **745,431** |
| | | | |
| **5.4** | **සාමාජික වියදම්** | | |
| **5.4.1** | **සාමාජික ප්‍රතිලාභ** | | |
| | මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | 49,248 | 49,247 |
| | නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය | 5,823 | 5,681 |
| | අභ්‍යන්තර අක්ෂිකාච සැත්කම් යෝජනා ක්‍රමය | 4,958 | 3,928 |
| | ශ්‍රමසුව රැකවරණ යෝජනා ක්‍රමය | 20,099 | 20,760 |
| | හෘද සැත්කම් යෝජනා ක්‍රමය | 65,790 | 53,070 |
| | වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් යෝජනා ක්‍රමය | 2,105 | 1,120 |
| | 5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 82,830 | 74,925 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 17,604 | 23,604 |
| | **උප එකතුව** | **248,457** | **232,335** |
| | | | |
| **5.4.2** | **සාමාජික සේවා** | | |
| | තැපැල් හා විදුලි පණිවුඩ -සාමාජික | 21,095 | 19,508 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ - සාමාජික | 14,772 | 9,974 |
| | පරිගණක ලිපිද්‍රව්‍ය | 3,894 | 4,044 |
| | සේවකයින් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය | 394 | 235 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - සාමාජික | 5,277 | 5,105 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය - සාමාජික | 727 | 741 |
| | සාමාජිකයින් සඳහා වෛද්‍ය උපදේශන ගාස්තු | 22 | 21 |
| | 5 වසර ශිෂ්‍යත්ව පිරිනැමීමේ වියදම් | 1,579 | 851 |
| | දැයට කිරුළ ප්‍රදර්ශනය සහ සමාජීය ව්‍යාපෘති | 3,419 | 3,124 |
| | **උප එකතුව** | **51,178** | **43,602** |

| සටහන් | | 2013<br>(Rs:000) | 2012<br>(Rs:000) |
|---|---|---|---|
| **5.4.3** | **තොරතුරු තාක්ෂණික සේවා** | | |
| | දෘඩකාංග නඩත්තුව | 4,444 | 3,511 |
| | මෘදුකාංග නඩත්තුව | 308 | 317 |
| | ක්ෂයවීම් | 5,871 | 5,988 |
| | රක්ෂණය | 137 | 94 |
| | රැහැන් බදු කුලී | 3,976 | 4,061 |
| | **උප එකතුව** | **14,736** | **13,972** |
| | | | |
| | **මුළු සාමාජික වියදම්** | **314,372** | **289,908** |
| | | | |
| **6** | **ආදායම් බදු** | | |
| | ශුද්ධ බදු වියදම | 253,404 | 165,649 |
| | | **253,404** | **165,649** |

| | | | |
|---|---|---|---|
| **7** | **විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම්** | | |
| | මිල ප්‍රකාශිත කොටස් ආයෝජන | 7,281,440 | 8,134,627 |
| | අඩුකළා : මිල ප්‍රකාශිත කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | - | (1,506,639) |
| | මිල ප්‍රකාශිත ඒකක භාර | 268,989 | 243,644 |
| | | **7,550,428** | **6,871,632** |

| | | | |
|---|---|---|---|
| **8** | **විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන** | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් ආයෝජන | 485,835 | 485,835 |
| | පොරොන්දු නෝට්ටු | 12,174 | 12,174 |
| | ලැයිස්තුවෙන් ඉවත් කළ සහ ඈවරකරණයට | 29,294 | - |
| | අඩුකළා : කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | (29,294) | - |
| | පොරොන්දු නෝට්ටු හානිකරණය | (12,174) | (12,174) |
| | | **485,835** | **485,835** |

| | | | |
|---|---|---|---|
| **9** | **පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන** | | |
| | භාණ්ඩාගාර බැඳුම්කර | 137,547,313 | 120,946,400 |
| | භාණ්ඩාගාර බිල්පත් | 5,656,190 | 6,660,950 |
| | මිල ප්‍රකාශිත ණයකර | 584,277 | 165,202 |
| | අඩුකළා : මිල ප්‍රකාශිත ණයකර හානිකරණය | (7,450) | (7,450) |
| | ස්ථාවර තැන්පත් | 5,350,200 | 2,550,200 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | 720,146 | 1,327,091 |
| | මිල ප්‍රකාශිත නොවූ ණයකර | 295,000 | 675,000 |
| | වාණිජ පත්‍ර | - | 98,295 |
| | බැඳුම්කර - විදුලිබල යෝජනා ක්‍රමය | 2,992,000 | 2,992,000 |
| | | **153,137,676** | **135,407,687** |

| | | | |
|---|---|---|---|
| **10** | **ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම්** | | |
| | රුපියල් ණය | 6,100,000 | 6,100,000 |
| | නිවාස මූල්‍යණය - ජාතික සංවර්ධන බැංකුම | 790,494 | 770,881 |
| | **කාර්ය මණ්ඩල ණය** | | |
| | ආපදා ණය | 14,835 | 14,738 |
| | විශේෂ ආපදා ණය | 161,774 | 111,431 |
| | උත්සව අත්තිකාරම් | 950 | 934 |
| | විශේෂ උත්සව අත්තිකාරම් | 925 | 882 |
| | විශේෂ අත්තිකාරම් | 3,653 | 3,621 |
| | වාහන ණය | 117,880 | 63,377 |
| | පරිගණක ණය | 118 | 259 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළී | 227,986 | 168,564 |
| | සුනාමි සහන ණය | - | 2 |
| | | **7,418,615** | **7,234,690** |

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| **11** | **අනෙකුත් වත්කම්** | | |
| | **උපචිත ආදායම්** | | |
| | ලැබිය යුතු පොළී | 4,076,110 | 3,242,466 |
| | අඩුකළා : අඩමාන ආදායම් සඳහා ප්‍රතිපාදන | (27,866) | (27,866) |
| | | **4,048,245** | **3,214,600** |
| | **ලැබිය යුතු ගිණුම් සහ පූර්ව ගෙවීම්** | | |
| | ලැබිය යුතු දායක මුදල් | 1,271,061 | 1,118,137 |
| | මුදල් ඇණවුම් පාළක ගිණුම | 3,647 | 3,786 |
| | තැපැල් මුද්‍රා යන්ත්‍ර අග්‍රිමය | 226 | 167 |
| | විවිධ ණයගැතියෝ | 8,509 | 2,133 |
| | හිටපු සේවකයින්ගෙන් අයවිය යුතු මුදල් | 610 | 1,580 |
| | ආරක්ෂිත තැන්පතු | 2,983 | 2,972 |
| | පූර්ව ගෙවීම් | 13,550 | 11,889 |
| | කාර්ය මණ්ඩල ණය පෙරගෙවුම් පිරිවැය | 96,076 | 61,297 |
| | අත්තිකාරම් ගෙවීම් | 3,683 | 489 |
| | සමර්විල් සහ සමාගම - තැන්පතු | 21,900 | 21,900 |
| | වෛද්‍යාධාර අත්තිකාරම් | 30 | 15 |
| | ක්‍රීඩා සමාජය | 2,502 | 1,800 |
| | | **1,424,777** | **1,226,165** |
| | **අයකරගත යුතු බදු** | | |
| | ආදායම් බදු අත්තිකාරම් | 1,408 | 3,952 |
| | | **1,408** | **3,952** |
| | | | |
| | **ලිපිද්‍රව්‍ය තොග ඇතුළු අනෙකුත් දෑ** | | |
| | ලිපිද්‍රව්‍ය තොග සහ මුද්‍රණ ද්‍රව්‍ය | 4,541 | 6,938 |
| | | 4,541 | 6,938 |
| | | **5,478,971** | **4,451,654** |

## 12.1 දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | සවිකිරීම් සහ වැද්දුම් | පරිගණක උපකරණ | තලීබඩු සහ අනෙකුත් උපකරණ | පරිගණක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| **2012 ජනවාරි 01 දිනට ශේෂය** | 28,357 | 123,701 | 15,810 | 127,186 | 50,387 | 3,232,004 | 345,441 |
| එකතු කිරීම් | 19,330 | 19,430 | - | 6,449 | 7,064 | - | 52,273 |
| අපහරණයන් | - | (6,564) | - | - | (613) | - | (7,177) |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - | - |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **47,687** | **136,567** | **15,810** | **133,635** | **56,838** | **3,232,004** | **390,537** |
| | | | | | | | |
| **2013 ජනවාරි 01 දිනට ශේෂය** | 47,687 | 136,567 | 15,810 | 133,635 | 56,838 | 3,232,004 | 390,537 |
| එකතු කිරීම් | 3,629 | - | - | 9,603 | 6,158 | - | 19,390 |
| අපහරණයන් | - | - | - | - | (185) | - | (185) |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **51,316** | **136,567** | **15,810** | **143,238** | **62,811** | **3,232** | **409,742** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | සවිකිරීම් සහ වැද්දුම් | පරිගණක | පරිගණක උපකරණ | ලීබඩු සහ අනෙකුත් උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | - | 68,339 | 15,182 | 68,247 | 28,700 | 2,229,713 | 180,468 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 15,345 | 181 | 7,200 | 3,855 | 284,821 | 26,581 |
| අපහරණයන් | - | (4,242) | - | - | (510) | | (4,752) |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 79,442 | 15,363 | 75,447 | 32,045 | **2,514,534** | **202,297** |
| | | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | - | 79,442 | 15,363 | 75,447 | 32,045 | 2,514,534 | 202,297 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 12,720 | 128 | 7,135 | 4,546 | 284,821 | 24,529 |
| අපහරණයන් | - | - | - | - | (150) | | (150) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **-** | **92,162** | **15,491** | **82,582** | **36,441** | **2,799,355** | **226,676** |
| | | | | | | | |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | **28,357** | **55,362** | **628** | **58,939** | **21,687** | **3,232,004** | **164,973** |
| | | | | | | | |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **47,687** | **57,125** | **447** | **58,188** | **24,793** | **3,232,004** | **188,240** |
| | | | | | | | |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **51,317** | **44,405** | **319** | **60,657** | **26,369** | **(2,796,123)** | **183,067** |

| සටහන් | | 2013 (Rs:000) | 2012 (Rs:000) |
|---|---|---|---|
| **12.2** | **අස්පෘශ්‍ය වත්කම්** | | |
| | කාලච්ඡේදය ආරම්භයට | 559 | 1,002 |
| | ක්‍රමක්ෂය | (45) | (285) |
| | කාලච්ඡේදය අවසානයට | **514** | **717** |
| | | | |
| **13** | **ආයෝජන දේපළ** | | |
| | කාලච්ඡේදය ආරම්භයට | 3,200,000 | 3,200,000 |
| | සාධාරණ වටිනාකමේ වෙනස්වීම් | - | - |
| | කාලච්ඡේදය අවසානයට | **3,200,000** | **3,200,000** |
| | | | |
| **14** | **අනෙකුත් බැරකම්** | | |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | 96,727 | 90,119 |
| | ගෙවිය යුතු ගිණුම් සහ විවිධ ණයහිමියෝ | | |
| | ප්‍රතිලාභ ආපසු ගෙවීම් මත රඳවා ගත් බදු | 6,336 | 3,751 |
| | ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | 523 | 451 |
| | නොගෙවූ වේතන | 22 | 22 |
| | වැටුප් ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | 87 | 73 |
| | අධිකාරී - සේවක අර්ථසාධක අරමුදල | 10,510 | 9,009 |
| | විවිධ ණයහිමියෝ | 56,028 | 22,217 |
| | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ ආපසු ගෙවීම් | 5,183 | 5,150 |
| | නොගෙවූ මරණ ප්‍රතිලාභ | 8,598 | 7,574 |
| | සේවානියුක්තයන්ගේ භාර අරමුදල | 1,262 | 1,081 |
| | උ. වි. ගෙ. බදු | 1,432 | 771 |
| | එකතුකළ අගය මත බදු | 229 | 209 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 38 | 35 |
| | ඉල්ලුම් නොකළ ශිෂ්‍යත්ව අරමුදල් | 2,320 | 2,367 |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | 13,969 | 13,905 |
| | වැටුප් පාලන | 339 | - |
| | වැටුප් අවකරණ නිෂ්කාශන | 89 | 161 |
| | | | |
| | **බැංකු අයිරාව** | | |
| | මහජන බැංකුව - ජ/ගි 149 | 32,226 | - |
| | | **235,917** | **156,894** |
| | | | |
| **14.1** | **නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | |
| | ජනවාරි 01 දිනට ආරම්භක නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | 90,119 | 79,297 |
| | පොලී පිරිවැය | 9,595 | 8,723 |
| | ප්‍රවර්ථන සේවා පිරිවැය | 4,966 | 4,514 |
| | ප්‍රතිලාභ ගෙවීම් | (7,953) | (3,690) |
| | බැඳියාව මත ආයුගණන (ලාභ) / අලාභ | - | 1,276 |
| | **දෙසැම්බර් 31 දිනට අවසාන නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | **96,727** | **90,119** |

| සටහන් | | 2013<br>(Rs:000) | 2012<br>(Rs:000) |
|---|---|---|---|
| **15** | **ප්‍රතිපාදන** | | |
| | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,500 | 2,350 |
| | දුරකථන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 159 | 46 |
| | ජල ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1 | - |
| | සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන | 2,000 | 2,000 |
| | ප්‍රසාද දීමනා ප්‍රතිපාදන | 19 | 5 |
| | ලබා නොගත් නිවාඩු ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 10,068 | 7,847 |
| | තැපැල් ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,662 | 1,164 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 25,968 | 24,084 |
| | 5 වසර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 105 | - |
| | | **41,482** | **37,497** |
| | | | |
| **16** | **ස්කන්ධය සහ සංචිත** | | |
| | ඉ/ගෙ. රඳවාගත් ලාභ | 163,943 | 252,829 |
| | ප්‍රවර්ථන කාලච්ඡේදයේ රඳවාගත් ලාභ | 14,913,103 | 11,877,608 |
| | පෙර වර්ෂ ගැලපුම් | 454,624 | - |
| | ලාභාංශ තුළන සංචිත අරමුදලින් මාරුකරීම් | 343,000 | 2,000,000 |
| | **බෙදා හැරීම සඳහා වූ ලාභය** | **15,874,670** | **14,130,436** |
| | | | |
| | **අඩුකළා :** සාමාජික අරමුදල සඳහා පොළී 3% | 4,752,333 | 4,189,948 |
| | ලාභාංශ 7% | 11,088,778 | 9,776,545 |
| | **ප/ගෙ. රඳවාගත් ලාභ** | **33,559** | **163,943** |
| | | | |
| | ජනවාරි 01 දිනට සාමාජික අරමුදල | 153,631,426 | 135,486,301 |
| | අඩුකළා : පසුගිය වර්ෂය සඳහා ගෙවූ දායක මුදල් සහ පොළී | (50,731) | (850) |
| | | 153,580,695 | 135,485,450 |
| | | | |
| | වර්ෂය තුළ ලද ශුද්ධ දායක මුදල් | 4,830,417 | 4,179,482 |
| | | | |
| | **එකතුකළා :** සාමාජික අරමුදල සඳහා පොළී 3% | 4,752,333 | 4,189,948 |
| | ලාභාංශ 7% | 11,088,778 | 9,776,545 |
| | **දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදල** | **174,252,223** | **153,631,426** |
| | | | |
| | **සංචිත** | | |
| | ලාභාංශ තුළන සංචිත අරමුදල | 657,000 | 1,000,000 |
| | ප්‍රත්‍යාගණන සංචිතය | 3,155,730 | 3,155,730 |
| | **ස්කන්ධය සහ සංචිත** | **178,098,513** | **157,951,099** |

# 1. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

## 1.1 සාංගමික තොරතුරු

### 1.1.1 නෛතික සහ ලියාපදිංචි ආකෘතිය

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොළඹ පිහිටි රාජ්‍ය සංස්ථාවකි. කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදුව, 1997 දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට අනුයුක්ත කරන ලදී.

### 1.1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියළුම රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයින් මෙම මණ්ඩලයේ සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි සේවා යෝජකයින් එකී සේවකයින්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් මෙම අරමුදලට ප්‍රේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුදලේ පාලනයට අමතරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සාමාජිකයන් වෙනුවෙන් සාමාජීය හා සුභසාධන ප්‍රතිලාභයන් ලබා දීමේ කාර්යයන්හි ද නිරතව සිටී.

### 1.1.3 නිකුත් කිරීම සඳහා අනුමැතිය සහ දිනය

2014 පෙබරවාරි 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී

## 1.2 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ වටිනාකමට අගය කරන ලද ඇතැම් වත්කම් හා බැරකම් හැර මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය පදනමට පිළියෙල කරන ලදී. වෙනත් අයුරකින් දක්වා නොමැති නම් සියළුම අගයයන් ආසන්න රුපියලට වටයන ලදී.

## 1.3 අනුකූලතා ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර පිළියෙල කර තිබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කොට ඇත.

## 1.4 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩව මණ්ඩලය පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳව මණ්ඩලීය කළමණාකාරිත්වය තක්සේරු කර ඇති අතර, සැලකියයුතු අනාගත කාලච්ඡේදයක් දක්වා මණ්ඩලය පවත්වා ගත හැකි සම්පත් මණ්ඩලය සතුව ඇත. එතෙකුදු වුවත් සැලකිය යුතු ඇතැම් අවිනිවිශ්චිතතාවයන් අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඇතිවේයයි මණ්ඩලය නොදනී. එබැවින්, මූල්‍ය ප්‍රකාශනයන් අඛණ්ඩ පැවැත්ම මත පිහිටා පිළියෙල කර ඇත.

## 1.5 ආදායම

මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකවම මිණුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන උපමානයන් ද සපුරාලිය යුතුය.

### 1.5.1 පොළී සහ සමාන ආදායම් සහ වියදම්

සියළුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. පොලිය දරණ මූල්‍ය වත්කම්, ලාභා ලාභ ගිණුම හරහා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස සාධාරණ වටිනාකමට වර්ගීකරණය කෙරෙන අතර පොළී ආදායම හෝ වියදම, සපල පොළී අනුපාත භාවිතයෙන් වාර්තාකරනු ලැබේ. සපල පොළී අනුපාතිකය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්වල ඇස්තමේන්තුකළ අපේක්ෂිත ජීවකාලය හෝ කෙටි කාලය හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකමවේ. මූල්‍ය උපකරණයන්හි සියළුම ගිවිසුම්ගත කරුණු ගණනය කිරීම සඳහා සළකා බැලෙන අතර අනාගත ණය අලාභයන් හැර අනෙකුත් ගාස්තු, වර්ධක පිරිවැය සහ සෘජුවම ආරෝපනය කළ හැකි පිරිවැය උපකරණයෙහි අන්තර්ගත සපල පොළී අනුපාතයෙහි කොටසක් වේ. හානිකරණ අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක වාර්තාකරණ ලද වටිනාකමක් අඩුකරනු ලබන විට හානිකරණ අලාභය මිනුම්කරණ කටයුතු සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිතා කළ මුල් පොළී අනුපාතයට අනුව පොළී ආදායම අඛණ්ඩව හඳුනාගනු ලැබේ.

### 1.5.2 ලාභාංශ ආදායම්

ලාභාංශ ආදායම මණ්ඩලය වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනා ගනු ලැබේ.

### 1.5.3 අනෙකුත් ආදායම්

සමුච්චිත වටිනාකමට හඳුනාගනු ලබන සේවකයින්ගේ සේවා කාලය පදනම්ව ක්‍රමක්ෂය කරනු ලබන සේවක ණය මත

ලැබෙන පොලී ආදායම හැර අනෙකුත් ආදායම් මණ්ඩලය වෙත ලැබීමේ අයිතිය තහවුරුවූ විට හඳුනාගනු ලැබේ.

### 1.5.4 ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැලපීම

වැඩි කාලච්ඡේද ප්‍රමාණයක් සඳහාවූ වර්තමාන සංසන්දනාත්මක තොරතුරු අතීතයට බලපාන ලෙස ගැලපීම ප්‍රායෝගික නොවන බැවින් වැරදි නිවැරදි නොකරන ලදී. මණ්ඩලය විසින් ප්‍රවර්තන කාලච්ඡේදය සඳහා වූ වත්කම්, බැරකම් සහ ස්කන්ධයන්හි ආරම්භක ශේෂයන් එම වැරදි නිවැරදි කිරීමෙන් අනතුරුව යළි දක්වා ඇත.

### 1.6 ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ව්‍යවහාරික මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. සියළු මූල්‍ය විස්තර ශ්‍රී ලංකා රුපියල් මඟින් ඉදිරිපත් කර ඇත.

### 1.7 මූල්‍ය සාධන පත්‍ර ආරම්භක හඳුනා ගැනීම සහ පසුකාලීන මිනුම්කරණය

හඳුනාගැනීමේ දිනය මූල්‍ය වත්කම් සහ වගකීම් වෙළඳ දිනයේදී හඳුනාගනු ලැබේ. එනම් එම සාධන පත්‍රයන්ගේ ගිවිසුම් ප්‍රතිපාදනයන්හි පාර්ශවකරුවන් වශයෙන් මණ්ඩලය පත්වූ දිනයයි. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණනු ලබන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මඟින් හෝ වෙළඳපොළෙහි පවත්නා සම්ප්‍රදාය මඟින් නියමිත  කාල රාමුව තුළදී භාරදිය යුතුව මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ හෝ මූල්‍ය වත්කම් වන්නේය.

මූල්‍ය සාධන පත්‍ර ආරම්භක මිනුම්කරණය මූල්‍ය සාධන පත්‍ර ආරම්භයේදී හඳුනාග ැනීම සහ වර්ගීකරණය එහි සේවා සහ ලක්ෂණ මෙන්ම කළමනාකාරිත්වයේ අධිෂ්ඨානය මත රඳා පවතී. සියළු මූල්‍ය සාධන පත්‍ර ආරම්භයේදී සාධාරණ වටිනාකමට එකතුවූ අත්පත් කර ගැනීමේ පිරිවැයද ඇතුලත්ව මිණුම්කරණය කරනු ලබන අතර මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට වාර්තා කරනු ලැබේ.

#### විකිණීම පිණිස රඳවා ගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම්

විකිණීම පිණිස රඳවා ගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සාධාරණ වටිනාකමට සටහන් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ. පොළී සහ ලාභාංශ ආදායම් හෝ වියදම් ගිවිසුමේ වගන්ති ප්‍රකාර ආදායම් ප්‍රකාශනයේ වාර්තා කිරීම හෝ ගෙවීම් සඳහා අයිතිය ප්‍රතිෂ්ඨාපනය වූ පසු සටහන් කරනු ලැබේ. මෙම වර්ගීකරණයෙහි ඇතුලත් ස්කන්ධ මූලිකවම නුදුරු කාලච්ඡේදයක විකිණීම හෝ යළි මිලදී ගැනීමේ පරමාර්ථයෙන් අත්පත් කරගත් ඒවා වේ.

#### ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නම්කරන ලද මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම්

පළමු හඳුනාගැනීම තුළින් කළමනාකාරිත්වය විසින් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් මේ වර්ගීකරණය යටතේ දැක්වේ. කළමනාකාරීත්වය විසින් පහත සඳහන් නිර්ණායකයන් සපුරාලීම අනුව ලාභ හෝ අලාභ හෝ වශයෙන් නම් කිරීම සිදු කරනු ලබන අතර මෙම නම් කිරීම උපකරණයෙන් උපකරණයට පදන්ම මත තීරණය කරනු ලැබේ.

- වත්කම් හෝ බැරකම් හෝ ඒ මත රැඳි ලාභ හෝ අලාභ වෙනස් පදනම් මත මිණුම්කරණයේදී මතුවන නොගැලපෙන ප්‍රතිකර්මයන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමක් හෝ සැළකියයුතු ලෙස අඩුකිරීමක් මෙමගින් සිදුකෙරේ.
- ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන උපායමාර්ගයන් අනුව සාධාරණ වටිනාකම් පදනම මත කාර්යක්ෂමතාව අගය කරනු ලබන මෙම වත්කම් සහ බැරකම්, මූල්‍ය වත්කම් සහ බැරකම් සමූහයක හෝ දෙවර්ගයේම කොටසකි.

ලාභා ලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ගලපන මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට වාර්තා කෙරේ. ලාභා ලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ගලපන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් වල ශුද්ධ ලාභ හා අලාභ අතර වෙනස සාධාරණ වටිනාකමට වාර්තා කරනු ලැබේ. පිළිවෙලින් පොළී ඉපැයුම් සහ දරණ ලද පොළී "පොළී ආදායම්" සහ "පොළී වියදම්" ලෙස සපල පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලබන අතර, ලාභාංශ ආදායම, ලැබීමේ අයිතිය තහවුරුවූ පසු "ලාභාංශ ආදායම" යටතේ වාර්තා කරනු ලැබේ.

#### විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන්ට ණය සුරැකුම්පත් අන්තර්ගත වේ. මෙම වර්ගීකරණයට අදාළ ණය සුරැකුම්පත් අවිනිශ්චිත කාලච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අපේක්ෂිත වූ සහ වෙළඳපොළ තත්ත්වයන්හි වෙනස්කම් සහ ද්‍රවශීලතා අවශ්‍යතාවන් මත විකිණීමට ඇති ආයෝජනයන් වේ.

විකිණීම සඳහා ඇති මුල්‍ය ආයෝජන පළමුවර මිනුම්කරණයෙන් පසුකාලීනව සාධාරණ වටිනාකමට මිනුම්කරණය කරනු ලැබේ. උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සෘජුවම ස්කන්ධයන්හි "අලෙවිය සඳහා ඇති සංචිත" (අනෙකුත් විස්තීර්ණ ආදායම්) ලෙස හඳුනා ගනු ලැබේ. ආයෝජන අපහරණයෙන් ස්කන්ධයන්හි කලින් හඳුනා ගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ "අනෙකුත් ආදායම්" ලෙස හඳුනා ගනු ලැබේ. විකිණීම සඳහා රඳවා තිබූ මුල්‍ය ආයෝජනයන්ගෙන් ඉපැයූ පොළී ආදායම් සපල පොළී අනුපාතය භාවිතයෙන් පොළී ආදායම් ලෙස වාර්තා කරනු ලැබේ. විකිණීම සඳහා රඳවා තිබූ මුල්‍ය ආයෝජනයන් සඳහා වූ ලාභාංශ ආදායම් ලැබීමේ අයිතිය තහවුරු වූ පසු "අනෙකුත් ආදායම්" යටතේ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. එවැනි ආයෝජන හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයෙහි "මුල්‍ය ආයෝජනයන්ගේ හානිකරණ අලාභ" ලෙස හඳුනා ගන්නා අතර " විකිණීම සඳහා ඇති සංචිතයන්ගෙන්" ඉවත් කරනු ලැබේ.

**පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන**

පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන ව්‍යුත්පන්න නොවන ස්ථාවර සහ තීරණාත්මක ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් හේතුවෙන් මණ්ඩලයට ධනාත්මක අභිප්‍රායයක් සහ කල්පිරීම තෙක් රඳවා ගැනීමට ඇති හේතුවෙන් කල්පිරීම තෙක් රඳවාගත් ආයෝජන වශයෙන් සැළකිය හැකිය. පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන ආරම්භක මිනුම්කරණයෙන් අනතුරුවවූ හානිකරණ අලාභ හැර සපල පොළී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. සපල පොළී අනුපාතයේ සංකලිත කොටස් වන වට්ටම් හෝ අත්පත් කර ගැනීමේ අධිමිල හා ගාස්තු සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ ක්‍රමක්ෂය "පොළී ආදායම්" ලෙස ඇතුලත් කරන අතර එම වත්කම් හානිකරණයෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශනයේ සටහන් තුළ හඳුනාගනු ලැබේ.

**ණය හා ලැබිය යුතු ගිණුම්**

ණය හා ලැබිය යුතු ගිණුම් ව්‍යුත්පන්න නොවන ස්ථාවර සහ තීරණාත්මක ගෙවීම් සහිත සක්‍රීය වෙළඳපොළෙහි මිල ප්‍රකාශිත නොවූ මුල්‍ය වත්කම් වේ. ආරම්භක මිනුම්කරණයෙන් අනතුරුවවූ හානිකරණ අලාභ හැර සපල පොළී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. සපල පොළී අනුපාතයේ සංකලිත කොටස් වන වට්ටම් හෝ අත්පත් කර ගැනීමේ අධිමිල හා ගාස්තු සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ සපල පොළී අනුපාත ක්‍රමක්ෂය "පොළී ආදායම්" ලෙස ඇතුලත් කරන අතර එම වත්කම් හානිකරණයෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් වියදම් ලෙස හඳුනාගනු ලැබේ. සාධාරණ වටිනාකම් අලාභය සේවක පිරිවැයක් ලෙස සේවකයින්ගේ සේවා කාලච්ඡේදය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

**ප්‍රති මිලදීගැණුම් සහ ප්‍රතිවර්ථන මිලදීගැණුම් ගිවිසුම්**

ප්‍රති මිලදීගැනුම් ගිවිසුම්වල ආයෝජනය එහි ඇති ස්ථාවර හෝ තීරණාත්මක ගෙවීම් හා ස්ථාවර කල්පිරීම් සහිත බැවින්ද, කල්පිරීම තෙක් රඳවා ගැනීමේ ධනාත්මක හැකියාවක් සහ අභිප්‍රායක් මණ්ඩලය සතු බැවින්ද, ආයෝජනය කල්පිරෙන තෙක් රඳවා ගැනීමට තීරණය කර ඇත. ආරම්භයේදී අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එයද ඇතුළුව සාධාරණ වටිනාකමට මිණුම්කරණය කර ඇති අතර පසුකාලීනව සපල පොළී අනුපාතිකය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කර ඇත.

**මුල්‍ය වත්කම් හානිකරණය**

කිසියම් මුල්‍ය වත්කමක් හෝ මුල්‍ය වත්කම් සමූහයක් හෝ හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි සේනිභාඅ මණ්ඩලය සෑම මුල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ. මුල්‍ය වත්කමක් හෝ මුල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇතැයි සාධාරණ සාක්ෂි ඇත්නම් පමණක් සහ සිදුවීම් එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවී ඇත්නම් (දරා ඇති අලාභ සිද්ධිය) සහ එම සිද්ධිය (හෝ සිද්ධි) එම මුල්‍ය වත්කමේ හෝ මුල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ට කිසියම් බලපෑමක් සිදුව ඇතැයි විශ්වසනීයව ඇස්තමේන්තු කළ හැකි විය යුතුය.

**ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්**

මණ්ඩලය ප්‍රථමයෙන් තනිව හා තනිව වැදගත් හා සාමුහිකව නොවැදගත් මුල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලබයි. එසේ තනිව තක්සේරු කරන ලද මුල්‍ය වත්තමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යයි මණ්ඩලය තීරණය කරන්නේ නම් එම මුල්‍ය වත්කමට සමාන ණය අවදානමක් ඇති මුල්‍ය වත්කම් සමූහයකට ඇතුලත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමුහිකව තක්සේරු කරනු ලැබේ. හානිකරණ අලාභ සඳහා තනිව තක්සේරු කරන ලද වත්කම මත හානිකරණ අලාභ පවතී නම් හෝ වී බව

අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුලත් කරනු නොලැබේ.

වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එහි අලාභය ලෙස මිනුම්කරණය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනසය. වත්කමෙහි ධාරණ අගය දීමනා ගිණුමක් මඟින් අඩුකරන අතර අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාග නු ලැබේ. අඩුකරන ලද ධාරණ අගයට පොළී ආදායම අඛණ්ඩව උපචිත කරන්නේ නම් සහ අනාගත පොළී මුදල් ප්‍රමාණයන් වට්ටම් කිරීම සඳහා යොදාගත් පොළී ප්‍රතිශතයන් හානිකරණ අලාභ මිනුම්කරණය සඳහාද යොදාගනු ලැබේ.

පොළී ආදායම " පොළී ආදායමේ " කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේදී අයකර ගැනීමේ හැකියාවක් නොමැති ණය හා සම්බන්ධිත දීමනාවන් ලියා හරිනු ලැබේ. පසු වර්ෂයකදී හානිකරණ අලාභයේ අගය වැඩිවන්නේ නම් හෝ අඩුවන්නේ නම් හෝ හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිද්ධියකට අදාළ කර ගත හැකි නම්, කළින් හඳුනාගත් හානිකරණ අලාභය දීමනා තුළින් අඩු හෝ වැඩි කිරීම මඟින් ගලපනු ලැබේ.

ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ සපල පොළී අනුපාතය මඟින් වට්ටම් කරනු ලැබේ. ණය සඳහා විචල්‍ය පොළී අනුපාතයක් පවතින්නේ නම්, කිසියම් හානිකරණ අලාභයක් මිනුම්කරණය සඳහා වට්ටම් අනුපාතය ලෙස ප්‍රවර්තන සපල පොළී අනුපාතය යොදා ගත යුතුවේ. ව්‍යවසාය වෙළඳ වත්කම්, ණය හෝ අත්තිකාරම් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම්, හානිකරණ අලාභය නව සපල පොළී අනුපාතය මත ප්‍රතිවර්ගීකරණ දිනයේදී නිර්ණය කරනු ලැබේ.

**විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්දැයි ව්‍යවසාය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලැබේ.

ණය උපකරණයක් විකිණීමට ඇති ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, එකී නිර්ණායකය පදනම් කොට ගෙන මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කර ඇති හෙයින්, ව්‍යවසාය තනිව එම ණය උපකරණ හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලබයි. කෙසේ වුවද හානිකරණය වශයෙන් වාර්තා කරන ලද මුදල, ආදායම් ප්‍රකාශනයේ කළින් හඳුනාගත් ආයෝජන මත හානිකරණ අලාභය හැර ක්‍රමක්ෂය පිරිවැය හා වර්තමාන සාධාරණ වටිනාකම අතර වෙනසෙහි මිනුම්කරණය කරන ලද සමුච්චිත අලාභය වේ. අනාගත පොළී ආදායමට අඩුකරන ලද ධාරණ වටිනාකම පදනම වන අතර, හානිකරණ අලාභය මිනුම්කරණය සඳහා භාවිතාකරන අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලැබේ. පොළී ආදායම "පොළී ආදායමේ" කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. පසු කාලීන කාලච්ඡේදයකදී ණය උපකරණයක සාධාරණ වටිනාකම වැඩි වන්නේ නම් සහ හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවන ණය සිද්ධියට සෘජුවම අදාළ වන්නේ නම්, හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කෙරේ.

ස්කන්ධ ආයෝජනයක් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩු බවට "වැදගත්" සහ "දිගු කාලීන" පරිහානියක් ඇති බවට සාධාරණ සාක්ෂි ඇතුලත් වේ. හානිකරණය සඳහා සාක්ෂි ඇති විටෙක, සමුච්චිත අලාභය අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ප්‍රවර්තන සාධාරණ අගයෙහි වෙනස සමුච්චිත අලාභය ලෙස මිනුම්කරණය කෙරේ. එම ආයෝජනයෙහි හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇත්නම්, ස්කන්ධයෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ස්කන්ධ ආයෝජනයන්හි හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිවර්තනය නොකෙරෙන අතර, හානිකරණයෙන් පසුව ධාරණ වටිනාකමෙහි වැඩිවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

### 1.8 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගනු ලැබේ. මිලදී ගැනීමේ පිරිවැය, සෘජුවම ආරෝපනය කළ හැකි පිරිවැය සහ අනාගතයේදී නොවැලැක්විය හැකි ඉවත් කිරීමේ හෝ කොටස් වෙන් කිරීමේ පිරිවැය, පිරිවැයෙහි අන්තර්ගත වේ. අදාළ බැරකම ප්‍රතිපාදන තුළින් හඳුනාගනු ලැබේ. පළමු තත්ත්වයේ කාර්යක්ෂමතාවයෙන් අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවෙන් දේපළ, පිරියත හා උපකරණ නඩත්තුව හෝ අළුත් වැඩියාව සඳහාවූ පිරිවැය එය දරණ අවස්ථාවේදී වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

සින්නක්කර ඉඩම් (ආයෝජන දේපළ) හැර, ක්ෂය ප්‍රතිපාදනය හීනවන ශේෂ ක්‍රමය අනුව ගණනය කෙරේ. උපකරණ ක්ෂයවීම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය තුළ සුන්බුන් වටිනාකම අඩුකළ ධාරණ වටිනාකමට ප්‍රතිපාදනය කෙරේ. වත්කම්වල ඇස්තමේන්තුකළ ප්‍රයෝජනවත් ජීවකාලය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පරිගණක උපකරණ | - | 20% |
| අනෙකුත් උපකරණ | - | 20% |
| ලී බඩු | - | 15% |
| මෝටර් වාහන | - | 25% |
| සවිකිරීම් වැද්දුම් | - | 33.33% |

වත්කම් භාවිතය සඳහා යෙදවූ දිනයේදී ක්ෂයවීම් ආරම්භ වේ.

**ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ**

අපේක්ෂිත භාවිතය සඳහා මෙතෙක් සූදානම් නොවූ අනුරාධපුරයෙහි ඉදිකෙරෙන කාර්යාල පරිශ්‍රයෙහි සහ නිවාඩු නිකේතනයෙහි ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ තුළින් නියෝජනය වේ.

**1.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට ලක්වීමේ සළකුණු දක්වන්නේදැයි යන්න මණ්ඩලය විසින් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සළකුණක් දක්වන්නේ නම් හෝ වත්කමෙහි හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වන්නේ නම් හෝ මණ්ඩලය විසින් වත්කමෙහි අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සළකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියාහරිනු ලැබේ.

භාවිත වටිනාකම ගණනයේදී ඇස්තමේන්තුකළ අනාගත මුදල් ප්‍රවාහයන් ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිඹිබු වන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් අඩුකළ විකුණුම් පිරිවැය තීරණය කළ යුත්තේ නිවැරදි ආගණන ආකෘතිය අනුවය. මෙම ආගණනයන්, විවිධ වටිනාකම්, ප්‍රසිද්ධ වෙළඳ සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා අනෙකුත් සාධාරණ අගය මිණුම් සාධක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභයන් තවදුරටත් පවතින්නේ ද නැතහොත් අඩිකව ඇත්ද යන්න පිළිබඳව කත්සේරුවක් සෑම වාර්තාකරණ දිනයකදීම සිදුකරනු ලැබේ. එවැනි සළකුණක් දක්වන්නේ නම්, මණ්ඩලය වත්කමෙහි හෝ මුල්‍ය උත්පාදන ඒකකයෙහි අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් හානිකරණ අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේදී වත්කමෙහි අයකරගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන්හි වෙනසක් පවතින්නේ නම් පමණක්, පූර්වයෙහි හඳුනාගන්නා ලද අලාභය අවලංගු කරනු ලැබේ. වත්කමෙහි අයකරගත හැකි වටිනාකම එහි ධාරණ වටිනාකම නොඉක්මවන්නේ නම් හෝ තීරණය කරන ලද ධාරණ අගය ඉක්මවන්නේ නම් හෝ ක්ෂය අඩුකළ වටිනාකමට පූර්ව වර්ෂයන් සඳහා හානිකරණ අලාභ හඳුනාගෙන නොමැති නම් මෙම අවලංගු කිරීම සීමිත වේ. මෙවැනි අවලංගු කිරීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

**1.10 ආයෝජන දේපළ**

අත්පත් කර ගැනීමේ පිරිවැය ඇතුළු ගත් මිලට ආයෝජන දේපළ මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව වාර්තාකරණ  දිනයේදී වෙළඳපොළ තත්ත්වයන් දක්වන සාධාරණ වටිනාකමට ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපළෙහි සාධාරණ වටිනාකම නිසා උද්ගත වන ලාභ හෝ අලාභ ඒවා උද්ගත වූ කාලච්ඡේදයේ ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගත කෙරේ.

මණ්ඩලයේ ආයෝජන දේපළ සෑම වසර 3 කට වරක්ම විවෘත වෙළඳපොළ වටිනාකමට ප්‍රත්‍යගණනය කරනු ලබන අතර, ධාරණ වටිනාකමෙහි සිදුවන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

ලැබිය යුතු කුලී කල්බදු කාලච්ඡේදය තුළ සරලමාර්ග පදනම යටතේ බෙදා හරිනු ලැබේ. කුලී නිවැසියාට කුලී රහිත කාලසීමාවක් වැනි දිරිගැන්වීමක් ලබා දෙන්නේ නම් මෙම පදනම යටතේ හඳුනාගනු ලබන කුලී ආදායමක් හේතුවෙන් වාර්තාවන වෙනත් වත්කමක වටිනාකම ආයෝජන වත්කමෙහි ධාරණ වටිනාකමෙන් අඩුකරනු ලැබේ.

## 1.11 අස්පෘෂ්‍ය වත්කම්

### 1.11.1 බාහිරව අත්පත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්පත් කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භයේදී හඳුනාගත් පිරිවැයට මිනුම්කරණය කෙරේ. ආරම්භක හඳුනාග ැනීමට අනුකූලව අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට ධාරණය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය නිශ්චිත හෝ අවිනිශ්චිත ලෙස තක්සේරු කරනු ලැබේ.

නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ආර්ථික ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. කිසියම් සළකුණක් දක්වන්නේ නම් අස්පෘෂ්‍ය වත්කම් හානිකරණය කරනු ලැබේ. එක් එක් වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදී නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලය හෝ වත්කමට අනුබද්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන රටාවේ වෙනස්කම් අදාළ පරිදි ක්‍රමක්ෂය කාලච්ඡේදය හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙන්, එම වෙනස්කම් ගිණුම් ඇස්තමේන්තු වෙනස්කම් සේ සළකනු ලැබේ. නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ වියදම් වර්ග යටතේ, අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වය සාපේක්ෂව හඳුනාගනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගත වන ලාභ හෝ අලාභ වත්කමෙහි ධාරණ අගය සහ ශුද්ධ උපලබ්ධි ලැබීම් අතර වෙනස සේ මිනුම්කරණය කරනු ලබන අතර, වත්කම හඳුනා නොගැනීමෙන් පසුව ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**පරිගණක මෘදුකාංග පැකේජයන්**

පරිගණක මෘදුකාංග පැකේජයන් අත්පත් කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ වියදම අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනාගන්නා අතර වසර 03 ක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 1.12 කල්බදු දේපළ

### 1.12.1 මෙහෙයුම් කල්බදු

අයිතියට අදාළ අවදානම සහ ප්‍රතිඵලය අවස්ථානුකූලව මණ්ඩලය වෙත මාරු නොකරන අවස්ථාවන්හිදී (මෙහෙයුම් කල්බදු), ගෙවිය යුතු මුළු කල්බදු කුලී ප්‍රමාණය සරළ මාර්ග ක්‍රමයට කල්බදු කාලය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ.

## 1.13 තොග

යල් පැනගිය සහ සෙමින් චලනය වන අයිතමයන්ට අදාළ දීමනා අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩාත් අඩු අගයට තොග ආගණනය කෙරේ.

## 1.14 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

### 1.14.1 නිශ්චිත දායක යෝජනා ක්‍රම

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයිනට, සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකම ලැබේ. මණ්ඩලය විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ.

### 1.14.2 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම- පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ - අනුව වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම සේවකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය කර ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව කාර්ය මණ්ඩලය වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණක් බැරකම උද්ගත වේ. මෙම බැරකම බාහිරව මූල්‍යනය නොකෙරේ. නිශ්චිත දායක යෝජනා ක්‍රමය හැරුණු විට නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, පශ්චාත් රැකියා ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම යෝජනා ක්‍රම මත ව්‍යවසායයේ ශුද්ධ බැඳියාව, ප්‍රවර්තන සහ පූර්ව කාලච්ඡේදයන් සඳහා සේවකයන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු මත ගණනය කරනු ලබන අතර, එම ප්‍රතිලාභය වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා වට්ටම් කරනු ලැබේ. හඳුනා නොගත් පූර්ව සේවා පිරිවැයක් ඇත්නම් අඩු කරනු ලැබේ.

වාර්තා කරනු ලබන දිනට පැවැති උසස් තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කරයන්ගේ ඵලදා ප්‍රතිශතය වට්ටම් අනුපාතය වේ. පරිනත දිනයන් සහිත ව්‍යවසායයේ බැඳියාව සාමාන්‍ය කරන ප්‍රතිලාභ ගෙවීමට අපේක්ෂිත විනිමය අනුපාතිකය අදාළ කෙරේ. වාර්ෂිකව සුදුසුකම් ලත් ආයුගණක වරයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගි කර ගනිමින් ගණනය කරනු ලැබේ.

සැලසුමක ඇති ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමෙන්, සේවකයන්ගේ පසුගිය සේවා කාලයට අදාළ කොටස වැඩිවන අතර ප්‍රතිලාභ අත්පත් කර ගන්නා තෙක් කාලච්ඡේදය පුරා ලාභාලාභ ගිණුම තුළින් සරළ මාර්ග ක්‍රමයට හඳුනා ගැනේ. ප්‍රතිලාභ අත්පත් කරගත් සැනෙකින් එම ප්‍රමාණයට වූ වියදම ලාභාලාභ ගිණුම තුළින් හඳුනාගනු ලැබේ. ව්‍යවසාය, නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් මත උද්ගතවන සියළුම ආයුගණන ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලැබේ.

විශ්‍රාම පාරිතෝෂික බැඳියාව තීරණය කිරීමේදී භාවිතාකරණ ප්‍රධාන උපකල්පනයන් මෙසේය :

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 11% |
| වැටුප් වර්ධක අනුපාතය | 2% |
| විශ්‍රාම ගන්නා වයස | අවුරුදු 60 |

**1.15 බදුකරණය**

**1.15.1 ප්‍රවර්තන බදු**

වාර්තාකරණ දිනට පවතින බදු ප්‍රතිශතය හෝ ස්වාධීනව ක්‍රියාත්මක වන බදු ප්‍රතිශතය මත වර්ෂයේ බදු ගෙවිය යුතු ලාභය හෝ අලාභය මත ගෙවිය යුතු බදු හෝ ලැබිය යුතු බදු සහ ගෙවිය යුතු ගැලපීම් මත බදු, ප්‍රවර්තන බද්ද වේ.

**1.16 ස්කන්ධය**

**1.16.1 සාමාජික අරමුදල**

වර්ෂය තුළ ආපසු ගෙවන ලද ප්‍රතිලාභ අඩුකළ පසු සාමාජිකයන්ගෙන් ලද දායක මුදල් හා ලැබිය යුතු දායක මුදල් සහ ඒ මත උපචිත කරන ලද පොළී සහ ලාභාංශ වලින් සාමාජික අරමුදල සමන්විත වේ.

**1.16.2 ලාභාංශ**

ලාභාංශ ආදායම අරමුදල වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**1.17 ප්‍රතිපාදන**

අවිනිශ්චිත කාල සහ සංඛ්‍යාවන් සහිත බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනාගෙන තිබේ. වාර්තාකරණ දිනට බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වියදම පිළිබඳව හොඳම තක්සේරුව මත ප්‍රතිපාදනය ගිණුම්කරණය කරන අතර, බැරකමට බලපාන වර්තමාන වෙළෙඳපොළ තක්සේරු මුදලේ කාල වටිනාකම සහ විශේෂිත අවදානම් හුවා දැක්වෙන බදු පූර්ව අනුපාතය මත වට්ටමක් ද ලැබේ.

## 2. තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු සහ විනිශ්චයන්

අනාගතය පිළිබඳව මණ්ඩලය ඇතැම් ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකසනු ලැබේ. ඇස්තමේන්තු සහ විනිශ්චයන් ඓතිහාසික පළපුරුද්ද සහ වෙනත් කරුණු පදනම් කොට ගෙන අඛණ්ඩව අගයනු ලබන අතර අවස්ථානුකූලව සාධාරණ යයි විශ්වාස කළ හැකි අනාගත සිද්ධි ද ඇතුළුව අනාගතයේදී සත්‍ය සිදුවීම් මත මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන් වෙනස් විය හැක. ඉදිරි මූල්‍ය වසර තුළ මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේත් වත්කම් සහ බැරකම් වල ධාරණ වටිනාකමේ කළ හැකි ප්‍රමාණාත්මක සහ වැදගත් අවදානම පිළිබඳව පහත සාකච්ඡා කර ඇත.

**ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

**(අ) ආයෝජන දේපළ අගයනය**

ව්‍යවසාය එහි ආයෝජන දේපළ බාහිර තක්සේරුකරුවකු ලවා එකී ආයෝජනයේ සාධාරණ වටිනාකම ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම අගයනය අනාගත කුලී ආදායම, පුරෝකථන නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන පිරිවැය සහ අදාළ වට්ටම් අනුපාත යන උපකල්පනයන් මත පදනම් වේ. මෙම තක්සේරුකරු මේ හා සමාන දේපළ වල ගණුදෙනු වටිනාකම පිළිබඳ වෙළෙඳපොළ සාක්ෂි කෙරෙහිද යොමුවේ.

**(ආ) මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම**

මණ්ඩලය වටිනාකම් ඇගයීමේ තාක්ෂණ ක්‍රම යොදාගැනීමෙන් මිල ප්‍රකාශිත නොවූ ආයෝජනයන්ගේ සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාත සහ අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ ඇස්තමේන්තු ඇතුළුව භාවිතාකරන ලද උපකල්පනයන් එකී තාක්ෂණ ක්‍රමයන් මත සැළකිය යුතු අන්දමින් ගලපා ඇත. මේ අයුරින් සාදාගන්නා ලද සාධාරණ

වටිනාකමේ ඇස්තමේන්තු ස්වාධීන වෙළෙඳපොළ හා සැමවිටම සංසන්දනය කළ නොහැකි අතර බෙහෝ අයිතමයන් සඳහා ක්ෂණිකව උපලබ්ධි කිරීමේ හැකියාවක් නැත.

**(ඇ) දේපළ, පිරියත සහ උපකරණයන්ට අදාළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය**

ඇස්තමේන්තුකළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලවන්නේද සහ අදාළවන්නේද යන්න ව්‍යවසාය වාර්ෂිකව පරීක්ෂාකරනු ලැබේ.

## 3. මූල්‍ය උපකරණ අවදානම් කළමනාකරණය

**අවදානම් කළමනාකරණ ව්‍යුහය**
සියළුම ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි නීති, රීති, රෙගුලාසි, නිත්‍ය උපදෙස්, සහ අනුමත කළ ප්‍රතිපත්ති අනුකූලව කටයුතු කිරීමට මණ්ඩලයට අනුකූලතා කාර්ය භාරයක් පවතී.

අනෙකුත් සියළු ව්‍යාපාරයන්ට අනුකූලව, මූල්‍ය උපකරණ භාවිතයේදී මතුවන අවදානම මණ්ඩලයට තිබේ. එම අරමුණු, ප්‍රතිපත්ති සහ සැළසුම් සහ එකී අවදානම් කළමනාකරණය කිරීමට සහ ඒවා මිණුම්කරණය කිරීමට භාවිතා කරන ක්‍රම පිළිබඳව මෙම සටහනෙහි විස්තර කෙරේ. මෙම අවදානම පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු වැඩිදුරටත් මෙම මූල්‍ය ප්‍රකාශනයන් තුළින් ඉදිරිපත් කෙරේ. මූල්‍ය උපකරණ අවදානම සම්බන්ධව මණ්ඩලයේ ස්වාධීන වෙනසක් නිරාවරණය නොවන අතර එහි අරමුණු, ප්‍රතිපත්ති සහ එකී අවදානම් කළමනාකරණය හෝ ඒවා මිණුම්කරණයේදී භාවිත ක්‍රම පූර්ව කාලච්ඡේදයන් සඳහා විස්තර සටහන්වල නොදැක්වේ නම් පූර්ව ක්‍රමයන් අනුගමනය කර ඇත.

### 3.1 ණය අවදානම

මණ්ඩලයේ පාරිභෝගිකයන් හෝ සමානයන් ඔවුන්ගේ ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අසමත් වීම හේතුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවන අලාභය ණය අවදානම ලෙස සැළකේ. පෞද්ගලික පාර්ශවකරුවන් භාරගැනීමට කැමති අවදානම් ණය සීමා නියම කිරීමෙන් සහ එම සීමාවන්ට අදාළ නිරාවරණයන් අධීක්ෂණය මගින් මණ්ඩලය විසින් ණය අවදානම පාලනය සහ කළමනාකරණය කරයි.

### 3.2 හානිකරණ තක්සේරුව

හානිකරණය වූ වත්කම් මත අලාභය හඳුනාගැනීම සඳහා මණ්ඩලය දරණ ලද අලාභ ආකෘතිය මණ්ඩලය විසින් මිණුම්කරණය සඳහා උපයෝගි කර ගනී. එහි අර්ථය වන්නේ නිරීක්ෂණය වූ විශේෂිත අලාභ සිද්ධියකට අදාළව සාධාරණ සාක්ෂි මත හඳුනාගැනීමයි. ඉලක්කගත සිද්ධීන්ට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- පාරිභෝගිකයාගේ වැදගත් මූල්‍ය අවශ්‍යතා
- ගෙවීම් පැහැර හැරීම් වැනි ගිවිසුම් උල්ලංඝණය කිරීම්
- පාරිභෝගිකයාගේ ගෙවීම් සඳහා වූ මූල්‍ය අපහසුතා මත මණ්ඩලය පාරිභෝගිකයා වෙත සහන සැලසීම
- බොහෝ විට පාරිභෝගිකයා බුන්වත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට පත්වීම.
- ඇස්තමේන්තුකළ ණය මත අනාගත මූල්‍ය ප්‍රවාහයන් අඩුවීමේ දත්ත නිරීක්ෂණය වීම.



# විගණකාධිපති වාර්තාව

සහ මණ්ඩලයේ පැහැදිලි කිරීම්

2013

පීඒ/ඩී/පීටීඑෆ්/එෆ්ඒ/13 2015 ජූලි 15

**සභාපති,**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1:3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේග මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්ල වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබදව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තියෙන් විගණකාධිපති වෙත බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 ප්‍රකාර සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයන් අවසානයේදී මූල්‍ය වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක් හානිකරණය වූවාද යන්නට කිසියම් විෂය මූලික කරුණු තිබේදැයි තක්සේරු කිරීමක් කල යුතුව තිබුණු අතරම, එක් එක් ආයෝජනය පිළිබදව අවධානම් තක්සේරුවක්ද කල යුතුව තිබුණි. නමුදු ඊට පටහැනිව කොටස් වෙළඳපොළ මිල පහළ වැටීම පදනම් කරගෙන කොටස් වෙළඳපොලේ ආයෝජන වලින් 2013 ජනවාරි 01 දිනට රු1,506,639,000 ක් හා 2013 දෙසැම්බර් 31 වන දිනට රු129,129,000 ක්ද වශයෙන් එකතුව රු1,635,768,000 ක් මිලදී ගත් කොටස්හි පිරිවැයට එරෙහිව කපාහැර තිබුණි. එමෙන්ම කොටස් මිල කපාහැරීමේදී 2002 වර්ෂයේසිට පවතින මණ්ඩලයේ ආයෝජන කළඹ නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව ලාභාලාභ මඟින් සාධාරණ අගයට යන වර්ගීකරණය යටතේ දක්වා තිබුණි.

(ආ) මණ්ඩලයේ පිරිවැය රු183,067,000 ක් වූ ස්ථාවර වත්කම් තුල වර්ෂ 25 ක පමණ කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය වෙමින් පවතින, තවදුරටත් ප්‍රයෝජනය ගනුලබන වත්කම් පැවතියද එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 හි 34 වන වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාර මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය හා කළමනාකරණයට අදාල සම්බන්ධිත පාර්ශව පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය විසින් සාමාජිකයන් වෙත ලබාදෙන ලද අනිවාර්ය සියයට 3 පොළිය හැර ප්‍රකාශිත වාර්ෂික ප්‍රතිලාභ ප්‍රතිශතය 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සියයට 7 ක් ලෙස නොවෙනස්ව පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ලාභාංශ ප්‍රතිලාභ ප්‍රකාශ කිරීම සඳහා ප්‍රමාණවත් වාර්ෂික මෙහෙයුම් අතිරික්තයක් මණ්ඩලය සතුව නොතිබූ බැවින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පිළිවෙලින් රු මිලියන 746 ක්, රු මිලියන 2,089 ක් හා රු මිලියන 446 ක් ඉකුත් වර්ෂ වලදී ලාභාංශ සමකිරීමේ සංචිතයෙන් හා රඳවාගත් ලාභ වලින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. ඊට අමතරව 2.2.6 ඡේදයේ දැක්වෙන ප්‍රකාර රු මිලියන 2,596 ක්වූ උපලබ්ධි නොවූ ලාභ සමාලෝචිත වර්ෂයේදී ලාභාංශ ගෙවීම සඳහා උපයෝගී කරගෙන තිබුණි. මෙකී තත්ත්වය මත මෙම අරමුදල ක්‍රමානුකූලව පිරිහීමක් සිදුවන බව පෙනී යයි.

#### 2.2.3 සාමාජික ගිණුම් වලට බැර නොවූ දයක මුදල්

දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදල් ගිණුමේ ශේෂය රු මිලියන 174,252 ක් බව මූල්‍ය ප්‍රකාශන වලින් හෙලිදරව් කර තිබුණද, එදිනට තථ්‍ය වශයෙන්ම සාමාජික ගිණුම් වලට බැරවී තිබුණු මුදල රු. මිලියන 151,948 ක් විය. මෙදිනට අරමුදලට ලැබී තිබුණු, එහෙත් 2014 ජූනි 17 දින වන විටත් සාමාජික ගිණුම් වලට බැර කර නොතිබුණු මුදල රු. මිලියන 22,304 ක් විය. මෙම මුදලින් රු. මිලියන 9,496 ක් පසුගිය වර්ෂ 33 ක පමණ කාලයක සිට ලැබී තිබුණු නමුදු, 2014 ජූනි 17 දින වනවිටත් සාමාජික ගිණුම් වලට බැරකර නොතිබුණු සාමාජික දයක මුදල් විය. ඉතිරි රු. මිලියන 12,808 ක් වූ මුදල ඉහත කී ලැබූ දයක මුදලට අදාලව කලින් කලට සාමාජික ගිණුම් වලට බැරවිය යුතුව තිබුණු පොළී මුදල විය. 2014 දෙසැම්බර් 31 දින වන විටත් සාමාජික ගිණුම් වලට බැර කල නොතිබුණු මෙම මුදල් පිළිබඳව කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත.

| ලැබී තිබුණු සාමාජික ගිණුම් වලට බැර නොකල ශේෂයේ වයස් විශ්ලේෂණය | මෙතෙක් ගිණුම්ගත නොකෙරුණු දායක මුදල රු මිලියන |
|---|---:|
| වර්ෂ 1 සිට 5 දක්වා | 7,553 |
| වර්ෂ 5 සිට 10 දක්වා | 814 |
| වර්ෂ 10 සිට 15 දක්වා | 425 |
| වර්ෂ 15 සිට 20 දක්වා | 231 |
| වර්ෂ 20 සිට 25 දක්වා | 215 |
| වර්ෂ 20 සිට 25 දක්වා | 258 |
| **එකතුව** | **9,496** |

ඉකුත් වර්ෂයේ සාමාජික ගිණුම් වලට බැරනොවූ ශේෂය රු මිලියන 4,100 ක් වූ අතර එය සාමාලෝචිත වසරේදී රු මිලියන 9,496 ක් දක්වා වැඩිවී තිබිමෙන් වාර්ෂිකව සාමාජික අරමුදල් ගිණුමට දායක මුදල් ලෙස ලැබෙන එහෙත්, සාමාජික අරමුදල් ගිණුම් වලට බැරනොවන ප්‍රමාණයන් වර්ෂයෙන් වර්ෂය ඉහළ යන බවත් දක්නට ලැබුණ ද එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් සැලැකිල්ලක් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 2.2.4 ගිණුම්කරන අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) අරමුදල් පනත ප්‍රකාර මුළු ආයෝජන ඉපැයීම් වලින් වාර්ෂිකව සියයට 3 කට නොඅඩු පොළියක් අරමුදලේ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැරකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු 4,752,333,000 ක්වූ සියයට 03 ක පොළී මුදල මෙහෙයුම් වියදමක් ලෙස ගිණුම් ගත නොකිරීම හේතුවෙන් සාමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු 4,752,333,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රාග්ධන ලාභ ලෙස විස්තීර්ණ අදයම් ප්‍රකාශයට බැරකර තිබුණු රු171,962,000 ක් වු මුදල 2013 ජනවාරි 01 දිනට පිරිවැයට අදාලව ගණන් බලන ලද ලාභයක් නොවන බැවින් සාමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදයම් සාවද්‍ය වී තිබුණි.

(ඇ) ඈවරකරණයට ලක්වී තිබුණු සාමාගම් 02 ක හා නිල ලැයිස්තුවෙන් ඉවත්කර තිබුණු සමාග මක කොටස් 803,270 ක ආයෝජනය කර තිබුණු රු.29,293,854 ක් ගිණුම් වලින් කපාහැරීමට අනුමැතියක් නොගෙන ඊට අදල ප්‍රතිපාදනයට හිලව් කර තිබීම නිසා එම ආයෝජනය ශේෂ පත්‍රයේ මූල්‍ය වත්කම් වලින් නිරූපනය වී නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදල වූ බදු ආපසු ලැබිම්, බදු අධිප්‍රතිපාදන සහ සාමාජික ගිණුම් ගැලපීම් රු 454,624,000 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සාමාලෝචිත වර්ෂයේ ආදයම් ලෙස සලකා තිබුණි.

### 2:2:5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1980 සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ ආයෝජනයෙන් ලබාගත් ලාභ වලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතු විය. එසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණු රු137,546,313,369 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු තථ්‍ය පොළී ආදයම වූ රු10,251,865,269 ක් සමාලෝචිත වර්ෂයේ සාමාජික ලාභාංශ ගෙවීම සඳහා උපයෝගී කරගැනීම වෙනුවට පනතේ විධිවිධාන වලට පටහැනිව රු12,847,398,332 ක් වූ සඵල පොලිය යොදා ගැනීමෙන් රු2,595,533,063 ක උපලබ්ධි නොවූ ලාභයක් සාමාජික ලාභාංශ ගෙවීම සඳහා උපයෝගි කරගෙන තිබුණු බව අනාවරණය විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

**පහත දැක්වෙන විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

(අ) 2013 ජනවාරි මස 01 දිනට අරමුදල් මණ්ඩලය කොටස් වෙළඳපොළේ කොටස් 109,134,215 ක කරන ලද රු8,085,181,220 ක ආයෝජනය සඳහා කොටස් පිරිවැයට අදලව සකස් කරන ලද වාර්තා

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රු409,742,000 ක ස්ථාවර වත්කම් භෞතිකව සනාථ කෙරෙන භාණ්ඩ සමීක්ෂණ වාර්තා

(ඇ) මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශණය මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්වී නොතිබුණි. කෙසේ නමුදු රු1,635,768,000 ක් වූ ආයෝජන පොත් වලින් කපා හැරීම හා අලාභයට කොටස් විකිණීමට අදාල අමාත්‍යවරයාගේ එකඟතාවය සමඟ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(a) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පැවත එන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු8,597,637 ක් 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු13,969,151 ක් ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු5,182,506 ක් හා තැපැල් දෙපාර්ත්මේන්තුවෙන් මුදල් ඇණවුම් වලින් ලැබුණු දයක මුදල් රු3,647,232 ක් ද වශයෙන් එකතුව රු31,396,526 ක් වූ සාමාජික මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**2:4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ හා ලිපි<br>i) 2013 පෙබරවාරි 05 දිනැති අංක ඩීඑම්එස්/සී2/2/42 දරණ ලිපියේ 02 ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත බඳවාගැනීම් හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල නව වැටුප් තල 2013 මැයි 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණි. |
| | ii) 2012 ජුලි 12 දිනැති අංක ඩීඑම්එස්/සී2/2/42 දරණ ලිපියේ 06 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුර අහෝසි කර තිබුණු නමුත් ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොන්ත්‍රාත් පදනම මත යොදවා සිටි අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කොන්ත්‍රාත් කාලය අදල පාර්ශවයන්ගෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව 2012 ඔක්තෝම්බර් සිට නැවත දීර්ඝ කර තිබුණි. |
| | iii) 2013 දෙසැම්බර් 09 දිනැති අංක 2013/01 (1) දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.3 වගන්ති | චක්‍රලේඛයට පටහැනිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදි මණ්ඩලයේ සේවකයන් වෙත රු58,847,962 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා පොදු ව්‍යාපාර පිළිබඳ රැස්වීම් සටහන්<br>i. 1998 මාර්තු 18 දිනැති අංක 130 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය, 1997 නොවැම්බර් 19 දිනැති අංක 26/47 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2011 ඔක්තෝම්බර් 18 දිනැති අංක 56 දරණ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් සටහනේ 19 වන ඡේදය | සේවක ණය පොළී අනුපාතය වන සියයට 4.2 මත සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සඳහා ණය ලබානොදිය යුතු බව සඳහන් කර තිබුණද මණ්ඩලය ඊට පටහැනි ලෙස කටයුතු කරමින් ඉහත පොළී අනුපාතයට හා ඊට අඩු පොළී අනුපාත යටතේ සේවක ණය ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට එම පොළී අනුපාතයන් මත ලබා දුන් රු523,400,978 ක ණය මුදලක් අයවිය යුතුව තිබුණි.<br>මෙම ගෙවීම් අත්හිටවීමෙන් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට මුහුණ දීමට සිදුවිය හැකි අපහසුතාවය සලකා මේ සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව 2014 නොවැම්බර් 10 දිනැති ලිපියකින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් දන්වා ඇති බව සභාපතිවරයා මාවෙත දන්වා තිබුණි. |
| | ii) 2003 ජුනි 06 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදළ රු2,083,969 ක් වූ උපයන විට ගෙවීම් බදු මුදල් නිලධාරීන්ගේ පෞද්ගලික ඉපැයීම් වලින් අය නොකර මණ්ඩලයේ අරමුදලින් දේශීය ආදයම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| | iii) 2007 ඔක්තෝම්බර් 02 දිනැති අංක පීඊඩී 45 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ කළමනාකරණයේ වගකීම සඳහන් වගන්තිය මූල්‍ය ප්‍රකාශනවලට දක්වා නොතිබුණි. |

| | |
|---|---|
| iv) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2011 ඔක්තෝම්බර් 18 දින පැවති අංක 56 දරණ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් සටහනේ 16 වන ඡේදය | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝගයට පටහැනිව හා මහා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.83,529,063 ක් සේවක දිරිගැන්වීමේ දීමනා ලෙස ගෙවා තිබුණි.<br><br>මෙම ගෙවීම් අත්හිටුවීමෙන් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට මුහුණ දීමට සිදුවිය හැකි අපහසුතාවය සලකා මේ සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව 2014 නොවැම්බර් 10 දිනැති ලිපියකින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් දන්වා ඇති බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි. |
| (ඈ) 1963 දෙසැම්බර් 12 දිනැති අංක 1024/600/29 සීඩී දරණ භාණ්ඩාගර චක්‍රලේඛය | 1999 සිට ක්‍රියාත්මක මණ්ඩලයේ මූල්‍ය කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු මිලියන 15,368 ක අතිරික්තයක් වූ අතරල ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු මිලියන 12,148 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු මිලියන 3,220 ක් වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ නමුත් මෙම වාර්තාවේ හා 2.2.4 (අ) හා 225 හි දැක්වෙන කරුණු වර්ෂයේ අතිරික්තයට ගලපන ලද්දේ නම් රු මිලියන 15,368 ක් වූ අතිරික්තය රු මිලියන 7,348 කින් හෙවත් සියයට 48 කින් අඩුවිය හැකිව තිබිණි.

### 3:2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂ 06 ක් තුළ මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකම එම හිමිකම් වලට අයත් මුළු දායක මුදල් හා සමුච්චිත පොළී ලෙස බෙදී ගිය ආකාරය පහත වගුවෙන් දැක්වේ.

| වර්ෂය | මුළු දායක මුදල | සමුච්චිත පොළිය | දෙසැම්බර් 31 දිනට සාමාජිකයන්ගේ හිමිකම |
|---|---|---|---|
| | රු මිලියන | රු මිලියන | රු මිලියන |
| 2008 | 44,301 | 44,568 | 88,869 |
| 2009 | 49,834 | 53,223 | 103,057 |
| 2010 | 56,616 | 63,236 | 119,852 |
| 2011 | 64,054 | 71,432 | 135,486 |
| 2012 | 72,773 | 80,858 | 153,631 |
| 2013 | 82,653 | 91,599 | 174,252 |

ඉහත තොරතුරු අනුව 2013 වර්ෂය වනවිට මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකමින් සියයට 47 ක් දායක මුදලින්ද, සියයට 53 ක් සමුච්චිත පොළියෙන්ද සමන්විත වී තිබුණි. එය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී සාමාජිකයන්ගේ මුළු හිමිකම් සියයට 13.42 කින් වර්ධනය වී තිබුණු අතර, එකී වර්ෂයේදී මුළු දායක මුදලද සියයට 12.54 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය අවසානයේ දී මණ්ඩලයේ කාර්ය සාධන තත්වය පහත පරිදි වේ.

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාරිත්වයට අදාලවූ සංඛ්‍යා | එහි ප්‍රතිශතයන් % |
|---|---|---|---|
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය | 3,661,132 | 2,200,000 | 60.09% |
| සේවා යෝජකයින් | 252,540 | 72,145 | 28.57% |
| අරමුදලේ සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 10.0 | 2.2 | 22% |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013**

2013 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2013 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ස්වයං රැකියාලාභින් 2,710,596 ක් වාර්තා වුවද ඔවුන් අරමුදලේ සාමාජිකයන් ලෙස බඳවාගෙන සහන සැලසීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලයෙන් සැකසී නොතිබුණ.

(ආ) පසුගිය වර්ෂ 6ක කාල සීමාව තුලදී මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙලට අදල තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | අරමුදලට දායකවූ ක්‍රියාකාරි සාමාජික සංඛ්‍යාව | සිසු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලැබූ සාමාජික සංඛ්‍යාව | 5 වසර ශිෂ්‍යත්ව පිරිවැය රු | උසස් පෙළ ශිෂ්‍යත්ව පිරිවැය රු | මුළු ශිෂ්‍යත්ව පිරිවැය රු |
|---|---|---|---|---|---|
| 2008 | 2,100,000 | 2,497 | 26,084,760 | - | 26,084,760 |
| 2009 | 2,100,000 | 3,000 | 46,811,006 | - | 46,811,006 |
| 2010 | 2,100,000 | 3,000 | 45,385,680 | - | 45,385,680 |
| 2011 | 2,100,000 | 6,669 | 74,051,599 | 23,640,000 | 97,691,599 |
| 2012 | 2,200,000 | 6,962 | 75,775,685 | 23,604,000 | 99,379,685 |
| 2013 | 2,200,000 | 6,982 | 84,124,844 | 17,888,234 | 102,013,078 |
| | 2,200,000 | 29,110 | 352,233,574 | 65,132,234 | 417,365,808 |

පසුගිය වර්ෂ 6 ක කාලසීමාව තුලදී 2,200,000 ක් වූ සමස්ථ සාමාජිකයන් සතු අරමුදලින් 29,110 ක් වූ සීමිත පිරිසකට පමණ ශිෂ්‍යත්ව ප්‍රදානය කර තිබුණි අධ්‍යාපන කටයුතු කර ගෙන යෑමට හැකියාවක් නොමැති අරමුදලේ සාමාජිකත්වය දරණ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමට හා ඔවුන් දැනුවත් කිරීමට විධිමත් වූ වැඩපිළිවෙලක් ඇති කිරීම සඳහා මණ්ඩලයේ අවධානය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් යොමුකර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයට අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුළු සාමාජික සංඛ්‍යාව සක්‍රීය ගිණුම් හා සේවා යෝජක සංඛ්‍යාව යනාදී ක්‍රියකාරී සංඛ්‍යා දත්ත සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියකාරී දත්ත සමඟ සසඳා පහත දක්වා ඇත.

| විස්තරය | සේවක අර්ථසාධක අරමුදල අනුව | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අනුව | වෙනස්වීමේ ප්‍රතිශතයන් % |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව | 14,987,000 | 10,000,000 | 67 |
| වර්තමානයේදී දයක මුදල් එවනු ලබන සක්‍රීය ගිණුම් සංඛ්‍යාව | 2,350,000 | 2,200,000 | 94 |
| සේවායෝජකයින් සංඛ්‍යාව | 70,392 | 72,145 | 102 |
| 2013 ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය පොළිය සමඟ සියයට | 11.0 | 10.0 | 91 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013**

මණ්ඩලයට නව සාමාජිකයන් බඳවා ගැනීමේදි සේවක අර්ථසාධක අරමුදලට වඩා වැඩි දායකත්වයක් ලබාගත යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලය එම ඉලක්ක කරා ලඟා වී නොතිබුණි.

**4.2 ආයෝජන හා ආයෝජන ආදායම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම් 02 කින් වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු රු27,497,905 ක් වූ ණයකර පොළී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලයට ලැබී නොතිබුණි.

(ආ) සමාගම් 04 ක ලැයිස්තුගත ණයකර වල 2006 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු රු7,450,259 ක් 2007 දෙසැම්බර් 09 දින උපලබ්ධි විය යුතු වුවත්, එම ණයකර සඳහා 2013 දෙසැම්බර් 31 දින වනවිටත් ආපසු මුදල් ලැබී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සමාගම් 06 ක කොටස් පිරිවැයට වඩා අඩු මිලකට විකිණීමෙන් රු22,334,639 ක් අලාභ වී තිබුණි.

(ඈ) පරිගණක සමාගමක කොටස් 188,800 ක් මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් රු2,076,800 ක් ආයෝජනය කර තිබුණු අතර, එම සමාගමේ ද්‍රවශීලතාවය දිගින් දිගටම පහළ වැටීම 2012/13 ගිණුම් වර්ෂයේදී රු මිලියන 478 ක් අලාභයක් ලබා තිබීම යන හේතූන් මත අදළ සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව එම සමාගමේ විගණකයින් විසින් මත පලකර තිබුණෙන් ඊට ආයෝජනය කල මුදල් ආපසු ලබා ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(ඉ) 2011, 2012 හා 2013 වර්ෂයන්හී දී කොටස් වෙළඳපොළේ කරන ලද ආයෝජනය, ආයෝජනයට ලද ආදායම හා ආදායමේ ප්‍රතිශතයන් පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

| වර්ෂය | සමාගම් ගණන | කොටස් ගණන | ආයෝජිත මුදල ජන 01 දිනට (රු) | ලැබූ ආයෝජන ආදායම (රු) | ආදායමේ ප්‍රතිශතය% |
|---|---|---|---|---|---|
| 2011 | 130 | 78,211,481 | 5,204,377,279 | 703,052,274 | 13.5 |
| 2012 | 107 | 101,999,123 | 7,713,939,116 | 324,179,030 | 4.2 |
| 2013 | 88 | 109,134,215 | 8,085,181,220 | 34,987,432 | 5.38 |

2013 වර්ෂයේ දී මෙම මුදල් භාණ්ඩාගාර බිල්පත් වල දළ වශයෙන් සියයට 11.11 ක වාර්ෂික පොළියකට අයෝජනය කරනු ලැබිය හැකිව තිබුණු අතර, ඒ අනුව ආදායම් අහිමි වීම රු.463,276,202 ක් පමණ විය.

(ඊ) මණ්ඩලය ඒකක භාර අරමුදලක 1997 වර්ෂයේ දී ඒකක 1,000,000 ක් මිලදී ගැනීම සඳහා රු10,000,000 ක් ආයෝජනය කර තිබුණි. මෙම ඒකක භාර අරමුදලේ ආයෝජිත මුදලට ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම කිසිඳු ප්‍රතිලාභයක් මණ්ඩලයට ලැබී නොතිබුණි. කෙසේ වුවද, අදල කාල සීමාව තුළදී සියයට 5 ක අවම පොළී ප්‍රතිශතයක් යටතේ වුවද මෙම මුදල ආයෝජනය කලේ නම් ඒ මගින් ලැබිය හැකිව තිබුණු ඇස්තමේන්තුගත ආදායම ආසන්න වශයෙන් රු12,920,000 ක් අහිමිවී තිබුණි.

(උ) 2007 වර්ෂයට පෙර කාල පරිච්ඡේදයක සිට මිලදී ගන්නා ලද දුරකථන සමාගමක කොටස් 3,302,188 ක් 2013 දෙසැම්බර් 31 දිනට රු 110,340,299 ක අයෝජනයක් බවට පත්වී තිබුණු අතර, මෙම ආයෝජනය පසුගිය වසර 7 ක පමණ කාල පරිච්ඡේදය තුලදී කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා යොදා ගෙන නොතිබීම නිසා එම ආයෝජනයෙන් මණ්ඩලයට ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට හැකිවී නොතිබුණි. මෙම ආයෝජනයෙන් 2013 වර්ෂය සඳහා ලැබී තිබුණු ලාභාංශ ආදායම රු2,526,174 ක් හෙවත් සියයට 2.29 ක ඉතා අඩු අදයම් ප්‍රතිශතයක් විය.

(ඌ) මූල්‍ය සමාගමක රු2,550,000 ක් වටිනා කොටස් 30,600 ක කර තිබුණු ආයෝජනයෙන් කොටස් වෙළඳපොළ මිල සීඝ්‍ර පහළ වැටීමකට ලක්වී තිබීම හා අදල මූල්‍ය සමාගම පසුගිය වර්ෂ කිහිපයක සිට අලාභ ලබා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම ආයෝජනයෙන් මණ්ඩලයට ප්‍රාග්ධන ලාභ හෝ ලාභාංශ ආදායම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඩ) 2013 වර්ෂයේ දී මණ්ඩලය සමාගම් 24 ක කොටස් 18,817,090 ක කර තිබුණ රු. 700,560,142 ක ආයෝජනයෙන් මණ්ඩලයට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. පසුගිය වර්ෂ 4 ක කාලසීමාව තුලදී එසේ ආදායම් කිසිවක් නොලැබුණු මණ්ඩලයේ අරමුදල් ආයෝජිත සමාගම් පිළිබඳ විස්තරයක් පහතින් දක්වා ඇත.

| වර්ෂය | සමාගම් ගණන | ආයෝජිත කොටස් ගණන | ආයෝජිත මුදල රු |
|---|---|---|---|
| 2010 | 17 | 4,111,468 | 119,083,880 |
| 2011 | 18 | 7,683,979 | 163,867,080 |
| 2012 | 25 | 13,046,750 | 226,125,038 |
| 2013 | 24 | 18,817,090 | 700,560,142 |

4.3 **ආයතනය විසින් හා ආයතනයට එරෙහිව පවතින නෛතික සිද්ධි**

ගිවිසුම් කඩ කිරීමකට අදාළව මණ්ඩලයට එරෙහිව ලැබුණු අවාසිදායක අධිකරණ තීන්දුවක් මත පෞද්ගලික සමාගමකට වන්දියක් ලෙස රු21,000,000 ක් ගෙවා තිබුණි. පසුව මණ්ඩලය විසින් මෙම නඩු තීන්දුවට එරෙහිව කරන ලද අභියාචනයක ප්‍රතිඵලයක් ලෙස පැමිණිලිකාර සමාගම විසින් ද ඉහත කී වටිනාකමට සමාන බැංකු ඇපකරයක් අධිකරණයට බාරදී තිබුණි. මෙම මුදල මණ්ඩලයට ලැබිය යුතු මුදලක් සේ ගිණුම්ගත කර තිබුණද, මෙම ගෙවීම අවාසිදායක නඩු තීන්දුවක් මත සිදුවූවක් වන බැවින්, මෙම මුදල් ආපසු ලැබීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි. කෙසේ නමුදු අදාල අධිකරණ ක්‍රියාවලිය 2014 දෙසැම්බර් 31 දින වන විටත් අවසන්වී නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ අරමුණු වලට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජයක් සඳහා රු3,000,000 ක ණය මුදලක් කිසිඳු ගිවිසුම්ගත බැඳීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අතර, මෙම ණය මුදල වාරික 24 කින් සියයට 10 ක පොළී ප්‍රතිශතයක් යටතේ ආපසු ගෙවනු ලබන බව දන්වා තිබුණද අදාළ කාල සීමාව තුළදීම ගෙවා තිබුණේ ඉන් රු498,310 ක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ පරිබාහිර කටයුතු සඳහා හා විවිධ පාර්ශවයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් රු 1,742,166 ක් වැයකර තිබුණි.

(ඇ) මණ්ඩලය සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බව දක්වමින් අතිකාල පැයකට පැය එකහමාරක් සහ සෙනසුරාද/ඉරිද සහ රජයේ නිවාඩු දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ වීමත් සමඟ දිනක වැටුපක්ද එකතු කර අතිකාල ගෙවීම නිසා මණ්ඩලයේ 2013 වර්ෂයේ අතිකාල පිරිවැය ලෙස රු18,000,252 ක් වැය කිරීමට සිදුව තිබුණි. ඉහත පනත ප්‍රකාරව අතිකාල ලබා ගැනීමට මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර, වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් සීමාකර තිබුණ ද ඊට පටහැනිව නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබාදීම හා සතියකට දින 5 ක සේවාවක් ඉටු කිරීමට ඉඩදී තිබුණි.

**4.5 හඳුනාගත් පාඩු**

ස්ථාවර වත්කම් ඌනතාවය ලෙස රු2,044,420 ක් සමාලෝචිත වර්ෂයේදී පොත් වලින් කපාහැර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු 17 ක් සමඟ මණ්ඩලයේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 52 ක්ව පැවතියද එය පිරවීම සඳහා අවධානය යොමුකර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

මුරෙ 133 (2) ප්‍රකාරව මණ්ඩලයේ සමහර ප්‍රධාන කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛණමය පාලනය

මණ්ඩලයේ අයවැයගත වියදම් හා ආදායම් සහ තථ්‍ය ආදායම හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6 පද්ධති හා පාලනයන්

සභාපතිවරයා වෙත වරින්වර දැනුම් දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්
(ඇ) පනතට කළ යුතු කාලීන සංශෝධන
(ඈ) ආයෝජන
(ඉ) සාමාජික ගිණුම් පවත්වාගෙන යාම



**ඩබ්ලිව් පී සී වික්‍රමරත්න**
විගණකාධිපති (වැඩබලන)

# විගණකාධිපති වාර්තාව
## සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම්

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති**

(අ) මූල්‍ය වත්කමක හෝ වත්කම් කාණ්ඩයක් හානිකරණය වුවාද යන්නට කිසියම් විෂය මූලික කරුණු තිබේදැයි තක්සේරු කිරීමක් කල යුතුව තිබුණු බවත්. එක් එක් ආයෝජනය පිළිබඳ අවධානම් තක්සේරුවක් කලයුතු බවත් යන ඔබගේ නිරීක්ෂණය හා එකඟ නොවේ.

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 39 හි 58 වන ඡේදයේ සහ 63, 66, 67 ඡෙදයන්හි සඳහන් කරුණු සඳහා ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති අංක 39 හි, 58 ඡේදයට අනුව යම් අස්තිත්වයක් විසින් සෑම වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කමක් (Amortized Cost) හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය (Impairment) වී ඇති බවට විෂය බද්ධ සාක්ෂි තිබේදැයි තක්සේරු කල යුතුය. එවැනි යම් සාක්ෂියක් පවතීනම් යම් හානිකරණ අලාභයක වටිනාකම නිර්ණය කිරීම සඳහා ඡේද අංක 63 (ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්) ල ඡේද අංක 66 (පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්) හෝ ඡේද අංක 67 (විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්) වැනි ඡේදය යොදා ගත යුත බව සඳහන් කර ඇත. (An entity shall assess at the end of each reporting period whether there is any objective evidence that a financial assets or group of financial assets is impaired. If any such evidence exists the entity shall apply paragraph 63 for financial assets carried at amortized cost) Paragraph 66 (for financial assets carried at cost) or paragraph 67 (for available for sale financial assets) to determine the amount of any impaired loss).

වත්කමේ ධාරණ අගය සෘජුවම නැතහොත් දීමනා ගිණුමක් මගින් අඩුකළ යුතු හා අලාභයේ ප්‍රමාණය ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතු බව සඳහන් කර ඇත.

තවද, ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති අංක 39 හි ඡේද අංක 46 අනුව ලාභාලාභ මඟින් සාධාරණ අගයට යන වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියළු මූල්‍ය වත්කම් මෙම ප්‍රමිතියේ ඡේද අංක 58 සිට 70 හා Appendix A හි ඡේද අංක AG 84 සිට AG 93 හානිකරණය වුවාද යන්න පරීක්ෂණය කල යුතුය. (Section 46 - All financial assets Except those measured at fair value through profit or loss are subject to review for impairment in accordance with paragraph 58 – 70 appendix A Paragraph AG 84 – AG 93).

ඒ අනුව ලාභාලාභ මඟින් සාධාරණ අගය යටතේ වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් වෙළඳපොල මිල පදනම්කර ගෙන ලාභාලාභ ගිණුමට ලියාහල යුතු අතර, හානිකරණය වුවාද යන්න පිළිබඳ පරීක්ෂණයක් සිදුකිරීමට එම ගිණුම් ප්‍රමිතියේ ප්‍රකාරව අවශ්‍ය නොවේ.

මණ්ඩලය විසින් කොටස් වෙලඳ පොළ ආයෝජනය කර ඇත්තේ ප්‍රධාන වශයෙන්ම ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ ලබාගැනිමේ අරමුණින් වේ. තවද මණ්ඩලයේ අතීත ගණුදෙනු පරීක්ෂා කිරීමේදී ද පෙනී යන්නේ කොටස් වෙලඳපල වාසි දයක තත්වයක් ඇතිවූ විගස කොටස් අලෙවිය හෝ මිලදී ගැනීම සිදුකර ඇති බවය. එකී සාධක මත මණ්ඩලයේ අයෝජන කළඹ නිසි පරිදි හඳුනා ගැනීමකින් පසුල ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 39 හි ඡේද අංක 46 ට අනුව ලාභාලාභ මඟින් සාධාරන අගයට යන වර්ගීකරණය යටතේ දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 39 ඡේද අංක 9 (අ) 1 ට අනුව කොටස් වෙළඳපොළ ආයෝජනල ගණුදෙනු සඳහා පැවති ආයෝජන (Held for Trading) ලෙස වර්ග කරන ලද අතර, එම ආයෝජන ලාභාලාභ මඟින් සාධාරන අගයට යන වර්ගීකරණය යටතේ ගිණුම් ප්‍රකාශන වල දක්වා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 55 (a) ට අනුව අවාසිදයක වෙළඳපොළ මිළ වෙනස්වීම 2013 ජනවාරි 01 වන දින වනවිට රු1,506,639,000 කින්ද, 2013 වර්ෂයේදී රු129,129,000 ආදායම් ගිණුමට ලියාහල ඇත. 2011, 2012 හා 2013 වර්ෂ වල වෙළඳපොල මිල පහත වැටීම ආයතනයේ ලාභාලාභ ගිණුමට ගලපා නොතිබුනේ නම් එකී වටිනාකමින් මෙහෙයුම් ලාභය ඉහල යන අතර, එකී වර්ෂ වලදී සාමාජිකයන්ගේ ගිණුම්වලට කිසිදා උපලබ්ධි නොවන ලාභයක් බැර කිරීමට සිදුවිය හැකිව තිබිණි. එය මූලික ගිණුම්කරන සිද්ධාන්ත උල්ලංගනය කිරීමක්ද වේ.

ඒ අනුවල මිල ලැයිස්තු ගත කොටස් වෙලඳපොලවල ගණුදෙනු ගිණුම්ගත කිරීමේදී 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති පනතට හා ජාත්‍යන්තර ගිණුම්කරන වාර්තාකරන ප්‍රමිතීන්ට අනුකූලව (IFRS) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් 1738/40 දරණ

ගැසට් නිවේදනයේ නීතී ප්‍රකාරව හා පොදුවේ පිළිගත් ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

(ආ) ඔබගේ නිරීක්ෂණයේ දැක්වෙන පරිදි 2013 දෙසැම්බර් 31 වන දිනට පවතින රු 183,067,000 ක් වූ ස්ථාවර වත්කම් වල ප්‍රත්‍යාගණන ප්‍රතිඵලය මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොකරන නිසාත් ගිණුම්කරන ප්‍රමිතියේ ප්‍රකාරව සහ එකී ස්ථාවර වත්කම් වෘත්තීමය සුදුසුකම් ලැබූ තක්සේරුකරුවෙකු විසින් ත්කසේරු කිරීමට යන පිරිවැය එයින් ලැබෙන ප්‍රතිලාභය සමඟ සැසඳීමේදී සාධාරණීයකරනය කල නොහැකි නිසාත් එකී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනනයන් කර නොමැත.

ඉහත සඳහන් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලංකාව පුරා පිහිටි ශාඛා 17 ක හා කොළඹ අවට පිහිටි කාර්යාල 05 ක සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා පමණක් යොදා ගැනීම හේතුවෙන් හා මෙම අයිතම විකිණීම ඉතා කලාතුරකින් සිදුවීම හේතුවෙන් මෙම වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 16 හි සඳහන් පරිදි ක්ෂය කල ප්‍රතිශ්ඨාපන පිරිවැය ප්‍රවේශය අනුව ඇස්තමේන්තු කර ඇත.

කෙසේවුවත්, ඉදිරි දිනයකදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 16 (34) ප්‍රකාරවන ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට අදහස් කරමු.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 24 හි 01 වැනි ඡේදයට අනුව ආයතනයේ මූල්‍ය තත්වය සහ ලාභය හෝ අලාභය කෙරහි සම්බන්ධිත පාර්ශවයන් පැවතීම සහ එම පාර්ශවයන් සමඟ ගණුදෙනු හා බැඳීම් ඇතුළු නොපියවූ ශේෂ මඟින් ආයතනයට බලපෑමක් ඇතිවී තිබීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු කිරීම පිණිස අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල සිදුකල යුතු බව සඳහන් වේග

මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වරින් වර ආයෝජන සම්බන්ධයෙන් උපදෙස් හා රීතිත් නිකුත් කරන අතර, ලංකා ලුණු සංස්ථාවේ අයිතියේ 90% අත්පත්කර ගැනීම සඳහා මණ්ඩලය රු 470,960,937.50 ක මුදලක් ආයෝජනය කර ඇත.

ඒ හැරුණුවිට, ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 24 ප්‍රකාර මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරන මණ්ඩලයට අදාල ආයතනයේ මූල්‍ය මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකල හැකි සම්බන්ධිත පාර්ශවයන් නොමැති බව දැන්වීමට කැමැත්තෙමු.

### 2.2.2 අඛණ්ඩ පැවැත්ම

මෙම නිරීක්ෂණය හා එකඟවිය නොහැක. ලාභාංශ සමාකාර සංචිතයක් පවත්වාගෙන යාමේ එකම අරමුණ වනුයේ ආයතනයේ ලාභ අඩු කාල වලදී ගෙවනු ලබන ලාභාංශ ප්‍රතිශතය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ අනිකුත් මෙහෙයුම් කටයුතු වලට බාධා නොවන ආකාරයෙන් අරමුදල් සම්පාදනය කර ගැනීමයි. ඒ අනුව අවශ්‍ය අවස්ථා වලදී සාමාජිකයන්ට සාධාරන ලාභාංශ ප්‍රතිශතයක් ලබාදීම සඳහා මෙම අරමුදල් භාවිතා කර ඇත.

එසේම ලාභාංශ ප්‍රකාශ කිරීම සඳහා රඳවා ගත් ලාභ යොදා ගැනීමට කිසිඳු බාධාවක් නොමැති අතර, ඒ තුලින්ද පෙන්නුම් කර ඇත්තේ පෙර වර්ෂ වල සිට ඉදිරියට ගෙන එන ලද ලාභ සංචිත අවශ්‍ය අවස්ථා වලදී සාමාජිකයන්ට ලාභාංශ වශයෙන් බෙදා දීමට භාවිතා කර ඇති බවයි.

ඒ අනුව, ඉහත අරමුදල් භාවිතය එහි මූලික අරමුණුවලට පටහැනිව සිදුකර නොමැති අතර, ඒ තුලින් ආයතනයේ ද්‍රවශීලතාවයටද බලපෑමක් සිදුවී නොමැත. එබැවින්, ඔබ විසින් සඳහන් කර ඇති පරිදි ආයතනයේ අඛණ්ඩ හා යහ පැවැත්මට ඉහත ගිණුම්කරන කටයුතු තුලින් කිසිඳු බලපෑමක් සිදුවී නොමැත.

### 2.2.3 සාමාජික ගිණුම්වලට බැර නොවූ දයක මුදල්

2013.12.31 දිනට සාමාජික අරමුදල් ගිණුමේ ශේෂය පරිගණක වාර්තා අනුව සාමාජික ගිණුම් වලට බැර කිරීම පිළිබඳව 2015.03.11 වන දිනට තත්ත්වය පහත දැක්වේ.

| **ප්‍රතිශතය** | **වටිනාකම (රු මිලියන)** | **ප්‍රතිශතය** |
|---|---|---|
| 2013.12.31 දිනට සාමාජික මුදල් ගිණුමේ ශේෂය | 174,252 | |
| 2015.01.11 දිනට සාමාජික ගිණුම් වලට සත්‍ය වශයෙන් බැර කර ඇති වටිනාකම | 163,957 | 94% |
| සාමාජික ගිණුම් වලට බැර කිරීමට ඇති වටිනාකම | 10,395 | 6% |
| **සාමාජික ගිණුම් වලට බැර කිරීමට ඇති වටිනාකම සෑදී ඇති ආකාරය**<br>1981 සිට 2013.12.31 දින දක්වා සේවායෝජකයින් විසින් මණ්ඩලයට ගෙවා ඇති සාමාජික මුදල් වල වටිනාකම | 3,154 | |
| **(වටිනාකම වර්ෂ අනුව සෑදී ඇති ආකාරය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කර ඇත)** | | |
| 1981 සිට 2013.12.31 දින දක්වා සේවායෝජකයින් ගෙවා ඇති සාමාජික මුදල් වලට අදල ඇස්තමේන්තුගත පොළී සහ ලාභාංශ වටිනාකම | 7,241 | |

තවද, පහත සඳහන් නොවැළැක්විය හැකි හේතුමත රු. මිලියන 3,154 ක මුදල සාමාජික ගිණුම් වලට බැර කිරීමට ප්‍රමාදවී ඇති බව දැන්වීමට කැමැත්තෙමු.

1. සේවායෝජකයින් සාමාජික මුදල් ගෙවා ඇතත්, එම මුදල් බැර කිරීමට අවශ්‍ය සේවක විස්තර ලබානොදීම.

2. ආයතන කිහිපයක් සඳහා එක් චෙක්පතක් මගින් සාමාජික මුදල් ගෙවා ඇති අවස්ථාවලදී, එම මුදල් වෙන් වෙන් වශයෙන් ආයතන සඳහා විභජනය කළයුතු ආකාරය පැහැදිලි කරගැනීමට අපහසුවීම. (අදල සේවායෝජක ආයතන දැනට අක්‍රීය තත්ත්වයේ පැවතීම)

3. ආයතන විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික වාර්තා වල ඇතුලත් දත්ත අපැහැදිලි වීම. (අදල සේවායෝජක ආයතන දැනට අක්‍රීය තත්ත්වයේ පැවතීම)

4. ආයතන වල කළමනාකාරීත්වය වෙනස්වීම නිසා, ඊට පෙර කාලවලට අදල තොරතුරු ලබාගැනීමට නොහැකිවීම සහ එම කාලවල පැන නැඟී ඇති ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා නව කළමනාකාරිත්වය සහයෝගය ලබානොදීම.

5. විශේෂයෙන් වතු ආශ්‍රිත ආයතන වල සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් නොමැතිවීම නිසා නම් වලට කොටස් පමණක් සේවායෝජකයින් ලබාදීම හේතුවෙන් හඳුනාගැනීමේ ගැටළු පැවතීම.

තවද, ඉහත කරුණු අවම කරගනිමින් ප්‍රාදේශිය කාර්යාල හරහා සක්‍රීය සේවායෝජකයින් දැනුවත් කර, අවශ්‍ය විස්තර ලබාගෙන සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇති බවද දන්වනු කැමැත්තෙමි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2013 වසර සඳහා සාමාජිකයන්ගේ ගිණුමට බැර කරන ලද සියයට 03 කට අදල රු4,752,333,000 ක මුදල පෙර වර්ෂ වලදී ගිණුම්ගත කරන ලද ආකාරයටම විසර්ජනය කිරීමට ඇති ලාභයෙන් අඩුකර පෙන්වා ඇත. ඔබ යෝජනා කර ඇත්තේ 2013 වර්ෂයේදී රු4,752,333,000 ක් වූ 03 ක පොළිය, මූල්‍ය ප්‍රකාශණ වල ඉදිරිපත් කලයුතු ස්ථානය වෙනස් කිරීමක් පිළිබඳවය. එකී යෝජනාව ආයතනයේ මෙහෙයුම් කාර්ය සාධනයට බලපෑමක් ඇතිනොවන නිසාත්, එසේ ඉදිරිපත් කිරීම 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතින් බාධාවක් නොමැති නිසාත්, දැනටමත් 2014 වාර්ෂික ගිණුම් ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර අවසන් නිසාත්, 2015

වසරේ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව යෝජිත වෙනස සිදුකිරීමට බලාපොරොත්තු වෙමු.

(ආ) මෙයට එකඟවිය නොහැක. ඔබගේ නිරීක්ෂණ අංක 2.2.1 (අ) සඳහන් අපගේ පිළිතුරේ සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි මෙම ගිණුම්ගත කිරීමද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 39 ට අනුකූලව සිදුකර ඇත. ඒ අනුවල වර්ෂය මුල පැවති සාධාරන අගය හා විකුණුම් මිල සසඳා කොටස් වල ලාභ අලාභ ගණනය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව ගිණුම් තැබිය යුතු ආයතනයක් ලෙස මෙම ගිණුම් තැබීම නිවැරදිව සිදුකර ඇත.

(ඇ) ඈවරකරණයට ලක්වී තිබුණු සමාගම් 02 ක සහ තිල ලැයිස්තුවෙන් ඉවත් කර ඇති සමාගමක් ඇතුලත් මෙම අයෝජනයේ වෙළඳපොල මිලක් නොමැත. එමනිසා මෙම ආයෝජන ගණුදෙනු කිරිම සඳහා පැවති මුල්‍ය වත්කම් යටතේ දැක්වීමට නොහැකි අතර ඒවා විකිණීම සඳහා වූ ආයෝජන යටතේ දක්වා ඇත. කෙසේ වුවදල මෙම අවිනිශ්චිත ආයෝජන සඳහා සම්පූර්ණයෙන්ම ප්‍රතිපාදන සිදුකර ඇති බැවින් ශේෂ පත්‍රයට බලපෑමක් සිදුවී නොමැත.

(ඈ) ඉකුත් වර්ෂය වලට අදලවූ බදු ආපසු ලැබීම්, බදු අධි ප්‍රතිපාදන හා සාමාජික ගිණුම් ගැලපීම් ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 08 ට අනුව අතීතානුයෝගීව ගැලපීම ප්‍රායෝගික නොවන බැවින් (Impractical) එකී ගිණුම් කරන ඇස්තමේන්තු වල වෙනස්වීම් හා වැරදි ගිණුම් කරන ප්‍රමිති ප්‍රකාරව අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරිම (Retrospective Restatement) යටතේ ගිණුම් වල දක්වා ඇත.

### 2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1980 සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්ති ප්‍රකාරව අරමුදලේ ආයෝජන වලින් ලබාගත් ලාභ වලින් ලාභාංශ ප්‍රකාශ කලයුතු යැයි දක්වා ඇත.

මෙකී ආයෝජන වලින් ලබාගත් ලාභ යනු හුදෙක්ම ගිණුම්කරන සංකල්පයක් බැවින්, එහි ගණනයන් සඳහා පොදුවේ භාවිතා කරන ගිණුම්කරන මූලධර්ම භාවිතා කල යුතුව ඇත.

ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 01 සහ මුල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව මණ්ඩලය ආදයම් සහ වියදම් ගිණුම්ගත කිරීමේදි උපචිත පදනම භාවිතා කර ඇත. ඒ අනුව භාණ්ඩාගර බැඳුම්කර ආයෝජනයේ වාර්ෂික ආදයම ගණනය කිරීමේදි වාර්ෂික ඉපයීම් ප්‍රතිශතය (Yield) භාවිතා කර ඇත.

තවද, 2013 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කර වල තිබූ ආයෝජන පරිනතය දක්වා රඳවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කර තිබූ අතර, එමඟින් උපලබ්ධි වූ සඵල පොළිය වූ රු12,847,398,372 ක් පසුගිය වර්ෂවල මෙන්ම ඒකාකාරී ලෙස පරිනතය දක්වා රඳවාගත් ආයෝජන වලින් උපලබ්ධි වූ ලාභ ලෙස ගිණුම් වල නිවැරදි ආකාරයෙන් පෙන්වා ඇත.

තවද, වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 39 හි 46 (ආ) වගන්තිය අනුව මණ්ඩලය විසින් සිදුකර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජිත මුදල වූ රු137,546,313,369 ක් පරිනතය දක්වා රඳවාගත් ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති අතර, එමඟින් සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ගණනයකර ලාභය, ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 39 හි 55 (ආ) වගන්තිය හා ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 18 ට අනුව ලාභාලාභ ගිණුමට බැර කර ඇත.

ඒ අනුව, අපගේ නිගමනය වනුයේ මණ්ඩලය වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේදි හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් වාර්ෂික ලාභාංශ ප්‍රකාශ කිරීමේදි ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත හෝ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධි විධානයන්ට පටහැනිව කටයුතු කර නොමැති බවත් භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයේ ආදයම ගිණුම් ගත කිරීමේ හා ලාභාංශ ගෙවීමේ ක්‍රමවේද ඉකුත් වර්ෂවල මෙන් ඒකාකාරී බවින් යුක්තව සිදුකර ඇති බවත්ය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ආයෝජනය සඳහා කොටස් පිරිවැයට සකසන ලද වාර්තා ලිපියකින් විගණනයට සපයා ඇති අතර, එය ලැබුනු බවට ඔබගේ නියෝජිතයෙකු අත්සන් කර ඇත. මේ අවස්ථාව වන විටද එකී සියළුම ආයෝජන වාර්තා ඔබ සතුව පවතී. කෙසේ වුවදල ඔබවෙත ලබාදී ඇති වාර්තා වලට

අමතරව සාරාංශ ගත 2013 වසරට අදාලව කොටස් වල ගැණුම් මිලල විකුණුම් මිල, වෙළඳපල අගය සහ ගැණුම් මිලට අනුව ලාභය/අලාභය දැක්වෙන වාර්තාවක් ඔබ වෙත ලබාදී ඇත.

(ආ) 2013 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් භෞතික සමීක්ෂණ වාර්තාව 2014/03/17 වන දිනැති ලිපිය මඟින් විගණනයට ඉදිරිපත් කර ඇති අතර, ඔබගේ නියෝජිතයෙකු එය ලැබුනු බවට අත්සන් කර ඇත.

(ඇ) මුදල් අමාත්‍යාංශය නියෝජන කරන මණ්ඩලයේ අධ්‍යක්ෂ වරයෙකු ඇතුළුව ආයෝජන ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවයක් ඇති මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් මඟින් අනුමත කරන ඇති ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශණයට අනුව මණ්ඩලයේ අවදානම් සහිත හා රහිත සියළුම ආයෝජන කටයුතු සිදුකරනු ලබයි. තවද 1980 අංක 46 දරණ සේවා නියුත්තියන්ගේ භාර අරමුදල් පනතේ 8 ඡේදයේ (ඈ) වගන්තියට අනුව මණ්ඩලය සුදුසු යැයි සලකන (Board may Consider Fit) කොටස් හෝ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම හා විකිණීම මණ්ඩලයේ අභිමතය පරිදි කරනු ලැබිය හැකි බව සඳහන් කර ඇත. තවද, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුගතවීමේදී පැන නඟින ලාභාලාභ, එකී ප්‍රමිතීන්ට අනුකූලව අවශ්‍ය ගැලපීම් සිදුකල අතර, ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ග නොමැති බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

හිමිකම් නොපන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2013.12.31 දිනට පැවති රු8,597,636.96 (ප්‍රතිලාභ අයදුම්කරුවන් 760) ක් වූ ශේෂයකි. සාමාජිකයන්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම් ලාභින් සිටින හා තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම් ලාභි සියදු දෙනාම එකවිට ඉදිරිපත් නොවීම සහ ඇතැම් අය ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතා ආදිය නිසා ඔවුන්ගේ කොටස් මණ්ඩලයේ ගිණුමේ රඳවා ලේඛන ඉදිරිපත් කර ඇති කොටස් හිමියන්ට පමණක් ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. 2014 ජනවාරි සිට 2015.02.28 දින දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු458,936.07 ක මුදලක් හිමිකරුවන් 11 දෙනෙකු වෙත ගෙවා ඇති අතර, 2015.02.28 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු8,138,700.89 වනු ඇත. (මරණ ප්‍රතිලාභ අයඳුම්පත් 749)

ඒ අනුව, ඉදිරියේදී ද අදල හිමිකරුවන් තම නීත්‍යානුකූල හිමිකම ඉදිරිපත් කරන ආකාරයට මෙම මුදල් ඔවුන් වෙත ගෙවීම සිදුකරනු ලැබේ.

ආපසු එවන ලද ප්‍රතිලාභ ගිණුමේ 2013.12.31 දිනට ශේෂය රු13,969,150.95 කි (ප්‍රතිලාභින් 1,249) මෙම ගිණුමෙන් පිළිඹිබු වනුයේ සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ මුදල් ඉල්ලුම්කර කෙලින්ම බැංකුවට යැවීමේදි බැංකුවෙන් ප්‍රතිලාභ ඉල්ලුම්කරුගේ බැංකු ගිණුම් විස්තර වල දෝෂ සහිත නිසා නැවත හරවා එවා ඇති මුදල්වල වටිනාකමයි. ප්‍රතිලාභ හිමිකරුවන්ට නැවත මේ බව දැනුම්දීමට කටයුතු කරනු ඇත. මෙම මුදල් පසුව ප්‍රතිලාභ හිමිකරුවන් ඉල්ලුම් කිරීමේදී පරීක්ෂා කර බලා නැවත ගෙවීම් කරනු ලබයි.

ඒ අනුව 2014 ජනවාරි සිට 2015.02.28 දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉල්ලුම්කර රු3,590,440.25 ක මුදල් ප්‍රතිලාභ හිමිකරුවන් 183 වෙත ගෙවා ඇති අතර 2015.02.28 සිට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු10,378,710.70 වනු ඇත. (ප්‍රතිලාභින් 1066)

2014.11.05 දින පවත්වන ලද 39 වන විගණන කමිටු රැස්වීමේදී පත්කරන ලද අනුකමිටුව මගින් මේ පිළිබඳව අධ්‍යයනය කර අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමට කටයුතු කරනු ඇත.

ආපසු එවන ලද ප්‍රතිලාභ (චෙක්පත්) (Returned Benefit Cheques) ගිණුමේ 2013.12.31 දිනට ශේෂය රු5,182,501.06 කි (ප්‍රතිලාභීන් 986) අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (Slip System) නොමැති බංකු ගිණුම් තිබෙන ප්‍රතිලාභ අයදුම්කරුවන්ට අදල මුදල් චෙක්පත් මගින් ප්‍රතිලාභ අයදුම්පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යවනු ලැබේ.

එම චෙක්පත් වලින් නැවත ආපසු ලැබෙන චෙක්පත් ලියාපදිංචි තැපැල් මගින් අදල බැංකු වෙත යොමුකරනු ලැබේ. එලෙස යවන ලද නමුත්, ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම්වලට බැරවී නොමැති චෙක්පත් වල වටිනාකම ඉහත ගිණුමෙන් පෙන්නුම් කෙරේ.

ඒ අනුව 2014 ජනවාරි සිට 2015.02.28 වන දින දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉල්ලුම් කල රු1,138,094.08 ක මුදලක් ප්‍රතිලාභ හිමිකරුවන් 82 ක් වෙත ගෙවා ඇති අතර, 2015.02.28 දිනට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු4,044,406.98 ක් වනු ඇත. (ප්‍රතිලාභීන් 904)

2014.11.05 වන දින පවත්වන ලද 39 වන විගණන කමිටු රැස්වීමේදී, පත්කරන ලද අනුකමිටුව මගින් මේ පිළිබඳව අධ්‍යයනය කර අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමට කටයුතු කරනු ඇත.

### 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) i. මණ්ඩලයේ 2013 අප්‍රේල් මස වන විට පැවති බඳවා ගැනීම් පරිපාටියේ තිබූ උසස්වීම් වරප්‍රසාද වලට අගතියක් නොවන ආකාරයෙන් 2013 මැයි මස ක්‍රියාත්මක කළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙහි තනතුරු ශ්‍රේණිවලට සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම සිදුකළ යුතුවූ බැවින් ඒ සඳහා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කරන ලදි. එම කමිටු නිර්දේශය සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන 2013 මැයි මස සිටි සේවකයින් ඔවුන්ගේ තනතුරු ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කරන ලදි. එහිදී බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා තිබූ අනුමත වැටුප් පරිමාණ හා ශ්‍රේණි පියවරයන් යොදා ගෙන තිබුණි.

ii. අනුමත සේවක ඇස්තමේන්තුව තුළ අධ්‍යක්‍ෂක මණ්ඩල ලේකම් තනතුර අහෝසි කිරීමට යෝජනා කොට තිබුණත් එවකට සිටි මණ්ඩලීය ලේකම්ට පුද්ගලික වනසේ එකී තනතුර අනුමත කොට තිබුණි. ඒ අනුව එවකට සිටි ලේකම් තුමිය ඉවත් වන තෙක් රාජකාරි කිරීමට අවස්ථාව අනුමත සේවක ඇස්තමේන්තුව තුළ ලබා දී තිබේ.

කෙසේ වෙතත් අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් තනතුර අත්‍යාවශ්‍ය තනතුරක් බැවින් එය නැවත පිහිටුවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටද කටයුතු කර ඇත.

iii. 2013 වසරේ ප්‍රසාද දීමනා ගෙවනු ලැබුවේ කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2013(1) හි 4.3 වගන්තිය ප්‍රකාරවයි. එම චක්‍රලේඛයේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ආ) i. 1997 සිට මණ්ඩලීය සේවකයන්ට අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය යටතේ 4.2 වාර්ෂික පොළ අනුපාතය යටතේ ණය මුදල් ලබා දෙන අතර ඒ සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය 2014.11.10 දා තමින් ලබා දී ඇත.

ii. 2014 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි උපයනවිට ගෙවීම් බදු මුදල් අදල නිලධාරින්ගේ පෞද්ගලික ඉපයීම් වලින් අඩුකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂනය කිරීම සිදුකරනු ලබයි.

iii. 2007 ඔක්තෝම්බර් 02 දිනැති අංක පීඊඩී 45 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය අනුව ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ කළමනාකරණයේ වගකීම සඳහන් වගන්තිය ශේෂ පත්‍රයේ දක්වා ඇත.

iv. මණ්ඩලීය සේවකයන්ට 1992 සිට කාර්ය සාධනය දියුණු කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය යටතේ දිරිදීමනා ගෙවනු ලබන අතර ඒ සඳහාද මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය 2014.11.10 දාතමින් ලබා දී ඇත.

(ඇ) මෙම මුල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව මහා භාණ්ඩාගාරයේ අනුමැතියට ඉදිරිපත් කල අතර, ඒ සඳහා මේ දක්වා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිචාරයක් ලැබීනොමැතග එසේ වුවදල මෙම මුල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහය වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට සංශෝධනය කර ඉතා පුළුල් විෂය පථයක් ආවරණය වන පරිදි මුල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහයේ කෙටුම්පත් වාර්තාව මේ වනවිට නිමාකර ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරන අතර, ඉන්පසුව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

## 3 මුල්‍ය සමාලෝචනය

### 3.1 මුල්‍ය ප්‍රතිඵල

මෙම ප්‍රකාශනය හා එකඟවිය නොහැක. ඔබ විසින් සඳහන් කර ඇති රුපියල් මිලියන 7,348 න් රුපියල් මිලියන 2,595 ලෙස ගලපා ඇත්තේ භාණ්ඩාගාර බැඳුම්කර වල ආන්තිකයෙන් අදල වර්ෂයට හිමි කොටසේ වර්තමාන අගයට ගලපන ලද වටිනාකමයි. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 39 ප්‍රකාරව නිවැරදිව ගලපා ඇති අතර, ඒ තුලින් එම වර්ෂයේදී ද

සාමාජිකයන්ට ගෙවනු ලබන පොළී හා ලාභාංශ ඉතාමත් සාධාරන ලෙස බෙදී යාමක් සිදුවනු ලබයි. මෙම ගණනය කිරීම් පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් මෙම විමසුමේ 2.2.5 ඡේදය යටතේද දක්වා ඇත. එසේම ඔබ විසින් සඳහන් කර ඇති රුපියල් මිලියන 4,752 ක් වන වසර අවසානයේදී සාමාජිකයන් සඳහා කරන ලද 3% ක පොලී ප්‍රතිපාදන පෙර වර්ෂ පරිදිම ඒකාකාරී ලෙස විසර්ජන කොටසේදී අඩුකර පෙන්වා ඇති අතර, ඒ තුලින් මණ්ඩලයේ සමස්ථ අතිරික්තයට බලපෑමක් සිදුවී නොමැත.

### 3:2 විග්‍රහාත්මක මූලය සමාලෝචනය

දක්වා ඇති කරුණු පිළිගත හැක.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(ආ) දිවයින පුරා විසිරී තිබෙන අපගේ ප්‍රාදේශීය කාර්යාල ජාලය උපයෝගී කරගෙන ස්වයං රැකියාවල යෙදෙන්නන් මෙම මණ්ඩලය වෙත බඳවා ගැනීමට විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

2012 වර්ෂයේ 28,152 ක් වූ සාමාජික සංඛ්‍යාව 2013 වර්ෂය තුල 33,278 දක්වා වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. තවදුරටත් සාමාජිකත්වය වර්ධනය කර ගැනීම සඳහා සමෘද්ධි අධිකාරිය, මිල්කෝ සමාගමට අනුයුක්ත කිරි ගොවි සමිති, ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්භාණ්ඩ හා පාවහන් පිළිබඳ පුහුණුවී ස්වයං රැකියා කරන සාමාජිකයින් හා ජාතික උද්භිද උද්‍යාන අනුබද්ධිතව පවතින දිවයින පුරා පිහිටි මල් සමාගම්වල මල් වගාකරුවන්ද බඳවා ගැනීමට වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. අලුතින් ප්‍රතිලාභ හඳුන්වාදීම තුළින් සාමාජික ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කරමින් සිටී.

ස්වයං රැකියාලාභීන් සේව්‍ය සේවක සම්බන්ධතාවයක් නොමැති බැවින් සාමාජික වර්ධනය අඩුවීමට බලපාන ප්‍රධාන සාධකයක් වී ඇත.

කෙසේ වෙතත්, පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියන් සඳහා පනතට අනුව දයක මුදල් ගෙවීම අනිවාර්යය වේ. එම සේවායෝජකයින් සඳහා නඩු පැවරීම තුලින්ද දයක මුදල් අයකර ගත හැකි වීමක් සිදුවන නමුත්, ස්වයං රැකියා සාමාජිකයා ඔහු විසින්ම දයක මුදල් ගෙවිය යුතු අතර, ඒවා අනිවාර්යය නොවීමත් සාමාජික වර්ධනය අඩුවීමට හේතු වී ඇත.

(ආ) මෙම අරමුදලේ ඇස්තමේන්තු ගත සක්‍රීය සාමාජිකත්වය දැනට ලක්ෂ 24 ක් පමණ වේ. ඒ අනුව, අරමුදලේ සියළුම සක්‍රීය සාමාජිකයින්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා ප්‍රතිලාභ ක්‍රමයක් ආරම්භ කළහොත් එයට වැයවන මුදල් ප්‍රමාණය අති විශාල වේ. ඒ ආකාරයේ විශාල වියදමක් දරාගැනීමට මණ්ඩලයට හැකියාවක් නොමැත.

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත අනුව, වර්ෂය අවසානයේදී සෑම සාමාජික ගිණුම්කටම ලාභාංශ හා පොළියක් බැර කිරීමට මණ්ඩලය බැඳී සිටී. මෙසේ ප්‍රමාණවත් මට්ටමකින් පොළියක් හා ලාභාංශ ලබාදීමට හැකිවනුයේ, ආයෝජනය කිරීම සඳහා මුදල් ප්‍රමාණයක් ඉතිරි වුවහොත් පමණි. තවද, සක්‍රීය සාමාජිකයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ලැබෙන ශිෂ්‍යත්ව අයදුම්පත් ප්‍රමාණය පදනම් කරගෙන හිමිකම් ඇති සියළුම අයදුම්කරුවන්ට වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩිකරමින් ගෙවීමට කටයුතු කර තිබේ.

එමනිසා, විවිධ අවස්ථා හා කරුණු පදනම් කොටගෙන සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා දැනට මණ්ඩලය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල ඉදිරියට ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව සඳහන් කරමි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දින වනවිට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුළු සාමාජික සංඛ්‍යාව සක්‍රීය ගිණුම් හා සේවා යෝජක සංඛ්‍යාව යනාදී ක්‍රියාකාරී සංඛ්‍යා දත්ත සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී දත්ත සමඟ සසඳා පහත දක්වා ඇත නමුත් මෙම සංඛ්‍යා දත්ත සටහනේ වෙනස්වීමේ ප්‍රතිශතයන් සඳහන් කර ඇති තීරුවේ දක්වා ඇති අගයන් නිවැරදි නොවන බව දන්වා සිටිමි.

| විස්තරය | සේවක අර්ථසාධක අරමුදල අනුව | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අනුව | වෙනස්වීමේ ප්‍රතිශතයන් % |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව | 14,987,000 | 10,000,000 | 67 |
| වර්තමානයේදී දායක මුදල් එවනු ලබන සක්‍රීය ගිණුම් සංඛ්‍යාව | 2,350,000 | 2,200,000 | 94 |
| සේවායෝජකයින් සංඛ්‍යාව | 70,392 | 72,145 | 102 |
| 2013 ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය පොළිය සමඟ සියයට | 11.0 | 10.0 | 91 |

සේවක අර්ථසාධක අරමුදල 1958 දී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ක්‍රියාත්මක වීම ආරම්භ වන්නේ 1981 මාර්තු මාසයේදීය. විගණන වාර්තාවේ සඳහන් පරිදි 2013.12.31 වන දිනට සේවක අර්ථසාධක අරමුදල හා සේ. නි. භාර අරමුදල අතර පවතින මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාවේ වෙනස්වීමට එම කරුණද හේතු වී ඇත.

යම් සාමාජිකයෙකු සේවය කරමින් සිටින ලද ආයතනයෙන් වෙනත් ආයතනයකට සේවයට යාම සඳහා වුවද සේවයෙන් ඉල්ලා අස්වීම නිසා (වසර 05 කට වරක්) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අනුව සාමාජිකයාට හිමි අරමුදල ආපසු ලබාගැනීමට ඉල්ලුම් කර ලබාගත හැකි වන නමුත්, සීමිත කරුණු කිහිපයක් මත පමණක් හැර සාමාජිකයාට හිමි සේවක අර්ථසාධක අරමුදල ඉල්ලුම් කල නොහැක. ඒ අනුව මෙම අරමුදල් දෙකෙහි 2013.12.31 වන දිනට පවතින සක්‍රීය ගිණුම් සංඛ්‍යාවේ වෙනසක් දක්නට පුළුවන්.

සක්‍රීය සේවායෝජකයින් සංඛ්‍යාව 73,021 ක් ලෙස සඳහන් කර ඇතත්, අපගේ වාර්තාව අනුව, එය 72,234 කි. තවද, 2014.12.31 වන දිනට එම සංඛ්‍යාව 74,362 ක් වූ අතර 2015.06.30 වන දිනට 75,950 කි.

## 4.2 ආයෝජන හා ආයෝජන ආදායම්

(අ) රු27,497,905.12 වන ලැබිය යුතු ආයෝජන පොළිය සමාගම් 02 ක වන අතර එය පහත සඳහන් පරිදි වේ

| | | රු. ශත |
|---|---|---|
| i | ඇල්කඩුව වැවිලි සමාගම | 12,291,556.16 |
| ii | වණික් ඉන්කෝපරේෂන් | 206,348.96 |
| iii | වණික් ඉන්කෝපරේෂන් | 15,000,000.00 |
| | | 27,497,905.12 |

### i. ඇල්කඩුව වැවිලි සමාගම (රු. 12,291,556.16)

ඇල්කඩුව වැවිලි සමාගමේ රුපියල් මිලියන 15ක ණයකර සඳහා ලැබියයුතු පොළී මුදල ලෙස රු.12,291,556/16 සඳහන් වේ. අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 1994 දී රුපියල් මිලියන 15ක් වටිනා ණයකර ඇල්කඩුව සමාගමේ ආයෝජනය කෙරුණි. එම ණයකර වෙනුවෙන් ගෙවියයුතු පළමු පොළී වාරිකය අප වෙත ගෙවූ නමුත් ඉතිරිපොළී වාරික සහ 1999 දී ගෙවියයුතු ආයෝජිත මුදල වන රුපියල් මිලියන 15 ගෙවීම පැහැර හරින ලදි.

මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කරන ලදි. ඒ අනුව ආයෝජිත මුදල මාසිකව, රුපියල් මිලියන 2.5 බැගින් මුළුමුදලම 2010.08.12 වන දින වනවිට පියවා දැමූ අතර, හිඟ පොළිය රුපියල් ලක්ෂ 5 බැගින් මාසිකව ගෙවා නිදහස් කරන බවට පොරොන්දු විය. ඒ අනුව මුල්වාරිකය 2011 ජනවාරි මස ගෙවූ අතර 2011 නොවැම්බර් තෙක් වාරික 11ක් ගෙවා ඉතිරිය හිඟව පවතී. දැනට ඇල්කඩුව වැවිලි සමාගම මූල්‍ය දුෂ්කරතාවයට මුහුණ දී ඇති බවත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමග සාකච්ඡාකර හැකිඉක්මනින් පොරොන්දු වූ පරිදි ගෙවීම් කරන බවත් 2015.07.07 දින දරණ ලිපියෙන් සභාපතිතුමා වෙත දන්වා එවා ඇත.

ii. වණික් ඉන්කෝපරේෂන් (රු 206,348.96)

වණික් ඉන්කෝපරේෂන් විසින් නිකුත් කරන ලද ණයකර වෙනුවෙන් ලැබිය යුතු පොළී මුදල වේ. දැනට මෙම සමාගම ඈවර කිරීම සම්බන්ධව නඩුවක් පවතින අතර නඩුවේ ඉදිරි දිනය 2015.11.16 වේ.

**වණික් ඉන්කෝපරේෂන් (15,000,000, 00)**

1998.12.31 දින මූලික මුදල සඳහා පමණක් ඇපකරුවන් සහිත වූ ණයකර වල රුපියල් මිලියන 100ක් වණික් ඉන්කෝපරේෂන් සමාගමේ වසර 5ක කාලයක් සඳහා 15%ක පොළී අනුපාතයට ආයෝජන කරන ලදි. 2002.12.31 වසර සඳහා පොළී ගෙවීමට ආයතනයට නොහැකි වූ බැවින්, ඇපකරුවන්ගෙන් මූලික මුදල වන රුපියල් මිලියන 100 ක්, 2003.04.30 දින ලබාගත් අතර, ඇපවලින් ආවරණය නොවූ පොළී මුදල වන රුපියල් මිලියන 15ක් ලබා ගැනිමට නොහැකි විය. දැනට මෙම සමාගම ඈවර කිරීම සම්බන්ධව නඩුවක් පවතින අතර එම නඩුවේ ඉදිරි දිනය 2015.11.16 වේ.

(ආ) වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ ඇති ණයකර වටිනාකම රුපියල් 7,450,259 කි. මෙම මුදල කල්පිරුණු නමුත් ගෙවීම් සිදු නොවිනි. දැනට සමාගමේ නඩුවක් පවතින අතර ඉදිරි නඩු දිනය 2015.11.16 වේ.

(ඇ) සමාගම් 06 ක කොටස් විකුණුම් පිරිවැය හා සසඳා අලාභයට විකුණා ඇති බව සඳහන් කර ඇතග එසේ වුවද මණ්ඩලය කොටස් වෙළඳපල ගණුදෙනු ලාභ අලාභ ගිණුම් ගත කරනුයේ සාධාරන අගය (fair value) පදනම් කර ගෙනය. එලෙස බැලිමේදි එම සමාගම් 06 ක කොටස් විකිණීමෙන් මණ්ඩලයට රු19,794,613,75 ක ප්‍රාග්ධන ලාභයක් ලැබී ඇත.

(ඈ) පී සී හවුස් සමාගමේ කොටස් 363,800 ක් 2010.08.17 දින මූලික නිකුතුව මඟින් මිලදී ගන්නා ලදි. එයින් කොටස් 175,000 ක් විකුණා රු623.117.74 ක ප්‍රාග්ධන ලාභයක් 2011 වර්ෂයේදි ලබාගෙන ඇත. කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම් වල ක්‍රියාකාරිත්වයේ මෙවැනි අවිනිශ්චිත තත්වයක් උද්ගත විය හැකි අතර, එවැනි අලාභයක් සිදුවුවහොත් එම අලාභයන් ලාභදායි කොටස් අලෙවියෙන් හිලව් කර ගැනීම සාමාන්‍ය තත්වයයි.

(ඉ) සේවක භාරකාර අරමුදල් පනතට අනුව එම අරමුදල ප්‍රාග්ධන වෙළඳපොල තුල ක්‍රියාකාරි දායකත්වයක් ලබාදිය යුතු බවට එම පනතේ 7 (අ) වගන්තියේ දක්වා ඇත. ඒ අනුව මුළු ආයෝජනයෙන් 06% කට නොවැඩි ප්‍රතිශතයක් කොටස් වෙළඳපොල තුල ආයෝජනය කිරීමට මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්තිය මඟින් අනුමත කර ඇත. ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොල තුල විශාල දායකත්වයක් සපයනු ලබන ආයතනයක් ලෙස කොටස් වෙළඳ පොල තුලදි ක්‍රියාකාරි ලෙස දායකවීම එම ක්ෂේත්‍රයේ පැවැත්මට සහ දියුණුවට රුකුලක් බව හඳුනාගෙන ඇත. කෙසේ වුවද, 2013 වසරේදි කොටස් වෙළඳපොලේ පැවති මිල උච්චාවචනයන් සහ ඊට පෙර වසරට සාපේක්ෂව සමස්ථ මිල දර්ශකයේ සැලකිය යුතු වර්ධනයක් නොමැති වීමත් නිසා කොටස් වෙළඳපොල ආයෝජනයෙන් ඉහළ ආදායම් ප්‍රතිශතයක් ලබාගැනීමට නොහැකි විය. එසේ වුවද, 2014 වසරේදි කොටස් වෙළඳපොල සමස්ථ මිල දර්ශකයේ ඉහළ යාමට සාපේක්ෂව ආයෝජනයේ ප්‍රතිශතයක් ලෙස 36% ක් උපයා ගැනීමට හැකිවිය.

(ඊ) 1997 දී Namal Growth Fund හි ඒකක 2,500,000 ක් රු.10 බැගින් මිලදී ගෙන ඇත. ඉන් ඒකක 1,500,000 ක් 2006, 2007 හා 2009 වර්ෂ වල විකුණා රු.33,183,600 ක ප්‍රාග්ධන ලාභ ලබාගෙන ඇති අතර, 1999 දී හා 2001 වර්ෂ වලදී පමණක් ලාභාංශද ලැබී ඇත. මෙම ඒකක වලින් ලබාගත හැකි ප්‍රධානතම ප්‍රතිලාභය වන්නේ එම ඒකක විකුණා ලබාගත හැකි ප්‍රාග්ධන ලාභයයි. රු.10 ට මිලදි ගත් මෙම ඒකකයක වෙළඳපොල මිළ 2014.12.31 දිනට රු.137.72 ක් වන අතර, ඒකකයක උපලබ්ධි නොවූ ලාභය රු.127.72 ක් වේග මෙම ආයෝජනයේ වෙළඳ පොළ අගයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කර ඇති බැවින් සුදුසු අවස්ථාවක විකිණීම සඳහා මෙම ඒකක රඳවා තබාගෙන ඇත. ඒ අනුව ආයෝජිත මුදල වන රු මිලයන 10 හා සැසඳිමේදි 2014.12.31 වන විට රු. මිලයන 127 ක ප්‍රාග්ධන ලාභයක් උපයා ඇත. ඒ අනුවල භාණ්ඩාගාර බිල්පත් හා සැසඳීමේදි මෙය ඉතා ඉහළ ඉපයීමක් සහිත ආයෝජනයක් ලෙස සැලකිය හැකිය.

(උ) 2002 වර්ෂයේදි මිලදි ගන්නා ලද ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව විකිණීම සිදු නොකරන ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අත්සනින් යුතු 2008.02.25 වන දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. ඒ අනුවල එදින සිට එම සමාගමේ කොටස් වෙළඳපොළ ගනුදෙනු කිරීම අත්හිටුවා ඇති බැවින් ප්‍රාග්ධන වෙළඳපොළ ගණුදෙනු වලට සම්බන්ධ වී නැත.

(ඌ) ඉතා පැරණි ආයෝජනයකි. 1994 වර්ෂයේදී මිලදී ගන්නා ලද, ද ෆිනෑන්ස් සමාගමේ කොටස් වල වෙළඳපොල මිල පහළ වැටීමකට ලක්වී ඇත. මෙලෙස මිල උච්චාවචනයන් සිදුවීම කොටස් වෙළඳ පොළේ ස්වභාවයයි. කෙසේ වෙතත් මෙම සමාගමේ කොටස් වල වෙළඳපොල මිල ඉහළ ගිය අවස්ථාවක එම කොටස් විකුණා ප්‍රාග්ධණ ලාභ ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

(එ) රු.700,560,142 ක් ආයෝජනය කර සමාගම් 24 කින් කිසිඳු ආදායමක් ලැබී නැති බව විගණන විමසුමේ සදහන් කර තිබුණද, 2013 වර්ෂයේ සමාගම් 03 කින් රු.2,003,774 ක ලාභාංශදල සාධාරණ අගය මත ගණනය කර ශුද්ධ ප්‍රාග්ධන ලාභ ලෙස රු.10,882,168 ක් සමාගම් 06 කින්ද ලැබී ඇත. එසේම, ඉහත සඳහන් කර ඇති සමාගම් 24 න් සමාගම් 16 ක කොටස් විකුණා ප්‍රාග්ධන ලාභ රු.66,623,633 ක්ද ලාභාංශ රු.8,190,462 ක්ද 2014 වර්ෂයේදී ලැබී ඇත.

එසේම මෙලෙස අඩු ඉපයීම් සහිත කොටස් ප්‍රාග්ධන ලාභ සහිතව විකුණා, එම මුදල් ඉහළ ඉපයීම් සහිත සමාගම් වල කොටස් මිලදී ගැනිමට ආයෝජනය කර ඇත. එමෙන්ම, මණ්ඩලයේ කොටස් වෙළඳපොල ආයෝජිත සමාගම් ප්‍රමාණය කළමනාකරණය කල හැකි ප්‍රමානයක පවත්වා ගෙන යාමටද හැකිවී ඇත.

**4.3 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව පවතින නෛතික සිද්ධි**

මෙම සී/ස සමරවිල් ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ් විසින් මණ්ඩලය සමඟ ඇති කරගත් කළමනාකරන ගිවිසුම කඩකිරීමක් සම්බන්ධයෙන් එම සමාගම විසින් මණ්ඩලයට එරෙහිව පවරන ලද අංක 56 (98) 1 දරණ නඩුව සම්බන්ධවයි.

මෙම නඩුව සම්බන්ධයෙන් මණ්ඩලයද කරුණු ඉදිරිපත් කළ නමුත් අධිකරණය සමරවිල් ආයතනය වෙත රුපියල් මිලියන් 21.9 ක් ගෙවීමට නියෝග කරන ලදි. ඒ අනුව, රුපියල් මිලයන 21.9 ක් ඉහත සමර්විල් ආයතනයට ගෙවන ලදි.

නමුත්, මණ්ඩලය විසින් එම නියෝගයට එරෙහිව අභියාචනයක් ලැයිස්තුගත කර ඇති අතර, අභියාචනාධිකරණ නියෝග අනුව ඉහත කී සමාගම විසින් රුපියල් මිලයන 21.9 ක බැංකු ඇපකරයක් අධිකරණයේ තැන්පත් කර ඇත.

මණ්ඩලය විසින් ගොනු කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SC/20/2003 දරණ නඩුව 2015/09/01 දින නැවත විභාගයට ගැනීමට නියමිතය.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ සාමාජිකත්වය තුළින් ගොඩනගන ලද ක්‍රීඩා සමාජය සඳහා වාර්ෂික 10% පොළී පදනම මත රු.3,000,000ක ණය මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රදානය කර තිබූ අතර අදාල වාරික නිසි පරිදි මණ්ඩලය වෙත ගෙවා තිබේ.

මණ්ඩලයේ ක්‍රීඩා සංගමය විසින් සේවකයින් සඳහා දෛනිකව තේ පැන් සැපයීම සඳහා සහ මණ්ඩලයේ කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් සිදුකරන ගෙවීම් වලින් ඔවුන් වෙත ලබා දී ඇති ඉහත ණය මුදල් වල වාරික අඩුකරගනු ලබයි.

(ආ) මණ්ඩලයේ බහුතර සේවක සංඛ්‍යාවක් සහභාගි වන සමුළු, උත්සව හා පොදු කටයුතු වලදී දැරූ සංග්‍රහ වියදම්, සේවක සුභසාධක කටයුතු සඳහා දැරූ වියදම් සහ ස්වයං රැකියා සාමාජිකයන් ප්‍රවර්ධන කටයුතු සඳහා දැරූ වියදම් හැර අනෙකුත් සියළුම වියදම් සමරු කලාපයන් හා පුවත් පත් දැන්වීම් සඳහා දැරූ වියදම් වේ. දිවයිනේ විවිධ සංවිධාන හා ආයතන ඔවුන්ගේ වාර්ෂික උත්සව ආදිය පවත්වන අවස්ථා වලදී පළකරන සමරු කලාපයන්ට හා පුවත්පත් අතිරේක වලට දැන්වීම් ලබාගැනීම සඳහා වාර්ෂිකව අපවෙත ඉල්ලීම් රාශියක් ඉදිරිපත් වේ. මේ ඉල්ලීම් අතරින් අප සාමාන්‍ය වශයෙන් අනුග්‍රහය දක්වනුයේ අප මණ්ඩලයේ ක්‍රියා කටයුතු වලට සෘජුවම හෝ වක්‍රව ප්‍රචාරයක් ලබාගැනීමට හැකිවන දැන්වීම් සඳහා පමණි. පුවත්පත් දැන්වීම් හා සමරු කලාප වලට අප ලබාදෙන කෙටි දැන්වීම් වල අප අනිවාර්‍යයෙන්ම සඳහන් කරනුයේ සේවා යෝජකයින් විසින් සේවකයින් වෙනුවෙන් ගෙවනු ලබන මාසික දායක මුදල් නොකඩවා ගෙවීමේ ඇති අවශ්‍යතාවය පිළිබඳවයි. ඒ අනුවල මෙසේ වර්ෂය තුල දරණ ලද රු.1,742,166 ක වියදම හුදෙක්ම මණ්ඩලයේ සේවාවන් පිළිබඳ ප්‍රචාරනය, සේවක සුභසාධනය, ස්වයං රැකියා ප්‍රවර්ධන කටයුතු හා සේවකයෙකුගේ වෘත්තීය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා දරණ ලද වියදම් බැවින් එය බාහිර කටයුතු සඳහා බාහිර පාර්ශව වෙත දරණ ලද වියදමක් ලෙස ඔබ විසින් දක්වා ඇති නිරික්ෂණය හා එකඟ නොවේ.

(ඇ) මණ්ඩලයේ සේවකයින්ට අතිකාල සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි විධිවිධාන වලට අනුව සහ කර්මාන්තයේ පවතින පරිචය අනුව බව මෙයින් දන්වා සිටිමි.

තවද, සේවකයින්ට වාර්ෂිකව නිවාඩු 42ක ප්‍රමාණය කලක සිට ලබා දී ඇති අතර, එයද කර්මාන්තයේ පරිචය අනුව සිදුකර තිබේ. සාප්පු හා කාර්යාල සේවක පනත අනුව වර්ෂයකට තිබෙන නිවාඩු 21 දක්වා මණ්ඩලීය සේවකයන්ගේ නිවාඩු 42 අඩු කිරීම සම්බන්ධයෙන් ලංකා හාම්පුතුන්ගේ සංගමයේ නිර්දේශය 2014.04.01 දාතමින් අපවෙත ලබා දෙමින් එසේ භුක්තිවිඳි වරප්‍රසාදයක් අඩු කිරීමට යාමෙන් සේවකයන් තුළ කාර්මික ආරවුල් තත්වයක් පැනනැගිය හැකි බව දක්වා තිබේ. ඔවුන්ගේ නිර්දේශයේ පිටපතක් විගණනය සඳහා ලබාදී ඇත.

### 4.5 හඳුනාගත් පාඩු

ඔබගේ විගණන නිරීක්ෂණය සඳහා එකඟ නොවේ. සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් ඌනතාවය ලෙස කිසිඳු මුදලක් පොත්වලින් කපාහැර නොතිබින.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ සේවක ඇස්තමේන්තුව තුළ පවතින පුරප්පාඩු එක් එක් කොට්ඨාශවල අවශ්‍යතාවය පරිදි පිරවීමට කටයුතු කිරීම මණ්ඩලයේ පරිචයයි. ඉදිරියේදී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන කොට්ඨාශය විසින් පහත දැක්වෙන කාර්යයන් ඉටු කර තිබේ.

පූර්ව විගණන කටයුතු

| ප්‍රතිලාභගෙවීම් | පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව |
|---|---:|
| සාමාන්‍ය ප්‍රතිලාභ | 93,284 |
| ස්වයං රැකියා ප්‍රතිලාභ | 691 |
| රක්ෂණ ප්‍රතිලාභ | 2,684 |
| හදවත් සැත්කම් ප්‍රතිලාභ | 565 |
| අක්ෂි සැත්කම් ප්‍රතිලාභ | 653 |
| මරණ ප්‍රතිලාභ | 1,075 |
| ශ්‍රමසුව රැකවරණ ප්‍රතිලාභ | 2,377 |
| වකුගඩු බද්ධයන් ප්‍රතිලාභ | 25 |
| උසස් පෙළ හා 5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිලාභ | 5,730 |
| | 107,084 |
| කාර්යමණ්ඩල වෛද්‍ය බිල්පත් | 7,545 |
| **එකතුව** | **114,629** |

ඊට අමතරව කාර්ය මණ්ඩල අවසාන ගෙවීම්, කාර්ය මණ්ඩල මාසික දිරිදීමනා ගෙවීම් ප්‍රතිශතය පරීක්ෂාව, වියන නිවාස ණය හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය ප්‍රතිපූරණය, වාර්ෂික ප්‍රසාද දීමනා, කාර්ය මණ්ඩල වාර්ෂික නිවාඩු දින දීමනා යන පූර්ව විගණනය ද සිදුකර තිබේ.

යථෝක්ත පූර්ව විගණනයට අමතරව පහත දැක්වෙන පශ්චාත් විගණන කටයුතුද සිදුකර තිබේ.

- දායකත්ව හා අධිභාර ආදායම් ප්‍රගති සමාලෝචනය
- මුදල් ඇණවුම් පිළිබඳ පරීක්ෂාව
- ආපසු එවූ ප්‍රතිලාභ පිළිබඳ විගණනය
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2012
- ආයෝජන
- කාර්ය මණ්ඩල නිළ ඇඳුම් පිරිවැයේ 5% ක් අයකිරීම
- බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය විගණනය - 2013

- මුදල් පොත පිළිබඳ පරීක්ෂාව - ලංකාබැංකුව ගිණුම්අංක -1839
- හිඟහිටි අධිභාර ආදායම්
- අධිභාර ආදායම්, අධිභාර ආදායම් ඉවත්කර ගැනීම්, අත්හැර දැමීම්, අවලංගු කිරීම් හා ජර්නල් ගත කිරීම්
- භෞතික මුදල් ස්ථාපනය

සියලුම අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේ.

**5.2 අයවැය ලේඛණමය පාලනය**

2013 වසර සඳහා අයවැයගත සමස්ථ ආදයම රුපියල් මිලියන 16,350 ක් වු අතර, සත්‍ය සමස්ථ ආදයම රුපියල් මිලයන 16,476 ක් වියග ඒ අනුව සමස්ථ ආදයමේ විචලනය 1**%** කට වඩා අඩුවියග එසේම අයවැය ගත මෙහෙයුම් වියදම රුපියල් මිලයන 1,330 ක් වූ අතර සත්‍ය මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,310 ක් විය. ඒ අනුව සමස්ථ වියදමේ විචලනය 1.5% ක් විය. ඒ අනුවල මණ්ඩලයේ අයවැය ලේඛණමය පාලනය යහපත් මට්ටමක පවත්වාගෙන ගොස් ඇති බැවින් ඔබගේ නිරීක්ෂන සමඟ එකඟ නොවේ.

## 6 පද්ධති හා පාලනයන්

**(අ) ගිණුම්කරණය**

ආයතනයේ ගිණුම් වාර්තාකරණය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පවත්වාගෙන යනු ලැබේ.

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්**

2.3 යටතේ පිළිතුරු ලබාදී තිබේ.

**(ඇ) පනතට කළයුතු කාලීන සංශෝධන**

දැනටමත් කෙටුම්පත් කර තිබෙන වගන්ති පහත දැක්වේ.

**5(1) වගන්තිය**

පත්කරනු ලබන සාමාජිකයන් අට දෙනෙකුගෙන් හා නිල බලයෙන් පත්වන එක් සාමාජිකයකුගෙ න් මණ්ඩලය සමන්විත වන අතර නිළබලයෙන් පත්වන සාමාජිකයා ලෙස තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ජනරාල් ධූරය දරන තැනැත්තා පත්වන බවට සංශෝධනය කර ඇත.

**16(1)(අ) වගන්තිය**

16(1) උපවගන්තියට ඉක්බිතිව 16(1)(අ) ලෙස නව උප වගන්තියක් ඇතුලත් කරනු ලැබේ.

"සේවා යෝජකයින්ට තම සේවා නියුක්තයන් සඳහා දායක මුදල් ගෙවීම සාමාන්‍ය බැංකු ගත කිරිම මගින් හෝ විද්‍යුත් මාධ්‍ය මගින්ද සිදුකල හැක. එසේ වුවද සේවා නියුක්තියන් 50ක් හෝ ඊට වැඩි සේවා නියුක්තියන් සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින්ම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන ලද නියමයෙන් නියම කරන ලද දිනයක සිට බලාත්මක වන පරිදි විද්‍යුත් මාධ්‍ය මගින් සිදුකල යුතුය."

**28 වගන්තිය**

28 වෙනි වගන්තියට අලුතින් උප වගන්තියක් එකතු කර පහත ආකාරයට නඩු පවරා මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කලහැකිය යනුවෙන් සඳහන් කර නඩු පැවරීමේ ක්‍රියා දාමය පහසු හා ප්‍රායෝගික අයුරින් කර ගැනිම සඳහා සහ වර්ථමානයේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් නඩු පැවරිම සඳහා එල්ලවූ විවිධ බාධා අවම කර ගැනිම සඳහා 28(3) වගන්තිය 28(1) වගන්තිය ලෙස නම්කර මහේස්ත්‍රාත් අධිකරණයේ සහතිකයක් ගොනුකර නඩු පවරා එම මුදල් අයකර ගැනිමට හැකිවන අයුරින් සංශෝධනය කර තිබේ.

**37(අ) වගන්තිය**

සෑම සම්පූර්ණ මාසයක හෝ ඉන් කොටසකට 1% බැගින්වූ "අධිභාරයක්" යන්න වෙනුවට සෑම සම්පූර්ණ මාසයකට හෝ ඉන් කොටසකට 50% ක් වූ උපරිමයකට යටත්ව 1% බැගින්වූ අධිභාරයක් යන වචනය ආදේශ කිරීමෙන් මෙම වගන්තිය සංශෝධනය කර ඇත.

**37(ආ) වගන්තිය**

මෙම වගන්තිය මගින් සේවා යෝජකයකු තමන් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියම කර ඇති වාර වාර්තා විද්‍යුත් මාධ්‍ය මගින් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත. මෙහිදි ද සේවා නියුත්තයන් 50කට වැඩි සෑම සේවා යෝජකයකු විසින් අමත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරන ලද නියමයෙන් නියම කරන ලද දිනයක සිට බලාත්මක වන පරිදි විද්‍යුත් මාධ්‍ය මගින් තම වාර වාර්තා මාස්පතා ඉදිරිපත් කළ යුතු බවට සංශෝධනය කර ඇත.

**37(ඇ) වගන්තිය**

37(ඇ) යනුවෙන් අලුත් උප වගන්තියක් ඇතුලත් කර ඇත එනම්, කිසියම් සේවා යෝජකයකු තමා යටතේ සේවය කරන ලද තැනැත්තෙකුගේ ප්‍රතිලාභ අයදුම්පතෙහි සේවා යෝජකයා විසින් සම්පූර්ණ කල යුතු තොරතුරු ඇතුලත් කර එම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම පැහැර නොහැරිය යුතුය. යනුවෙන් සංශෝධනයක් ඉදිරිපත් කර ඇත.

**37(ඈ) වගන්තිය**

37(ඇ) උපවගන්තියට ඉක්බිතිව 37(ඈ) යනුවෙන් අලුත් උප වගන්තියක් ඇතුලත් කර ඇත. එනම් දායක මුදල් වලට අදාල වාර වාර්තාවක් සපයන මේ පනතින් හෝ පනත යටතේ සාදනු ලැබූ යම් විධානයකින් නියම කරනු ලැබූ, සේවායොජකයකු එකී පනතේ නියෝගයේ හෝ විධානයේ සඳහන් කාලසීමාව ඇතුලත ඒ වාර්තාව සැපයීම පැහැර හැරියහොත් හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් හෝ මණ්ඩලය විසින් තමන් සතුව පවතින සියළු ලිඛිත සහ වාචික සාක්ෂි මත පදනම්ව මණ්ඩලය වෙත අය විය යුතු මුදල තක්සේරු කරනු ලබන අතර එකී මුදල ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් එකී සේවායෝජකයා වගකීමට යටත් විය යුතුය යනුවෙන් සංශෝධනයක් ඉදිරිපත් කර ඇත.

**39 වගන්තිය**

39 වගන්තිය මගින් කිසියම් සේවායෝජකයකු වාර වාර්තා නියමිත දිනයට ඉදිරිපත් නොකිරීම මත අධිකරණය මගින් පනවනු ලබන දඩය රු10,000 දක්වා වැඩිකර ඇති අතර මාස 3ක් ඇතුලත වාර වාර්තා ඉදිරිපත් කිරීමට නියෝගයක් ද අධිකරණය මගින් ලබාදිය යුතු බවට සංශෝධනයක් ඉදිරිපත් කර ඇත.

**40(ඇ)1 සහ 40 (ඇ)2 උපවගන්ති**


40 (ආ) උපවගන්තියට ඉක්බිතිව 40 ඇ 1 සහ 40 ඇ 2 අලුත් උප වගන්ති දෙකක් ඇතුලත් කර ඇත. ඒ අනුව යම් පුද්ගල මණ්ඩලයක් ඈවර කිරීම හේතුවෙන් මණ්ඩලයට අයවීමට ඇති මුදලක් අයකරගැනිමට නොහැකි අවස්ථාවක දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති කාල සීමාවේ ධුරය දැරූ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයෙකු, ව්‍යාපාරික ආයතනයක සෑම හවුල්කරුවෙකු හෝ වෘත්තිය සංගමයක සෑම නිළධාරියෙකුම සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයක සභාපති, ලේකම්, කළමණාකරු සහ වෙනත් සැම නිළධාරියෙකුම එකී පැහැර හැරීම සම්බන්ධයෙන් වගකිමට යටත් විය යුතු බවට සංශෝධන ඉදිරිපත් කර ඇත.

**(ඈ) ආයෝජන**

2013 වර්ෂයේදී ආයෝජන තුළින් ඉලක්කගත ආදායම ඉක්මවීමට හැකිවූ අතරල සාමාජික ශේෂ මත 10% ක පොළී සහ ලාභාංශ ප්‍රකාශ කිරීමට හැකිවියග එය අයවැය ගත 9.5% ට වඩා ඉක්මවීමට හැකිවියග

**(ඉ) සාමාජික ගිණුම් පවත්වාගෙන යාම**

සාමාජික ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳව විශේෂ අවධානය යොමුකර, සාමාජික ගිණුම් හිමියන්ට වාර්ෂික ගිණුම් ප්‍රකාශන ලබාදීම සඳහා අදාල සේවායෝජකයින් වෙත යැවීමට පියවර ගනු ඇත.



**මහින්ද මඩිහහේවා**
නව සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය